# THE WHITE HACKLE

## JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY





JANUARY 1998



# ශ්‍රී ලංකා පාබල හමුදා සංගරාව



1997-10-22 වන දින රෙජිමේන්තු 08 වන සංවත්සරය වෙනුවෙන් පවත්වන ලද පිරිත් දේශණාව සඳහා සංඝයාවහන්සේලා වැඩම කළ අවස්ථාව.



1997-10-22 වන දින පැවති පිරිත් දේශණාව ශ්‍රවණය කරන නිලධාරී/සෙසු නිලයින්.



1997-10-23 වන දින සංඝගත දක්ෂිණාවේදී අටපිරි පූජාකරන අවස්ථාව.



1997-10-18 දින බනි/සැර නිවස්නයේදී පැවති තිලිණ ප්‍රධානය කිරීමේ උත්සවයේදී මියගිය හා විශ්‍රාමික අයවලුන්ගේ පවුලේ සාමාජිකයින් සමග සේනාවිධායක ශ්‍රීලපාහ සුහද සාකච්ඡාවක යේදී ඇති අයුරු.



1997-10-18 වන දින බනි/සැර නිවස්නයේදී පැවති තිලිණ ප්‍රධානයේදී මියගිය හා විශ්‍රාමික අයවලුන්ගේ පවුලේ සාමාජිකයකුහට තිලිණයක් ප්‍රදානය කරන ලද අවස්ථාව.

# THE WHITE HACKLE

JANUARY 1998, VOLUME 05 NO. 01



**Important Events of the Regt within the Period...**

පිටුව 16

## Headlines


ජය සිකුරු මෙහෙයුමේ 3 ශ්‍රීලපාහ දයකත්වය 5

ආබාධිත ක්‍රිකට් තරගාවලිය-1997 8

15 වන බලඇණිය
ශ්‍රී ලංකා පාබල හමුදව නගා සිටුවීම 14

Important Events 16

තල් අරඹ 23


ප්‍රීතිමත් ජීවිතයකට මාර්ගය 30


11 ශ්‍රීලපාහ ඒකකයේ වසරක පිය සටහන් 36

ජය සිකුරු ජයමාවත කරා-6 ශ්‍රීලපාහ 38


**11 ශ්‍රීලපාහ ඒකකයේ වසරක පිය සටහන්**

පිටුව 36





**ජයසිකුරු ජයමාවත කරා -6 ශ්‍රීලපාහ**

පිටුව 38

**කවරයේ කතාව:**

අලුතින් නගා සිටුවන ලද රෙජිමේන්තු තූර්යවාදක කණ්ඩයම රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ වෙත තූර්යවාදක සංර්ශනයක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ගන්නා ලද ජායාරූපයකි.

1997-07-19 දින 21 සේනාංක මූලස්ථානයේ පැවැති සාකච්ජාවට සහභාගීවන ලද නිලධාරීන්ගේ සමූහ ජායාරූපය

97-10-20 දින වව්නියාව සම්බන්ධීකරණ මූලස්ථානය ඉදිරිපිට දී ශ්‍රීලපාහ රෙජිමේන්තු සාකච්ජාවට පැමිණි රෙජිමේන්තු අධිපති ඇතුලු නිලධාරීන් ගන්නා ලද සමූහ ජායාරූපය.

PRINT WELL (PVT) LTD.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

THE WHITE HACKLE

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Major General AK Jayawardhana, RWP, RSP, rcds, psc

**Oftg. Centre Commandant**
Lieut. Col. JS Masakkara SLLI

*The White Hackle*, Staff

**Editor-in Chief** - Lieut. Col JS Masakkara SLLI

**Associate Editor** - Major KJ Jayaweera SLLI
Major IGRG Bogodawatte SLLI
Major DM Wijeratne SLLI

**Chief Consultants** - Maj. Gen. AK Jayawardhana, RWP, RSP, rcds, psc

**Honorary Consultants** - Maj. Gen. HV Athukorale VSV, psc - FBIM (Rtd) (Reg force)
Brigadier AER Abeysinghe KSV (Rtd) (vol force)

**Publisher** - Regimental Centre
Sri Lanka Light Infantry.

*The White Hackle* - is published quarterly under the Supervision of the Regimental Commander to provide the Regiment with information on people, policies, Operations, technical developments, views, opinions and ideas about the SriLanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Asst Editor The White Hackle, Regimental Centre, Army Cantonment Panagoda, Homagama, Phone 855204 or 437073 - 4 Extn 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94 ◆ Use of Funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conferance held at Welioya.

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the seventh issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through "The White Hackle" the journal of the oldest and proudest Regiment of them all' If you have much to say about your Battalion's experience go ahead and write in to the "WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien", I Serve"/ Let "WHITE HACKLE" be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all a happy New Year '96 and Compliments of the Season.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල් සහරාවේ' තෙවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක, තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල් සහරාවේ' ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සහරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සහරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සහරාව' ශ්‍රී ලංකා යුධ හමුදාවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන පෞඪ තම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් ත්‍රෛයි මාසිකව පල කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු හා සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාඩිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල් සහරාව' වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල් සහරාවේ' පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සහරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය යන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their Families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words - a post card will do - and include your name, rank and address. We'll withhold your name if you so desire and may condense your views because of space. We can't publish or answer every one, but we'll use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama

### රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල්
### ඒකේ ජයවර්ධන, ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී විසින් නිකුත් කරනු ලබන

# අළුත් අවුරුදු පණිවුඩය

වසරක් ගෙවී නව වසරක උදවත් සමගින් ශ්‍රී ලංකා පාබල හමුදවේ රෙජිමේන්තු අධිපති වශයෙන් ඔබ සැම වෙත සුභාශිංශණ පණිවිඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිණි.

ගෙවී ගිය වසර තුළ ශ්‍රීලපාහ බළඇණිහට රටේ සාමය හා ඒකීය භාවය සුරැකීම් වස්, ඉතාමත් දුෂ්කරවූත්, කටුකවූත් ප්‍රදේශවල ක්‍රියාත්විත රාජකාරීන් හි නිරතවීමට සිදුවිය. එවන් භාරදූරවූත්, දුෂ්කරවූත් කාර්යයන් ඉටු කිරීමේ දී තම දෙමාපියන්, අඹුදරුවන්, සහෝදර ඥතීන්, හිතෛෂීන්ගෙන් ද ඈත්ව තම මව්බිම බේරාගැනීමේ ඒකායන චේතනාවෙන් යුතුව කටයුතු කරමින් ස්වකීය රාජ පාක්ෂික භාවය දක්වීම හේතුවෙන් එකී සැම කාර්යයකදීම බාධකයන් මැඩගෙන විජයග්‍රහණය කරා ලඟාවීමට හැකිවීම ඇත්ත වශයෙන් ම අභිමානයෙන් යුතුව සිහි ගැන්විය යුතු කරුණකි. තව ද මෙම රෙජිමේන්තුව නිත්‍ය ඒකක දහයකින් ද, ස්වේච්ඡා ඒකක හතරකින් ද සමන්විත වූ රෙජිමේන්තුවක් වන අතර, එම සියලුම ඒකක දැනට උතුරු නැගෙනහිර ක්‍රියාත්විත රාජකාරීන්හි නිරතව සිටී. ඉන් නිත්‍ය ඒකක හතක්ම දැනට වව්නියාව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මකව පවතින "ජය සිකුරු" ක්‍රියාත්විත මෙහෙයුමට අවතීර්ණව ඉතා භාරදූර කර්තව්‍යයක නිරතව සිටින බැව් ද අභිමානයෙන් යුතුව සඳහන් කරමි.

කුරිරු බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගෙන් තම මව්බිම ආරක්ෂා කර ඒකීය ලංකාව ගොඩනැගීමේ ජාතික මෙහෙවරයෙහි යෙදී සිටියදී අප අතරින් වියෝ වූ රණවිරුවන්ගේ නාමය සදකාලිකව අප අතර සදනුස්මරණීය වේ. සතුරා ඉදිරියේ අභීතව සටන් වැද පොදු අරමුණක් උදෙසා තම තරුණ දිවිය පරිත්‍යාග කළ එම රණවිරුවන් අහිමිවීම ඔවුන්ගේ දෙමාපියන්ට, අඹුදරුවන්ට, සහෝදර / සහෝදරියන්ට, ඥතී මිත්‍රාතීන්ටද, අප රෙජිමේන්තුවට ශ්‍රී ලංකා යුද හමුදවට හා පොදුවේ මුළු මහත් ශ්‍රී ලංකාද්වීපයට දැරිය නොහැකි පාඩුවකි. සටනේ යෙදී සිටිය දී අතුරුදහන් හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් ද මේ අවස්ථාවේදී සිහිපත් කරනු ලබන අතර, තම රටේ ඒකීය භාවය, ස්වාධිපත්‍යය ස්වෛරීභාවය හා දේශයේ පරමාධිපත්‍යය උදෙසා මව්බිම වෙනුවෙන් දිවිපිදූ එකී වීරෝධාර නිලධාරීන් හා සෙසු නිළයින්ගේ පවුල්වල සාමාජිකයින් හට මා ඔබ සැම වෙනුවෙන් මාගේ භක්ත්‍යාදර ප්‍රණාමය පුද කරමි.

අවසාන වශයෙන් මෙහිලා සඳහන් කරනුයේ ගෙවී ගිය වර්ෂයේදී මෙන්ම ලැබුවා වූ මෙම වසර තුල දී ද අපගේ රෙජිමේන්තුව මගින් ඒකීය ශ්‍රී ලංකාවක් උදෙසා ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. එකී කටයුතු කිරීමේ දී සැම බාධාවක්ම ජයගෙන ජයකෙහෙලි නැංවීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරන අතර, පරාජයන් ඉදිරියේ නොසැලී සෞභාග්‍යමත් ඒකීය ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට උරදීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය හා අධිෂ්ඨානය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ සියලූ නිළධාරීන්, සෙසු නිළයින් ඇතුලූ පවුල්වල සියළුම සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන් ඇතුළුව එම පවුල්වල සියළුම සාමාජිකයින්ටත් ලැබුවා වූ මේ නව වසර සියළුම යස ඉසුරින් සපිරි සෞභාග්‍යමත් නව වසරක් වේවායි කියා සුභපතන අතර, සැම භාරදූර කාර්යයකදීම ඔබ සැමට තෙරුවන් සරණ හා සියළු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවායි ඉතසිතින් මම ප්‍රාර්ථනා කරමි.

**ඒකේ ජයවර්ධන ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී,**
**මේජර් ජෙනරාල්**
**රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ**

**1998 ජනවාරි මස 01 වන දින**

# 1997.12.19 දින රෙජිමේන්තු අධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවැති භෝජන සංග්‍රහයේ දී රෙජිමේන්තු අධිපති විසින් කරන ලද කථාව

රෙජිමේන්තු සභා රැස්වීමේ දී තීරණය කර ගත් පරිදි සෑම මාසයකදීම ආබාධිත අයවළුන් සඳහා භෝජන සංග්‍රහයක් පැවැත්වීමට කටයුතු කරනු ලබන බැව් මෙවර ද රෙජිමේන්තු අධිපති විසින් අවධාරණය කර සිටින ලදී.

මෙම රෙජිමේන්තුව ඉතා පැරණි රෙජිමේන්තුවක් වන අතර, නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ සුභ සිද්ධිය සඳහා වන වැඩපිළිවෙලවල් අළුතෙන් ආරම්භ කිරීමට අදහස් කරන බවත් එම නව ක්‍රමයන්හි මුල් පියවරක් වශයෙන් රෙජිමේන්තු ණය යෝජනා ක්‍රමයක් සහ රෙජිමේන්තු මට්ටමින් මරණාධාර යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇති බැව් ද රෙජිමේන්තු අධිපති විසින් පැහැදිළි කරන ලදී.

දැනට බළඇණියක සිටින භට පිරිස් සංඛ්‍යාව 700ක්, 800 ක් පමණ වුවත්, රෙජිමේන්තුව ගත් කල ඒකකයන් 14 ක භට පිරිස් සමග අරෙසේ/යාකිරීම් අයවළුන් සමග 8500 ක් 9000 ක් මණ වේ. නමුත් දැනට පවත්වාගෙන යන ණය යෝජනා ක්‍රම හා මරණාධාර යෝජනා ක්‍රම ඒකක මට්ටමින් නොව රෙජිමේන්තු මට්ටමින් පවත්වාගෙන යාම සුදුසු බව රෙජිමේන්තු අධිපති විසින් අවධරණය කරන ලදී. ඒ අනුව දැනට ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ණය යෝජනා ක්‍රමය සහ මරණාධාර යෝජනා ක්‍රමය පිළිබඳව කෙටියෙන් විස්තර කර දෙන ලදී. පළමුවෙන් ණය යෝජනා ක්‍රමය පිළිබඳව කරුණු දක්වූ රෙජිමේන්තු අධිපතිතුමා දැනට බළඇණි මට්ටමින් පවත්වාගෙන යනු ලබන ණය යෝජනා ක්‍රමමගින් නිලධාරී/සෙසු නිලයෙකුට ලබාගත හැක්කේ රු. 5000/= ක් හෝ රු. 10000/= ක මුදලක් පමනක් බවත් දැනට රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව එය කිසිසේත් ප්‍රමාණවත් නොවන බව ද රෙජිමේන්තු අධිපති තුමා පැහැදිළි කරදෙන ලදී.

යම් අයෙකු හදිසි ණය මුදලක් ලබාගනුයේ විශේෂයෙන් තමාගේ ඉතාමත් අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා වන අතර, එම ණය මුදල පෙර සඳහන් කළ මුදල ලබා ගැනීමෙන්. ඉටු කර ගැනීමට නොහැකි වන අතර, අද ආර්ථිකයට සරිලන අයුරින් තරමක් දුරට හෝ ප්‍රමාණවත් වනපරිදි තම අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස තවත් දින කිහිපයකින් රෙජිමේන්තු ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවද අවධාරණය කරන ලදී.

දෙවනුව දැනට ඒකක මට්ටමින් පවත්වාගෙන යනුලබන මරණාධාර යෝජනා ක්‍රම අනුව යම් නිලධාරියෙකු/සෙසු නිලයෙකු මියගිය හොත් මියගිය නිළධාරීගේ ළඟම ඥතියා වෙත රු. 25000/- ක් රු. 2000/- ක්, හෝ රු. 15000/- ක් ලබා දෙන අතර, සමහර ඒකක වෙතින් නිලධාරී/සෙසු නිළයින්ගේ දෙමාපියන්, සහෝදර සහෝදරියන් හා බිරිඳ, දූ දරුවන් මියගිය පසු ද මරණාධාර මුදල් ලබාදීමේ ක්‍රමයක් අනුගමනය කරගෙන යනු ලැබේ. නමුත් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින නිලධාරී සෙසු නිළයින් සෑහෙන පිරිසක් එකවර අවාසනාවන්ත ලෙස මියගියහොත් ඒ සඳහා මරණාධාර මුදල් ලබාදීමේ දී විශාල මුදල් ප්‍රමාණයක් එනවර ලබාදීමේ දීමහත් අසීරුතා ඇතිවනවා මෙන්ම ඒකකයන්හි ඉතිරි වන අයවළුන්ගෙන් එම මුදල් පියවීම සඳහා රු. 4000/= ක රු. 5000/- ක මුදලක් අයකර ගැනීමට සිදුවන බැව් ද පෙන්වා දෙන ලදී. උදහරණයක් වශයෙන් රෙජිමේන්තු අධිපති වෙත බනි 11 වරයෙකු පවසා ඇත්තේ ඔහුගේ මරණාධාර වශයෙන් එක් මසක දී රු. 3500/= ක මුදලක් එකවර අයකර ගත් බවයි. තව ද එසේ කිරීමෙන් එම මුදල පියවා ගැනීමට නොහැකිවුවහොත් ඒකක අණදෙන නිලධාරීන් රෙජිමේන්තුව සමග සාකච්ඡා කර එම මුදල් පියවන බවත් එයින් ඒකක මෙන්ම රෙජිමේන්තුව ද ණය වන බැව් ද අවධාරණය කරන ලදී.

රෙජිමේන්තු අධිපති විසින් තවදුරටත් කරුණු දක්වමින් 1991 සහ 1992 වර්ෂයේ රෙජිමේන්තු ආඥපති වශයෙන් කටයුතු කළ අවධියේ පෙරකී මරණාධාර යෝජනා ක්‍රමය මුළු යුධ හමුද සාමාජිකයින් අතරම ක්‍රියාත්මක කිරීම සුදුසු බැව් යුද හමුද මූලස්ථානය වෙත යෝජනා කළ නමුත් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් නොලැබුණු බැව් ද පෙන්වා දෙන ලදී. මියගිය/ආබාධිත අයවළුන් සඳහා රජයෙන් ලබා දෙනු ලබන වරප්‍රසාදයන් යුද්ධයට අවතීර්ණ වී සිටින ඒකකයන් වෙත පමණක් නොව පොදුවේ මුළු යුධ හමුදවටම බෙද ගත යුතු බැවින් ඉහත යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස වන ලිපි කිහියක් හුවමාරු කල නමුත් එයින් පලක් නොවුන බව ද රෙජිමේන්තු අධිපතිතුමා විසින් පෙන්වා දෙන ලදී.

පසුව 1997 වර්ෂයේ රෙජිමේන්තු අධිපති වශයෙන් පත්වීමෙන් පසුව රෙජිමේන්තුවට ඉටු වියයුතු යුතුකම් හා කාර්යයන් අද සහ හෙටට පමණක් නොව තවත් අවුරුදු 10 ක් 15 ක් පමණ කාලසීමාවක් ඉදිරිය ගැන සිතා බලා කටයුතු කළ යුතුව ඇති බැවින් රෙජිමේන්තු සභා රැස්වීමට මෙම යෝජනාවන් ඉදිරිත් කර මූලිකව ණය යෝජනා ක්‍රමය හා මරණාධාර යෝජනා ක්‍රමය ස්ථාපනය කිරීමට කටයුතු කරන ලදී. මරණාධාර යෝජනා ක්‍රමය නිළධාරී/සෙසුනිළයින්ගේ පවුල් වල සාමාජිකයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන අතර, ඔවුන් ඇතුළත් කර ගැනීමේ දී මෙය අවුල් සහගත තත්ත්වයකට පත්වන බැව් පෙන්වා දුන් රෙජිමේන්තු අධිපති තුමා, මෙම යෝජනා ක්‍රමයන් ඉදිරි අවශ්‍යතාවයට කල් වතින ආකාරයට සම්පාදනයකර ඇති බැව් ද අවධාරණය කරන දී.

# ජයසිකුරු මෙහෙයුමේ 3 ශ්‍රීලපාහ දයකත්වය

ජයසිකුරු හමුද නැදුන්කේනි හා තාන්ඩිකුලම් ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීමෙන් පසු වව්නියාව කිලිනොච්චිය මාර්ගය ප්‍රධාන කොට පුලියන්කුලම් ප්‍රදේශයෙන් ඉදිරියට ගමන් කිරීමට උත්සාහ කළ ද, ත්‍රස්තයන් උපරිම බලය යොද එම ප්‍රදේශයේම රැඳී සිටීම හේතුවෙන් අප භට පිරිස් පුලියන්කුලම දකුණින් වූ කැලෑ ප්‍රදේශය ඔස්සේ ඉදිරියට ගමන් කර "කරප්පුකුට්ටි" ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම ප්‍රදේශයේ ආරක්‍ෂක වලල්ල ඉදිකොට කෙටි විවේකයක නිරත විය.

## "ජයසිකුරු ක්‍රියාත්විතයේ පස්වන අධියර"

හමුදා බලඇණි ප්‍රධාන මාර්ග ඔස්සේ ඉදිරියට ඇදුණු ඇතැයි අපේක්‍ෂාවෙන් ප්‍රධාන මාර්ග උපරිම බලය යෙදීමට ත්‍රස්තවාදීන් උත්සුක වූ අතර, මේ පිළිබඳව විමසිලිමත් වූ අප හමුදව කැලෑ මාර්ගය ඔස්සේ තව දුරටත් ඉදිරියට ගමන් කිරීම සඳහා ජයසිකුරු 5වන අධියර ආරම්භ කිරීම සිදුවිය. මාන්කුලම්, මුලතිව් මාර්ගය අවහිර කිරීමෙන් ත්‍රස්තවාදීන්ගේ පුලියන්කුලම් ප්‍රදේශයේ ප්‍රධාන සැපයුම් මාර්ග බිඳ දැමීම මෙම ක්‍රියාත්විතයේ මූලික අභිප්‍රාය විය. ඒකවර ත්‍රස්තවාදීන්ගේ කේන්ද්‍රස්ථාන 5 කට පහරදී ඉහත කී මාර්ගයේ බලය අල්ලා ගැනීම සඳහා වූ මෙම ක්‍රියාත්විතය 1997.10.04 දින ආරම්භ කරන ලදී.

## "කට්කිඩංකු සටන"

ගුවන් සංක්‍රමික බළසේනාව යටතේ 3 ශ්‍රීලපාහ, 4 ශ්‍රීලංසිරේ සහ 1 ගරේ ඒකක "කට්කිඩංකු" ප්‍රදේශයේ ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන කඳවුරක් විනාශ කිරීම සඳහා උපදෙස් ලැබී තිබුණි. මෙම කඳවුර විශාල කොටි පිරිසක් සිටින ස්ථාවර බංකර් පද්ධතියකින් සමන්විත වූ "කරුණා" නමැති ප්‍රධාන කොටි නායකයා යටතේ පාලනය වූ කඳවුරක් බැවින්, අප භට පිරිස් 1997.10.04 දින 1100 පැයට පමණ මෙම කඳවුර කේන්ද්‍ර කොටගත වනය තුලින් ඉදිරියට ඇදෙන ලදී. මෙදින රාත්‍රි වනයේම ලැගුම්ගත අප භට පිරිස් පසුදින පහන්වීමත් සමග සතුරාට ප්‍රහාර එල්ල කිරීම සඳහා සියලු කටයුතු සූදනම් කරන ලදී. මෙදින රාත්‍රිය පුරාම ත්‍රස්තවාදීන් මෙකී කඳවුරේ සිට තම පුහුණුවීම් කටයුතු වල නිරතවන අයුරු කඳවුර ආසන්නයේ ලැගුම්ගෙන සිටි අප භට පිරිස් වලට ශ්‍රේංකාර විය. 1997.10.05 දින හිරු උදවත් සමග ප්‍රහාරය ආරම්භ කල අප භට පිරිස් සතුරා විමතියට පත් කරමින්, සතුරාගේ බංකර් පද්ධතිය සමීපයට ගමන් කරන ලදී. නොසිතූ ප්‍රහාරයෙන් අන්දමන්ද වූ සතුරා තම භට පිරිස් වැඩිකරගනිමින් ප්‍රතිප්‍රහාර එල්ල කරන්නට වූ අතර, 50 අවි හා පහල යාන්ත්‍රික තුවක්කු හා කාලතුවක්කු සහ මෝටාර් උපයෝගී කර ගනිමින්, ප්‍රහාරයක් එල්ල කරමින් කඳවුර රැක ගැනීමට උපරිම උත්සාහයක යෙදෙන ලදී. මෙදින දහවල් වන විට සතුරාගේ බලය අවම කර ඔවුන්ට ඉතා විශාල අලාභහානියක් සිදු කිරීමට අප භට පිරිස් වලට හැකිවූ අතර, මේ වන විට මාන්කුලම් සහ මුලතිව් මාර්ගයේ බලය අත්පත් කර ගැනීමට අනෙක් බලඇණිවලට හැකි වූයේ මෙම ප්‍රධාන කඳවුර රැක ගැනීම සඳහා එම ප්‍රදේශවල ත්‍රස්තවාදීන් ද සටනට දයක වූ හෙයිනි. මෙම ප්‍රහාරයේ දී සතුරා සමග මුහුණට මුහුණ ලා සටන් කිරීමේ නිරත වූ අප ඒකකයේ නිළදරින් 01 ක් සහ සෙසු නිළයින් 09 දෙනෙකු මියගිය අතර, තවත් නිලධාරීන් 01 ක් සහ සෙසුනිළයින් 54 දෙනෙකු තුවාල ලබන ලදී.

## "කරප්පුකුට්ටි සටන"

මෙදින රාත්‍රි ත්‍රස්තවාදීන් කරප්පුකුට්ටි ප්‍රදේශයේ ආරක්‍ෂක වලල්ල වෙත ප්‍රහාරයක් දියත් කිරීම නිසා ගුවන් සංක්‍රමික බළසේනාව යටතේ අප ඒකකයට හා 4 ශ්‍රීලංසිරේ ඒකකයට කරප්පකුට්ටි ප්‍රදේශය වෙත පැමිණීමට සිදුවිය. ක්‍ෂණිකව සිදුවූ ක්‍රියාත්විතයක් බැවින්, සතුරාගේ තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම අසීරු කරුණක් වූ අතර, කරප්පුකුටි ප්‍රදේශයේ බලය අත්පත්කරගෙන සිටි සතුරා පලවා හැර නැවත ආරක්‍ෂක වලල්ල අත්පත්කර ගැනීම සඳහා අප භට පිරිස් ඉදිරියට ගමන් කරන ලදී. සතුරා සංවිධානාත්මකව ප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් භූමියේ වාසිසහගත තත්ත්වය බොහෝ දුරට සතුරා සතු වීම අප භට පිරිස් වලට ඉදිරියට ගමන් කිරීම තරමක් අසීරු කරුණක් විය. සතුරා විසින් ප්‍රබල කාලතුවක්කු හා මෝටාර් ප්‍රහාරයන් එල්ල කිරීම හේතුවෙන් අප භට පිරිස් තරමක් අපහසුතාවයකට ලක් වූ අතර, මෙම හේතුවෙන් උපක්‍රමශීලීව පසුබැසීමට බළසේනාව වෙතින් උපදෙස් ලැබුණි. මෙම ප්‍රහාරයේ දී සතුරාගේ විශාල පිරිසක් මියගිය අතර, සතුරා සමග මුහුණට මුහුණලා සටන් කිරීමේ නිරත වූ නිළධාරි 01 ක් සහ සෙසුනිළයින් 07 ක් මියයන ලදී. නිලධාරී 04 ක් සෙසුනිළයින් 40 තුවාල ලබන ලදී.






"පෙරියමඩු සටන හා අපලත් ජයග්‍රහණය"

1997.10.10 දින වන විට අප හට පිරිස්, පෙරියමඩු වම්පස ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරීන්හි නිරතව සිටින ලදී. ඒ හා සී කණ්ඩායම ආරක්ෂක වලල්ලේ ලැගුම්ගෙන සිටි අතර, බී සහ ඩී කණ්ඩායම් හදිසි අවස්ථාවක ඉහත කණ්ඩායම් හා එක්වීමේ අපේක්ෂාවෙන් පසුපස ප්‍රදේශයේ ස්ථානගතව සිටින ලදී. මේ වන විට තමන් ස්ථාවර තත්ත්වයකට පත්ව සිටින බවට තීරණය කළ සතුරා වරින් වර සුලු ප්‍රහාර ආරක්ෂක වලල්ල වෙත එල්ල කරමින්, ආරක්ෂක වලල්ල නිරීක්ෂණය කිරීමේ නිරතව සිටින ලදී. කුමන අවස්ථාවක හෝ තවත් තදබල ප්‍රහාරයක් එල්ල කර ආරක්ෂක වලල්ල බිඳදැමීමට ත්‍රස්තවාදීන් උත්සුක වන බව පෙනෙන්නට තිබූ හෙයින් අප ඒකක අණදෙන නිලධාරී වරින් වර කණ්ඩායම් නිලධාරී අණදෙනවරුන් අමතා හදිසි අවස්ථාවක ක්‍රියාකළ යුතු ආකාරය හා උපක්‍රමශීලී ව ප්‍රහාර දියත් කළ යුතු ආකාරය අවධාරණය කරන ලදී. ස්ථාවර ආරක්ෂක වලල්ලක් ඉදිකර නොතිබුණත් සණ වනයේ යුධ අගල් ඉදිකර සතුරාගේ ප්‍රහාරයන් නිරතුරුවම බලාපොරොත්තුවෙන් අප හට පිරිස් ස්ථානගතව සිටින ලදී.

1997.10.13දින මධ්‍යම රාත්‍රිය උදවත්ම ඉදිරියේ යොදවා තිබූ නිරීක්ෂණ මුර විසින්, ඉදිරිභූමියේ නොසන්සුන්තාවය පිළිබඳ නිරීක්ෂණය කරන ලදී. මේ පිළිබඳව ආරක්ෂක වලල්ලට දැනුම්දීමෙන් අනතුරුව එම මුරයන් ද ආරක්ෂක වලල්ල වෙතට පැමිණ සූදනම්ව සිටින ලදී. මේ වන විට සතුරා කෙමෙන් කෙමෙන් ඉදිරියට ගමන් කරමින් අප හට පිරිස් ස්ථානගත ආරක්ෂක අගල් සමීපයට පැමිණ එකවරම ප්‍රහාරයක් එල්ල කරන්නට විය. එම ප්‍රහාරයත් සමග අප හට පිරිස් දැඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. මේ අවස්ථාව වන විට පසුපස සිටි "ඩී" කණ්ඩායම ද, ආරක්ෂක වලල්ල වෙත පැමිණ ක්ෂණිකව දයක විය. පසුදින උදෑසන වන තෙක්ම අවස්ථා තුනකදී දැඩි ප්‍රහාරයක් එල්ල කරමින් ආරක්ෂක වලල්ල බිඳ දැමීමට ත්‍රස්තවාදීන් නොපසුබට උත්සාහයක නිරත වන ලදී. එහෙත් අප හට පිරිස් උපක්‍රමශිලීව සතුරා විමතියට පත් කරමින්, අධිෂ්ඨාන පූර්වකව ප්‍රහාරයක් එල්ල කිරිම හේතුවෙන් උදෑසන වන



විට සතුරාගේ බලය අඩපන කිරීමට සමත් විය. ත්‍රස්තයන් විශාල පිරිසක් මියැදෙන දුටු තම සගයින් පසුබසින ලදී. පසුදින මෙම ප්‍රදේශය නිරීක්ෂණය කිරීමේදී සතුරාගේ මළසිරුරු "46" ක් සොයා ගැනීමටත් අවි ආයුධ විශාල ප්‍රමාණයක් සොයා ගැනීමට අප හට පිරිස් සමත් වූ අතර, ත්‍රස්තවාදීන්ගේ ගුවන්විදුලි පණිවිඩවලට සවන්දීමේදී ඔවුන්ගේ සගයන් "98" දෙනෙකු මියගිය බැව් වැඩිදුරටත් දැනගන්නට ලැබිණි.

| | |
|---|---|
| ජීපීඑම්ජී අවි | 03 යි |
| ආර්පීජී අවි | 03 යි |
| 40 මිමි ග්‍රෙනේඩ් ලොන්චර් අවි | 02 යි |
| චීන සුයාතු (එල්එම්ජී) අවි | 06 යි |
| ටී 56 අවි | 65 යි |
| රාත්‍රි දුරදක්න | 01 යි |
| ගුවන් විදුලි යන්ත්‍ර | 02 යි |

ඉහත සඳහන් අවි ආයුධ වලට අමතරව විශාල පතරොම් ප්‍රමාණයක් සහ වෙනත් උපකරණ රැසක් සොයා ගන්නා ලදී. මෙම ප්‍රහාරයේ දී අප ඒකකයට අයත් එක් (01) නිළධාරියෙකු මිය ගිය අතර, සෙනිත් තිදෙනකු (03) තුවාල ලබන ලදී.

ඉදිරි ක්‍රියාත්මිතය සඳහා අප තවත් මෙසේ දැනගනිමු

01. පවතින සතුරු තත්ත්වය පිළිබඳව නිරතුරුවම හට පිරිස් දැනුවත් කිරීම.
02. කැලෑබද ප්‍රදේශයන්හි ස්ථානගත වූ විට දී එම ආරක්ෂක වලල්ලට ඉදිරියෙන් ඇති කැලෑ ප්‍රදේශය විනාශ නොකිරීමෙන් සතුරාගේ නිරීක්ෂණයට භාජනය නොවන පරිද්දෙන් කැලෑ ආවරණයකට ගත හැකි අතර, හට පිරිස් වෙත සතුරාට එකවර ප්‍රහාරයක් එල්ල කිරීමට අපහසු කරුණක් වේ.
03. ආරක්ෂිත ප්‍රදේශ ඉදිරියෙන් තම බලය තහවුරු කර ගැනීම සඳහා නිරීක්ෂණ මුර/සවන් දීමේ/රැකසිටීමේ පහරදීමේ මුරයන් තුලින් පෙර දැනුම්දීමක් ලබාදීම.
04. භූමිය අනුව යුධ අගල් හා කත්සිට්නා / බාබ් වයර් සකස් කර ගැනීම.
05. භූමියේ සතුරාගේ ගමන් මාර්ගයන් කෙරෙහි නිසි අවබෝධයක් ලබා යාන්ත්‍රික අවි නිසි පරිදි අප බලප්‍රදේශයේ ස්ථානගත කිරීම.
06. කාලතුවක්කු හා මෝටාර් අවි ක්‍රමවත්ව හා සැලසුම් සහගත වූ වෙඩි සැලැස්මක් පිළියෙළ කිරීම.
07. නිළධාරී අණදෙන්නන්, කණ්ඩභාර නිලධාරී සහ පෙළ අණදෙන්නන් භූමියේ හා සතුරාගේ ක්‍රියාකාරකම් කෙරෙහි අණදෙන නිලධාරී වෙත ක්ෂණිකව දැනුම් දී ඒ සඳහා නිසි උපදෙස් ලබා ගැනීම.

"ජාති ආගම් කුලභේද නොතකා ත්‍රස්තයන් පමණක් විනාශ කර මුළු මහත් ලක්වැසියනට සාමය උදාකරීමේ අති උත්තරීතර කර්තව්‍යයක යෙදී සිටින අප ඒකකය, ගුවන් සංක්‍රමික බළසේනාව හා මූලු යුධ හමුදාවේම ගෞරවය හිමිකරගෙන සිටින මෙවන් මොහොතක දී සටනේ දී මියගිය රණවිරුවන් හා තුවාල/ආබාධිත වූ විරුවන් "හෙළයේ විරුවන්" බව මෙහිලා සඳහන් කරමි.

**සකස් කළේ බුද්ධි අංශය - 3 ශ්‍රීලපාහ**

---

# යුධ දැනුමට අමතරව ඔබ මේ ගැනත් දැන ගන්න

ලෝකයේ නොයෙක් දේ උත්පාදනය වුවත් මිනිස් උත්පත්තිය තරම් සීඝ්‍රයෙන් වර්ධනය වන දෙයක් තවත් නැතැයි අපට පිළිගැනීමට සිදුවේ. මෙතෙක් ලෝක ජනගහනය එන්න එන්නම වැඩි වූවා මිස අඩුවූවක් වූ බවක් මෙතෙක් වාර්ථා වී නැත. යුද්ධ වලින් වෙනත් අනතුරු වලින් නොයෙකුත් රෝග වලින් හා තියත්සාය වලින් ලෝකයේ දිනපතා කොහේ හෝ ජන ජීවිත සංඛ්‍යාවක් විනාශ වුවත් උත්පත්තියේ වර්ධනය ඒ ඊයල්ල ද අභිබවා යන බව මෙයින් පැහැදිලි වේ. පවුල් අතර, උපත් පාලනය හැම රටකම පාහේ ක්‍රියාත්මක වුවත් ඉන් මේ වර්ධනයට පිළිසරණක් වී නැත. දරුවන් දෙතුන් දෙනෙකුගෙන් නම් පවුලේ සාමාජික සංඛ්‍යාව සීමා කර ගැනීමට බොහෝ දෙමාපියෝ සැදී පැහැදී සිටී. තම පවුලේ ආර්ථික ශක්තිය තුලනය කර ගැනීමට මවගේ සෞඛ්‍ය තත්ත්වය යහපත්ව තබා ගැනීමටත් අදහස් කරන එවුන් පවුල් කාරයෝ බොහෝ දුරට උපත් පාලන ක්‍රම ඒ සඳහා පිහිට කොට ගනිති.

එහෙත් මෙයින් කියවෙන්නේ ඒ කිසිවක් තඹ දෙයිතුවකටත් ගණන් නොගත් අඹුසැමි යුවලක් පිළිබඳ සත්‍යයම විස්තරයකි. එංගලන්තයේ පදිංචි මේ අඹුසැමි යුවල යනුවෙන්. මාග්‍රට් මහත්මියගෙ වයස ද අවුරුදු 69 කි. දනට පවතින තත්ත්වය අනුව ලෝකයේ වැඩිම දරු සම්පතක් බිහිකල මතාව ලෙස පිළිගෙන ඇත්තේ මාග්‍රට් මහත්මියයි. මොහුත් දෙපල ලත් දරුවන් සංඛ්‍යාව විසි දෙකකි. ඔහුත් සැවොම මේ වෙන විටත් හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් යුතුව දිවි ගෙවන තරුණ හා වැඩිහිටි අය වෙති. මෙයින් දෙලොස් (12) දෙනෙක් පුත්තුය. දහදෙනෙක් (10) දූවරුය. වයස 69 දී දරුවන් 22 ක් බිහිකලේ කෙසේදැයි ඔබ මවිතයට පත්වනු නිසැකය. ඇය එක්වරක් තිවුන් දරු ප්‍රසූතියකදී තිවුන් දරුවන් තිදෙනෙකු බිහිකල අතර, දෙවතාවක් තිවුන් දරුවන් දෙදෙනා බැගින් ද ලොවට ජනිත කළාය.

**නි/62959 2/ලුතිනන් චන්ද්‍රදස ශ්‍රීලපාහ**
**7 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම**
**(උපුටා ගැනීම - මතහර)**

---

# ජයසිකුරු ක්‍රියාත්මිතයේදී තේක්ක ගසක් කතා කරයි


ඉතින් මම පුංචි කාලේ ඉඳන් ඇතිදැඩි කරලා ලොකු මහත් වුනාට පස්සේ හමුදාවේ මහත්වරු මාව කපලා බිම දැම්මා. ඒ විතරක් නොවෙයි නොයෙකුත් ප්‍රමාණයේ කෑලි වලට කපලා හමුදාවේ මහත්වරුන්ගේ කරේ තියාගෙන මාව අරං ගියා. මං වගේ අය ගොඩක් එකතු කරලා පුංචි පහේ බංකරයක් හැදුවා හතරවටේටයි උඩිනුයි හමුදාවේ මහත්වරුන්ට ආරක්ෂාව සපයන්නේ මමයි. හැබැයි මට නම් කිසිම ආරක්ෂාවක් නෑ වෙඩි උණ්ඩ ඇවිල්ල මගේ ඇගේ නම් වදිනවා බංකරේ නම පුංචි වුනාට අපේ වටිනාකම රුපියල් තිස් හතලිස් දහසක් පමණ වෙනවා හමුදාවේ මහත්වරුන්ට හම්බ වෙච්ච හින්දම හොඳයි. ලොකු මුදලාලි කෙනෙකුට අහුවුනානම් ඉවරයි. හමුදාවේ මහත්වරුන්ට ආරක්ෂාව සපයාගෙන එක තැනකට වෙලා සතුරන් එනකන් ඉදිරිය බලාගෙන ඉන්නවා.

**සෙ/301909 ලාකෝ ගුණරත්න ඩබ්ජ්එස්**
**8 ශ්‍රීලපාහ**
**"බී" කණ්ඩායම**


# ආබාධිත ක්‍රිකට් තරඟාවලිය - 1997

දෙහිවල සිංහ සමාජය විසින් දෙවන වරටත් මෙහෙයවන ලද එක් පිලකට 11 දෙනා බැගින් වූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් 97/10/12 වන ඉරු දින කාසල් වීදියේ සෞඛ්‍ය මධ්‍යස්ථානය ක්‍රීඩා පිටියේ දී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණි. එම ක්‍රිකට් තරඟාවලිය සඳහා රෙජිමේන්තු ආධාරක බළඇණිය, ශ්‍රීලපාහ ක්‍රිකට් කණ්ඩායම ද සහභාගී වූ අතර, එම තරඟාවලියේ අති මහත් ජයග්‍රහණයන් රැසක් ලබාගැනීමට සමත් විය.


මෙම තරඟාවලිය සඳහා සිංහ සමාජයේ ක්‍රීඩා කණ්ඩායම් දෙකක් හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු



මෙම ඡායාරූපයෙන් දැක්වෙන් හොඳම පන්දු රකින්නා වශයෙන් සෙ/304380 සායෙ බුද්ධික වීඒ යන රණවිරුවා ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ සුපිරි පිතිකරු මාවන් අතපත්තු මහතා අතින් අදාල ජයසංකේත ලබා ගන්නා අයුරුයි



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ හොඳම පන්දු යවන්නා වශයෙන් සෙ/3026 27 ලාකෝ රණසිංහ ආර්එන් යන රණවිරුවා ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ වත්මන් නායක දේශමාන්‍ය අර්ජුන රණතුංග මහතා අතින් අදාල ජය සංකේත ලබා ගන්නා අයුරුයි.



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ තරගයේ වීරයා ලෙස අභිෂේක ලද සෙ/30175 7 ලාකෝ කුමාරසිංහ ඩබ්පීඩබ් යන රණවිරුවා ශ්‍රී ලංකා ජනරජයේ කර්මාන්ත අමාත්‍ය ගරු සීවී ගුණරත්න මහතා අතින් අදාල ජය සංකේත ලබා ගන්නා අයුරුයි.

ආබාධිත ක්‍රිකට් කණ්ඩායම ද, ශ්‍රී ලංකා පාබල හමුද ආබාධිත ක්‍රිකට් කණ්ඩායම ද සහභාගී විය. ආරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණි ශ්‍රී ලංකා ජනරජයේ කාර්මාන්ත අමාත්‍ය ගරු සී. වී ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම තරඟ මාලාවේ දී පළමු තරඟය ලෙස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ආබාධිත ක්‍රිකට් කණ්ඩායම සහ දෙහිවල සිංහ සමාජයට අනුබද්ධිත ක්‍රිකට් කණ්ඩායම තරඟ වැදුන අතර, ඉන් දෙහිවල සිංහ සමාජයීය අනුබද්ධිත ක්‍රිකට් කණ්ඩායම ලකුණු 05 ක් සියුම් ජයක් අත් කර ගන්නා ලදී.

ඉන්පසුව පැවැති ශ්‍රී ලංකා පාබල හමුද ආබාධිත ක්‍රිකට් කණ්ඩායම හා දෙහිවල සිංහ සමාජයීය ක්‍රිකට් කණ්ඩායම අතර පැවැත් වූ තරඟයේ දී පාබල හමුද ක්‍රිකට් කණ්ඩායම පහසු ජයක් අත් කර ගන්නා ලදී. මෙම තරඟයේ දී ඉතාමහත් අඩු ලකුණු සංඛ්‍යාවකට කඩුළු 05 ක් දවා ගැනීමට පාබල හමුද කණ්ඩායමේ සෙ/302627 ලාකෝ රණසිංහ ආර්එන් සමත්වීම කැපී පෙනුණ කරුණක් විය. අවසන් වටයට සුදුසුකම් ලද දෙහිවල සිංහ සමාජය අනුබද්ධිත ක්‍රිකට් කණ්ඩායම හා ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රිකට් කණ්ඩායම අතර තරගයේ දී ශ්‍රී ලංකා පාබල හමුද ආබාධිත ක්‍රීඩකයෝ නියමිත පන්දුවාර 15 තුල දී ලකුණු 144 ක් ලබා ප්‍රබල තත්ත්වයට පත් වූහ. මෙහි දී පාබල හමුද ආබාධිත ක්‍රිකට් කණ්ඩායමේ සෙ/301757 ලාකෝ කුමාරසිංහ ඩබ්ජීඩබ් ලකුණු 56 ක් ලබා ගැනීම කැපී පෙනුණ කරුණක් විය.

මද වර්ෂාව පැවතියත් පන්දු රැකීමේ දී, පන්දු යැවීමේ දී තම අණසක පිටිය පුරා නොකඩවා පවත්වා ගැනීමට ශ්‍රී ලංකා පාබල හමුද කණ්ඩායමේ ක්‍රීඩකයෝ සමත් වූහ. ලකුණු 144 ක් වැනි ලකුණු සමූහයක් කරා ඇදුන සිංහ සමාජයීය ක්‍රිකට් කණ්ඩායම ලකුණු 57 ක් වැනි අඩු ලකුණු සංඛ්‍යාවකට බිඳ දමන්නට ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රීඩකයෝ සමත්විය. ඉතා විශිෂ්ඨ සණයේ පන්දු රැකීමෙන්, කඩුළු ලබාගැනීමෙන් ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රීඩකයෝ කැපී පෙනුණ දක්ෂතා පෙන්වූ අතර, මුළු තරඟාවලියේම ජය සංකේත තමන් සතු කර ගැනීමට ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රීඩකයෝ සමත් වූහ.

ඒ අනුව ජයග්‍රාහී කණ්ඩායමට හිමි කුසලානය ද, හොඳම පිතිකරු, හොඳම පන්දු යවන්නා, හොඳම පන්දු රකින්නා හා තරගයේ වීරයා හට හිමි කුසලානයන් තමන් සතු කර ගැනීමට ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රීඩකයන් සමත් විය.

ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රිකට් කණ්ඩායම :
සෙ/15488 කෝප්‍රල් විජේකෝන් එම්ජීඑස්එස් (නායක)
සෙ/15750 කෝප්‍රල් සම්පත් එච්එස්පී (උපනායක)
නි/ ලුතිනන් ජජිප්කේ සේනානායක ශ්‍රීලපාහ
සෙ/300817 කෝප්‍රල් අශෝක ද සිල්වා ඩීඑන්
සෙ/301757 ලාකෝ කුමාරසිංහ ඩබ්ජීඩබ්
සෙ/302627 ලාකෝ රණසිංහ ආර්එන්
සෙ/301910 සාසෙ රත්නායක ආර්එම්ජ්
සෙ/304380 සාසෙ බුද්ධික වීජ්
සෙ/303357 සාසෙ ජයසුන්දර එන්පීජේඑම්
සෙ/301411 සාසෙ කුමාරපේලි කේජ්ඩීජේබී
සෙ/11936 සැරයන් සිල්වා ඩබ්එම්පී
හොඳම පිතිකරු සෙ/301757 ලාකෝ කුමාරසිංහ ඩබ්ජීඩබ්
හොඳම පන්දු යවන්නා සෙ/302627 ලාකෝ රණසිංහ ආර්එන්
හොඳම පන්දු රකින්නා සෙ/304380 සාස බුද්ධික වීජ්
තරඟයේ වීරයා සෙ/301757 ලාකෝ කුමාරසිංහ ඩබ්ජීඩබ්

- රෙජ්ආබ ශ්‍රීලපාහ-



# 2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදව වෙත ලද ජනාධිපති වර්ණ (ජනාධිපති සම්මාන ධජය) පිළිබඳ කෙටි හැඳින්වීමක්

ජනාධිපති වර්ණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිවාදී සමාජවාදී ජනරජයේ ජාතික කොඩියට සමානය. වර්ණ ධජයේ කොළ සහ තැඹිලි පැහැති සිරස් තිරයන්හි ජනරජ ලාංජනය තිබීමෙන් ශ්‍රී ලංකා ජනාධිපති තුමාගේ/තුමියගේ අනුශාසනය සහ ආශිර්වාදය රෙජිමේන්තුවට ඇති බව පෙන්වයි.

මෙම ජනරජ ලාංජනය පහතින් ඇති "2" අංකයෙන් දෙවැනි බළඇණිය යන්න ද, එයට පහතින් ඇති "ස්වේච්ඡා" යන්නෙන් ස්වේච්ඡා සේවය ද, එයට පහතින් රෙජිමේන්තු නාම කරණය ද ඇත.

වර්ණ ධජ ලී ආධාරකයක රඳවා ඇත. එහි මුදුණය පයින් හෙඩ් නමින් හඳුන්වනු ලබන අතර, අලංකාර දිලිසෙන ලෝහමය කොටස් වලින් යුක්තය.

ජනාධිපති වර්ණ ධජයේ ආධාරකයේ හිස (පයින් හෙඩ්)

මෙහි ජන රජ ලාංජනය අලංකාරික උක්ත පෙති වැනි කොටස් (04) හතරක් මත රඳවා ඇත. මෙම සෑම උත්තල කොටසකම සිංහ ලාංජනය කොට ඇත. මෙම සිංහ ලාංජනයට ඉහලින් ඒකක ලාංජනයේ කොටස් ද පහලින් ධර්ම චක්‍රය ද කොට ඇත.

**සෙ/22343 ලාකෝ විජයාතන්ද**
**එච්එම්ජේආර්**
**මූලස්ථානය - 2 (සෙව්) ශ්‍රීලපාහ**
**වෙත්කල්අඩි**

## හදවත දිනන මග

**මිනිසුන් සමග කටයුතු කිරීමේ මූලික උපක්‍රම**

1. මිනිසුන් හෙලා දැකීම වෙනුවෙන් ඔහුන් තේරුම් ගැනීමට අපි උත්සාහ කරමු
2. හොඳ ගතිගුණ පිළිගැනීමේදී හිතවත් වන්න. ප්‍රශංසා කිරීමේ දී නොමසුරු වන්න
3. ඔබට උවමනා දෙය නොව ඔහුට උවමනා දෙය ගැන ක්‍රියාකර එය ලබාගත හැකි ආකාරය ඔහුට පෙන්වා දෙන්න.

**මිනිසුන්ගේ කැමැත්තට භාජනය වීමේ ක්‍රම හයක්**

1. අනෙක් මිනිසුන් කෙරෙහි අවංකව උනන්දු වන්න
2. සිනාසෙන්න
3. මිනිසුන්ගේ නම ඔහුට භාෂාවෙහි තිබෙනව මිහිරිම හා වැදගත්ම හඩ බැව් මතක තබා ගන්න
4. හොඳ සවන් දෙන්නෙකු වන්න. තමන් ගැන සම කරන්නට අනෙක් මිනිසුන් දිරිගන්වන්න
5. අනෙක් මිනිසා උනන්දුව දක්වන දෙය ගැන කථා කරන්න.
6. අනෙක් මිනිසාට තමා වැදගත් යැයි හැඟෙන්නට සලස්වන්න. එය අවංකව කරන්න

**නි/62974 2/ලුතිනන් කේආර් තුඩුගල.**
**ශ්‍රීලපාහ**
**7 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම**

# නිදහසේ මන්ත්‍රණය




ශ්‍රී ලංකාවේ පනස් වන නිදහස් සංවත්සරය වෙනුවෙන් මෙම කවි පෙළ ඉදිරිපත් කෙරේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගැනීම සඳහා අරගල කරන සමයේ දී ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමියන් විසින් මෙම කවි පෙළ රචනා කර ඇත. මෙය එදටත් වඩා අදටත් උචිත යැයි හැඟෙන හෙයින් මෙම කවි පෙළ ඉදිරිපත් කරමි.

කෙස් ගහ පවා වෙන රටවල     මිනිසුන්නේ
උස් නිදහස් පිණිස සටනට     සැරසෙන්නේ
හිස් මොළ තිබෙද්දීත් මේ වග     නොතකන්නේ
ඇස් ගෙඩි දෙකට හෙණ ගැහිලද     සිහලුන්නේ

නොලැබී නියත නිදහස රට     ජාතියට
නො හොබී සැපයි සැලකුම කිසි     සැපතකට
කැළැඹී එකක් මේ මුළු තුන් ලොව     එකට
එළැඹී සිටිමු නිදහස් නම්     රණ බිමට

සිරසට කිරුළ සතුරන්ගේ කඩු     පහර
උරවට හරය වැගිරෙන උණු ලේ     දහර
මරහට ඇසෙන සාපය වෙයි අම අහර
තර කොට සිතවු තරුණෙනි නෙපි මේ     වහර

හැඩි දැඩි වෙසින් මරු මරහඩ තළන     කොටත්
එන වෙඩි පහර පාමුල ගිනි තගන     විටත්
සිටි අඩි නො සොල්වා සිටිනට සමත්     වතොත්
උඹ දැඩි හඳති විකුමැති පිරිමියෙකි     කියත්

නාසක බලය නැස්මට වැද සතුරු     සෙබේ
මාරක පහර ලැබ හෙන මළ සිරුර     ඔබේ
මජාතික බලය පිළිබඳ සරද ඔර     ගැබේ
නෑ සැක පහන් තරුවක සිරිසරින්     හෙබේ

මැරුණු කෙණෙහි උපදින මරණයක්     ගැන
දරුණු දුකින් මිරිකෙන නිවටයන්     මෙන
පිරුණු නෙදැති පරපුරෙකින් පැවත     එන
තුරුණු ඔබට යුතු නැති බව සිතනු     මැන

බිය වනු කුමට සැරසෙවු නෙපි     මරණයට
සිට රට නිසා යුද බිම වැද     පරලොවට
ගිය අප මුතුන් මිත්තන් හමු වෙයි     එවිට
කිය නැකි යළිත් අප හා එක් වන     ලෙසට

එක මරණෙකින් හැකි නම් මේ තරම්     දෙයක්
දුක කිම? එයට එක වරකට සියක්     වරක්
දක නොප නිදන සැටි නො ලැබ ම වහල්     බවත්
මැකන නෑ නොපට එක් වනුවට නවත්     දහත්

එක ලේ බිඳක් එක මිනිහෙකුගෙන්     වැටෙන
එක උල්පතක් නම් නිදහස දිය     උනන
එක එක්කෙනා තම තම හදවතින්     ගෙන
එක ණීන් දමවු මුළු සරීලක තෙමෙන     මෙන

නො හැර දෙනුව ඉටු සිරි දෙවි දුවට     ඉඩ
සතර දිගින් එන මොළ රුපු බලය     මැඩ
අයරලන්තෙ ඩී වැලේරා කරපු     වැඩ
ඇසර බලවු සිහලුනි කොතරම් ද හැඩ

විපතින් බිය ජාතික එඩි ගති     සින්ද
හිවලුන් ලෙසින් මෙරමා දෙපතුල     වැන්ද
දෙවියන් සමග සැනහෙන දිය දද     බන්ද
මළවුන් නමට නො කරවු සිහලුනි     නින්ද

අවටින් තුඩු පොවන මාරක     සතුරන්ට
ඉඩ දෙන නමුද රට ජාතිය     වනසන්ට
මළවුන් සමග නිදහස් සැප     වළඳන්ට
නැගිටින් ඉතින් හාද නැහැ අලසව     ඉන්ට

එස්සි කරුණාරත්න ආර්එස්පී ශ්‍රීලපාහ
ලුතිතත් කර්නල්
අණදෙන නිලධාරී 4 ශ්‍රීලපාහ

# ආදරයද? කාන්තාවද?

ආදරය මිත්‍යාවක්ද? නැත. ආදරය ආටෝපයක් ද? නැත. ආදරය උතුම් වස්තුවකි. ආදරය වටිනා පරිත්‍යාගයකි. ආදරය කුමක්ද? මේ ආදරය මම දකින්නේ මෙසේයි. ආත්ම විශ්වාසයකින් යුතුව දයානුකම්පාව මූලික කරගෙන රසවත් බවකින් යුක්ත වූ යහපත් චිත්ත ස්වභාවයයි. ආදරය කියූ සැනෙන් මතකය අවදි වනුයේ මව් සෙනෙහසය. එයට හේතුව ආදරයේ උල්පත වන්නේ ද අම්මා බැවිනි. ලොව ආශ්චර්යමත් කාන්තාව අම්මාය. ඒ ආදරයේ එක් පුරුකකි. අනෙක් අතට ආදරය කාන්තාවක් හා පිරිමියෙක් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා බැඳීම මුල්කර ගනී. එය ද බොහෝ සෙයින් චමත්කාර ජනකය. එයට හේතුව කාන්තාව මව් පදවිය දක්වා ඈතට දිවෙන්නේ ඉහත දක්වූ ආදරයෙන් ආරම්භ කොට ගෙන ය. එසේ නම් ආදරයේ මුල් පියවර මව් සෙනෙහස ද? කාන්තාව හා පිරිමියා අතර ඇතිවන අන්‍යෝන්‍ය සෙනෙහස ද?

පැරණි ඉන්දියානුවෝ බොහෝ ඈත අතීතයේදී පවුලකට ගැහැණු දරුවෙක් ඉපදීම ඒ පවුලේ පිරිමි උදවිය සලකන්නේ විනාශය කරා පියනැගීමක් විලසිනි. තව ද එකල සමාජය තුල කාන්තාව සලකනු ලැබුවේ පහත් නින්දනීය අයුරකිනි. එහෙත් එය නූගත් මෝහයෙන් මුලා වූවන්ගේ කලාවක් බව එවැනි ආකල්ප වල එල්බගෙන සිටි ඒ යුගය අපට කෙතරම් හාස්‍යය ද? නූතන කාන්තාව ඊට හාත්පසින්ම වෙනස් වී ඇත. අද සමාජය තුල කාන්තාවගේ ක්‍රියාකාරීත්වය ඒ බලවත් පුරුෂ ආධිපත්‍යය ද අභිබවා ගොස් ඇත. අද මේ රටේ නායිකාව ද කාන්තාවකි. ලෝකයේ සමහර රටවල් පාලනය කරනුයේ ද කාන්තාවන් විසිනි. එද පුරුෂ පක්ෂය කාන්තාව කෙතරම් පිළිකුල් කල ද තමන් ඉපදී ඇත්තේ ඒ පිළිකුල් කල කාන්තාවගේ කුසයෙන් බව මොහොතකටවත් නොසිතා ඇත.

එසේනම් ආදරය ද ඉපදී ඇත්තේ මවගේ කුසයෙනි. තම මව කුසයේ දස මසක් දරාගෙන සිට මෙලොවට බිහි කරන බිළිඳු දරුවාට ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ආදරය දක්වන්නීය. ඇයගේ ආදරයේ ප්‍රමාණයන් කිසිවෙකුටත් මෙතෙකැයි මිණිය නොහැකිය. සමාජය බිහිවන්නේ එවන් උත්තරීතර ආදරයක ප්‍රතිමූර්තියකින් ය. ඒ ආදරය ජීවිතය ආරම්භ වනද සිට ජීවිතයේ අවසානය දක්වා විවිධාකාර ලෙස මුළු ජීවිත කාලය තුළම සැරි සරන්නේ කෙතරම් චමත්කාර ජනක ආකාරයකින්ද?

මේ ආදරය ගැන කථාකරන සෑම විටම අපට ආදරයේ විරුද්ධාර්ථය ද කොතරම් සමීප ද කියා බලමු. එනම් වෛරයයි. ආදරය නිතරම වෛරයට අත වනයි. එහෙත් වෛරය තුරන් කළ හැක්කේ ද ආදරයෙනි. අද කාලයට ආදරය සහ වෛරය ගැන බොහෝ උදහරණ විවිධ ජනමාධ්‍යයන් තුලින් දැකීමට අසන්නට ලැබේ. තරුණයින් තරුණියෙකුට අසීමිතව ආදරය කරයි. තරුණයා ද එම තරුණියට අසීමිතව ආදරය කරයි. එහෙත් දෛවයේ සරදමක් නිසා හෝ තරුණියගේ නොමනා කම නිසා හෝ තමන්ට පන මෙන් ආදරය කරන තරුණයාට පිටුපාන අවස්ථා බොහෝ අද සමාජයේ ඇත. එවන් අවස්ථා වල දී ආදරය වෛරයකට පෙරලීම වළක්වා ගත හැක්කේ ආදරයෙන් පරදින අයගෙන් කීයෙන් කී දෙනෙකුට ද? ඒ මා විදහා දක්වූයේ ඉතා සරළ උදරණයකි. කෙසේ වෙතත් ආදරය ආශාවන්ට ද ඉතාමත් සමීපය. එනම් අන්‍යෝන්‍ය අවබෝධයක් නොමැතිව තම සිතට වහල්ව ආදරය කරන්නට යාමෙන් ආශාවන්ට මග පෑදේ. එහි උච්චතම අවස්ථාව කඳුළකට මුල වනු ඇත. මන්ද ආදරය අන්ධ වූ පසු එනම් ආදරය ආශාවන් දක්වා පරිවර්ථනය වූ පසු තෘප්තිමත් බව උදෙසා තම පිවිතුරුකම පවා පූජා කිරීමට පෙළඹෙයි. එහෙත් තම පිවිතුරු භාවය විනාශ වූ පසු ඒ ගැන සිත සිතා පසුතැවිලි වන අය බොහෝ ය. ඒ අවස්ථාවන්හිදී තමන්ගේ පිවිතුරුකම ගොදුරු කරගත් තැනැත්තා මග හැරියොත් එතැනදී ඇතිවන්නේ වෛරයකි. මුලදී සොඳුරු හැඟීම් වලින් සපිරි ආදරය් වෛරය කරා පියමැන්නේ කෙතරම් පුදුම සහගත ආකාරයකටද? සමහර කාන්තාවන් තමන්ගේ පවුල් ජීවිතය ඉතාම සාර්ථකව අඹුසැමි භේදවලින් තොරව සතුටින් ගත කරද්දී අතරමැදියෙකුගේ කුඩා ඉඟියකින් නොඑසේනම් තම සිත අයාලේ යාමට ඉඩදීමෙන් තම ලස්සන පවුල් ජීවිතය අවුල් ජාලාවක් බවට පත්කරගත් අවස්ථා ඇත. එහිදී තමන් රැකීමට දිවා රෑ නොතකා වෙහෙස මහන්සි වන තම ස්වාමි පුරුෂයා, තමන්ට පන මෙන් ආදරය රැකවරණය දුන් එම ස්වාමි පුරුෂයාගේ ඒ ආදරයෙන් පිරුණු සිත තුල වෛරය සහ පිළිකුල ඇතිවේ. එසේ නම් අප එතැනදී ද තේරුම් ගත යුත්තේ ආදරය වෛරයට ද ඉතාමත් සමීප බවයි.

එහෙත් වෛරය දුරස් කරන්නට මෙන්ම ආදරය රැක ගන්නට ඖෂධ වර්ග දෙකක් ඇත. එය අප ඉතා හොඳින් දන්නා නමුත් එය කිසිවෙක් එතරම් අගයක් නොකර දෙයකි. එනම් "ඉවසීම" සහ "විශ්වාසය" ඒ දෙකයි. ඉවසීම සහ විශ්වාසය වර්ධනය කර ගැනීමෙන් ආදරය ආරක්ෂා වේ. අඹුසැමියන් අතර ඇති ආදරයට මුල් වන්නේ අන්‍යෝන්‍ය විශ්වාසයයි. තමන් තුළ ප්‍රථමයෙන්ම විශ්වාසය ඇති කරගත යුතුයවි. එයට අපි ආත්ම විශ්වාසය යැයි කියමු. ආත්ම විශ්වාසය යමෙක් තුළ ඇත්නම් ඊළඟට ඔහු තුළ ඇතිකර ගත යුත්තේ ඉවසීමයි. ඉවසීම නොමැතිව ආත්ම විශ්වාසය ගොඩනගා ගත නොහැකි සේම ආත්ම විශ්වාසයක් නොමැතිව ඉවසීමට හුරුවිය නොහැකියි. ඒ දෙක මොනතරම් සමීප ද යන්න ඔබට වැටහෙනවා ද?

මව තුල පියා තුල තම දූරුවන් කෙරෙහි ඇති විශ්වාසය රැකගැනීමට දරුවන් තුළ ආත්ම විශ්වාසයක් තිබිය යුතුයි. එසේම තම දරුවන් රැක ගැනීමට දෙමාපියන් තුල ඉවසීම තිබිය යුතුයි. එසේම තම බිරිඳට අසීමිතව ආදරය කරනවා මෙන්ම ඇයට කරුණාව දැක්විය යුතු යි. එමගින් බිරිඳට තම ස්වාමි පුරුෂයා ගැන දැඩි විශ්වාසයක් ඇති කළ හැකිය. එම විශ්වාසය ආරක්ෂා කිරීම ස්වාමි පුරුෂයා සතු යුතුකමකි වගකීමකි. එයින් ස්වාමිපුරුෂයාගේ සිතෙහි දැඩි නිරවද්‍ය බවක් සහ කැපවීමක් ඇතිවේ. එහිදී ඔහුගේ මානසිකත්වය ඉතාම උසස් මට්ටමකට පත්වෙනවා මෙන්ම දැඩි ආත්ම විශ්වාසයක් ද ඇති වෙනවා. ඒ තුලින් ඉවසීම වර්ධනය වන අතර, එම ක්‍රියාකාරකම නිසා තමන් තුල යම් යම් පාලනයන් ඇති කිරීමට සමත් වෙනවා. එමෙන්ම බිරිඳගේ සිතෙහි තම ස්වාමිපුරුෂයා කෙරෙහි ඇති වන්නේ අසීමිත ආදරයක්, භක්තියක්, ගෞරවයක්, එය අන් කිසිම දෙයකට සමකල නොහැකියි. මේ සියල්ලෙන්ම සිදුවන්නේ ඉතා අනර්ඝ එමෙන්ම සාමකාමී තෘප්තිමත් විවාහ ජීවිතයක්, පවුල් ජීවිතයක් ගත කිරීමට හැකිවීමයි. මෙම ක්‍රියා කලාපයේ අවසානය මා දකින්නේ තම පවුල ලස්සන වීම, යහපත් දූදරුවන් ඇතිවීම, එම දූදරුවන්ගෙන් ඇතිවන සමාජය අලංකාර වීම, සාමකාමී වීම, දූෂණ අඩුවීම, භීෂණය තුරන් වීම, සාමය උදාවීම මේ ආදී දේය. මේ සියළුම දේ සඳහා මූලික වී ඇත්තේ ආදරය බව ඔබට හැඟෙනවා ද?

අද අභිසාරිකාවන්, නගර සෝභනියන්

වන්නේ කාන්තාවන් ය. සමහර විට ඔවුන්ට ආදරය අහිමිවීම නිසා නොඑසේනම් ආදරය වෛරයකට පෙරලීමෙන් ඇය එම තත්ත්වයට පත් වන්නට ඇත. එසේත් නොමැතිනම් තම දෙමාපියන් ආදරය වෛරයකට පෙරලා ගැනීමෙන් ඔවුන්ට එම තත්ත්වයට මුහුණ දෙන්නට සිදුවී ඇත. නමුත් එයින් ඇතිවන ඵලවිපාක මුළු සමාජයටම විඳීමට සිදුවේ. සමාජ රෝග පැතිරයාම, සමාජයේ සල්ලාලයන් බෝවීම, එමගින් ස්ත්‍රී දූෂණ සිදුවීම, අභිසාරිකා වෘත්තියට අහිංසක තරුණියන් ඇදවැටීම, මේ සියළුම දේ තුලින් මුළු සමාජයම දූෂණයවීම සිදුවේ. මෙහි අතිසිවිපාක අවසානයේ විඳින්නට සිදුවනුයේ අපගේම දරු මුණුපුරන්ට ය. මෙය කෙතරම් ඛේදජනක ද? මෙහිදී අපට යම්කිසි පරමාර්ථයකට පැමිණීමට සිදුවේ. එනම් සමාජය දූෂණය කිරීමට එකඟ වනවාද? සමාජය ආරක්‍ෂා කිරීමට දයක වෙනවාද? යන්න ය. සමාජය ආරක්‍ෂා කර ගැනීමට නම් සැම විටම කාන්තාව ආරක්‍ෂා කර ගැනීම සුදුසු කරුණක් බවට පත් වේ. හේතුව ආදරය වැඩිපුරම අවශ්‍ය වන්නේ කාන්තාවට බැවිනි. ආදරය උපදිනුයේ කාන්තාව තුලිනි. ආදරය අවශ්‍ය වන්නේ වැඩිපුරම කාන්තාවට ය. ආදරය කරුණාව නිරතුරුවම හිමි කාන්තාව ජාති භක්තිය කෙරෙහි වඩාත් සමීප ය. එසේ නම් ආදරය මූල්කරගෙන කාන්තාව නිර්මාණය වී ඇත යන්න ඉතා නිවැරදි යැයි හැඟෙන්නේ ය.

ආදරය වැඩිපුරම අවශ්‍ය වන්නේ කාන්තාවට බැව් ඔබට පසුගිය කලාපයෙන් විස්තර කරන්නට යෙදුණි. මේ අයුරින් ද ආදරය අවශ්‍ය කරන්නවුන් අප අතර සිටින්නෝය. එනම් ජීවිතයේ යම් දෙයක් උදෙසා දැඩි බලාපොරොත්තු සහගතව බලා හිඳ ඒ දෙය ලබා ගැනීමට නොහැකිව ලතවන අයට එය වඩාත් සරළව ගෙනහැර දක්වෙන්නේ නම් යමෙක් ආදරයෙන් පරාජිතව ජීවිතයේ ඇති සුන්දරත්වය මත්පැන්වලට යට කරන්නෝ වෙත්. ඔවුන් හට එයින් මිදී යහපත් මාර්ගයක ගමන් කරන්නටත් ආදරය අවශ්‍යම වේ. ජීවිත කාලය තුලම කෙනෙක් මව්පිය සෙනෙහස අහිමිව අන්‍යෝන්‍ය වූ ආදරයක් නොලැබ ඉබාගාතයේ යන්නන් හට එයින් මිදී හරිමග අවබෝධ කර ගැනීමටත් ආදරය බොහෝ සේ අවශ්‍ය වන්නේය. ආදරය යනු කෙනෙකුගෙන් තව කෙනෙකු හට ලැබෙන පරිත්‍යාගයක් වන අතර, ආදරය ඒ ඒ අය සඳහා විවිධාකාර වේ. ඒ ඒ දෙවල් සඳහා ද විවිධාකාර වේ. මිහිතලය මත වෙසෙන ජීවීන් සියළුම දෙනා දෙස බැලූවහොත් ඒ සියලුම දෙනා ට ඒ සැම ජීවියෙක්හටම ආදරය අවශ්‍ය වේ. ආදරය හා සම්බන්ධ වේ. මනුෂ්‍යයන්ගේ ආදරය ද වර්ගීකරණය වේ. එනම් පියාගෙන් පුතාට, දුවට, මවගෙන් පුතාට, දුවට, අයියාගෙන් මල්ලීට, අක්කාගෙන් නංගීට මෙන්ම පෙම්වතුන්ගේ පෙම්වතියන්ගේ ආදරය මේ ආදී විවිධාකාර ලෙස ආදරය ව්‍යාප්ත වේ. තවත් වරෙක ආදරයට කරුණාව ද එක්වන අවස්ථා ඇත. සමහර විට සිහි විකල් වූ කෙනෙක් හට අවශ්‍ය වන්නේ ආදරයයි. කරුණාවයි. එසේම ගිලන් වූ අයට වැඩිපුරම අවශ්‍ය වන්නේ ආදරය සහ කරුණාවයි. එමෙන්ම ගිලණුන්ට උවටැන් කරන අය තුළ වැඩිපුරම තිබිය යුත්තේ ද ආදරය සහ කරුණාවත් ඉවසීමත් ය. ආදරය ඉවත් කළ හෝ අතහැර දමූ කිසිම පුද්ගලයෙක් ද මෙලොව නැත. කවුරු කෙසේ ආදරය අතහැර දමුවත් අවසානයේ ඔහු හෝ ඇය බලාපොරොත්තු වන්නේ ද ආදරයයි. ආදරය හඳුනන්නා තම ජීවිතයට ප්‍රථමයෙන් ආදරය දක්වයි. එයට හේතුව වන්නේ තමන් තමන්ට ආදරය නොකර අනුන්ට කෙසේ ආදරය කරන්න ද? තමන් තමන්ට කෙතරම් ආදරේ ද යන්න නිවැරදිව හඳුනා ගනු ලබන තැනැත්තාට අනුන් ඔවුන්ගේ ජීවිත වලට ද එසේම ආදරේ කරන බව හඳුනාගනී. තමන් තමන් තමන්ගේ බිරිඳට අවංකව ආදරය කරන්නේ නම් එයින් ඔබ ඇය අප්‍රිය කරන කරන දේ වලින් බැහැර වේ. තමන්ගේ බිරිඳට අවංකව ආදරය නොකරන තැනැත්තා බිරිඳ අප්‍රිය කරන නරක දේවලම ඇලී ගැලී ලොල්වී සිටින්නේය.

තමන් බිරිඳට ආදරය බව කෙතරම් කියා පෑවත් ඒ ව්‍යාජ ආදරයක් බව බිරිඳ වටහා ගනී. මන්ද ඔබ ඇය අකමැති නරක පුරුදු අත්හැරීමට ඇති අකමැත්ත නිසයි. ඔබ මත්පැන් පානය කරන්නේ නම්, ඔබ දුම්පානය කරන්නෙක් නම්, ඔබ මත්කුඩු හෝ සූදුවට ඇබ්බැහි වූවෙක් නම් ඔබගේ බිරිඳ එවැනි දේට විරුද්ධය. අකමැතිය. එහෙත් ඇය ඔබට එය කෙසේ වටහා දුන්නත් ඔබට ආදරයෙන් කියා දුන්නත් ඔබගේ පුරුදු බැහැර කරලීමට ඔබ දක්වන නොකමැත්ත නිසා ඔබට බලපෑම් කිරීමට සමහර විට බිරිඳ නොපෙළෙඹෙයි. සමහර විට එය ඵලක් නැති දෙයක් යැයි සිතා නිහඬව සිටී එයින් ඇය අවබෝධ කරගනු ලබන්නේ ඇයට දක්වා ඇත්තේ බොරු ව්‍යාජ ආදරයක් බවයි. සැබෑ ආදරයේ අරුත ඔබගේ බිරිඳ අකමැති පහත් ක්‍රියාවන් තුලින් ඔබ ඉබේම මිදීමයි. ඔබගේ නරක පුරුදු අතහැර සතුටින් ජීවත් වීමයි. බිරිඳට දරුවන්ට අවංකව ආදරය කිරීමයි. ඔබට එසේ බිරිඳට දරුවන්ට අවංකව ආදරය දක්වන්නට හැකිනම් ඔබේ නරක පුරුදු ගත පැවතුම් ඉබේම වෙනස් කර ගැනීමට ඔබට හැකි වේවි. මේ හැම දෙයක්ම මනුෂ්‍යයා වටා රෝදයක් මෙන් කරකැවෙන බව ඔබට වැටහෙනවා ද? මේ හැම දෙයක්ම කිරීමට ඔබට ද ඇයට ද අවශ්‍ය වන්නේ ආදරය සහ ඉවසීමයි. ආදරය ලැබේවි, ඔබගේ බිරිඳ හෝ පෙම්වතිය ඔබට වැඩි වශයෙන් ආදරය දක්වන්නේ ඔබගේ පරිණතභාවය බලාපොරොත්තුවෙනි. ඔබ කිසිවෙකුට දෙවෙනි වනවාට ඒ අය අකමැතිය. ඔබ හැම විටම ඉදිරියෙන් සිටින්නේ නම් එය ඔවුන්ට ප්‍රිය ජනක දසුනකි. ඔබ එසේ සැම අතින්ම ඉදිරියට යනවිට ඔවුන් ඔබට දැඩිසේ ආදරය කරයි. ඒ ආදරයට සීමා බන්ධන නොමැත. තරාතිරමක් ද නොමැත. එහෙත් ඔබ ඉදිරියට යන්නේ ඒ ආදරය නිසාම බව ඔබට නොවැටහේ. ඔබ දිනන්නේ ද ඒ ආදරය නිසා බව ද ඔබට නොවැටහේ. අවසානයේ සියළු බලාපොරොත්තු ඉටු වන්නේ ද ඒ ආදරය මුල් කරගෙනයි. ආදරය පුදුමාකාරයි නේද?

අද සමාජය දෙස බැලීමේ දී මෙවන් දේ ද දැකිය හැකි වෙයි. ඒ මන්ද තමන් අවංකව බිරිඳට පෙම්වතියට ආදරය නොකරන විට ඔවුන් ඔබේ ආදරය බලාපොරොත්තුවෙන් සිටියත් ඔබ ව්‍යාජව ඔවුන් හට ආදරය කරන බව දැනේවි නම්, ඔවුන් ද ඔබට ව්‍යාජව ආදරය කිරීමට පෙළඹෙයි. එයින් තහනම් ගහේ ගෙඩි කෑමට ඔවුන්ද පෙළඹෙනු ඇත. එය ඔවුන්ගේ පැත්තෙන් බැලූ විට නිවැරදියි. හේතුව 'ඔබට හොඳනම් අපට නරක ද? යන සිතුවිල්ල ඔවුන්ගේ සිතේ උපදින බැවිනි. එහෙත් ඔබටත් ඔවුන්ටත් නොදැනීම එයින් සමාජයට අනිසි විපාක වලට ගොදුරු වීමට සිදුවේ. සමහර විට ඔබගේ දරු පවුල අනාථ වීමට ද එය හේතුවිය හැකියි. ඒ අන්‍යෝන්‍ය අවබෝධයක් ඇතිකර නොගෙන සමාජයට පෙනෙන්නට පමණක් ආදරය කිරීමෙන් ඇතිවන ඵල විපාකයන් ය. ඔබ ඔබගේ මවට පියාට දැඩිසේ ආදරය ආදරය දක්වන්න. කරුණාවන්ත වන්න ප්‍රථමයෙන් ආදරය පටන් ගත යුතු වන්නේ ද එතැනිනි. ඔබ මව්පියන්ට ආදරය රැකවරණය, ආරක්‍ෂාව නොඅඩුවව දෙන්නේ නම් ඔබට ඔවුන්ගේ ආශිර්වාදය නිරතුරුවම ලැබේ. ඒ ආශිර්වාදය ඔබ ජීවත්වන ආත්ම ගණනාවක් ඔබ පසුපස හඹා ඒවි. ඔබ බිරිඳට දැඩිසේ ආදරය කරන්න. ඔබ ගමනක් යනවිට, රැකියාවේ නිරත වන විට, යම් කාර්යයක් ඉටු කිරීමේ දී ඔබගේ ආදර පූජාවෙන් බිරිඳගේ සිතතුල

ඇතිවන යහපත් සිතුවිලි ඔබට ආශිර්වාදයක් වේ. එයින් ඔබට යම් යම් කාර්යයන් වල දී ජයලබාගැනීමට ද අධිෂ්ඨාන ජය ගැනීමට ද මහත් පිටුවහලක් වනු ඇත.

ඔබ ඔබගේ දරුවන් වෙනුවෙන් ඉටු කිරීමට ඇති යුතුකම් වගකීම් නොපිරිහෙලා ඉටු කරන්න. ඔබ යහපත් නම් ආදරයෙන් දරුවන්ට සලකන්නේ නම් ආදරයෙන් අවවාද අනුශාසනා ඔවුන් හට ලබා දෙන්නේ නම් ඔවුන් හට නිසි විධිමත් අධ්‍යාපනයක් ලබා දෙන්නේ නම් ඔවුන් නිරතුරුවම ඔබෙන් යම් යම් දේ සඳහා ආශාභංශය ලබාගනී. ඔබගේ සිත රිදවීමට ඔබ අපහසුතාවයකට ලක් කිරීමට ඔවුන් කිසිවක් නොකරයි. ඉන් සිදුවන්නේ ඔබේ පරපුර තුලින් රටට වැඩදායී ඵලදායී පුරවැසියන් බිහිවීමයි. බුද්ධ දේශණාවේ දී එක් ආත්මකය ගෞතම බෝධිසත්ත්වයන් තම මැණියන් කරපිට තබාගෙන මහ සයුර තරණය කළේ මැණියන්ගේ ජීවිතය බේරාදීම පිණිසය. ඒ වෙනකක් නොව ලොව උතුම්ම වස්තුව අම්මා වන බැවිනි. ආදරයේ උල්පත අම්මා වන බැවිනි. එම බෝසත් මැණියන්ගේ සිතෙහි තම පුතා ගැන ඇති වූ ආදරය කරුණාව සෙනෙහස මහසයුරේ දිය කඳටවත් සමාන කල නොහැකි විය. ඇයගේ ප්‍රාර්ථනය වූයේ "පුතේ නුඹට බුදුබව ලැබේවා" යන්නයි. ඒ පැතුමේ ප්‍රතිඵලය ඉන් ආත්ම ගණනාවකට පසු එම පුතාට අත් විය. එනම් ඒ පුතා ඉන් මතු භවයකදී ගෞතම බුදු රජානන් වහන්සේ නමින් මෙලොවට පහළ වූ බව සඳහන් වෙනවා.

බලන්න ආදරය පුදුම සහගතයි නේද?

- පෙම්වතිය ආදරයෙන් අන්ධ වෙයි. එබැවින් තමාට ආදරය ඇති පෙම්වතා සහ තමා රවටන පෙම්වතා වෙන්ව හඳුනාගැනීමට ඇයට නොහැකිය. එම නිසා බොහෝ අවස්ථා වලදී හැඟීම් වලට වහල් වීමෙන් පිවිතුරු බව පවා කෙළෙසා ගනී.
- එක් දෙරක් පමණක් ඇති විශාල ගරාජයක දෙර ඇති තැන බිරිඳගෙන් විමසුවහොත් ඇය නොදනී. එහෙත් තම සැමියාගේ නළලත වැටී ඇති කෙස් රොදෙහි ඇති කෙස්ගස් ගණන ඇය ඔහු කොපමණ දුරින් සිටියත් දනී.
- පිරිමියෙක් ගුණවත් වන්නට ද, දමරික වන්නට ද ගැහැණියගේ ආදරය හේතුවක් වේ. එහෙත් කුමණ අයගේ ආදරය ලැබුණත් ගැහැණියගේ ආදරය නොලබන පිරිමියාගේ සිත ව්‍යාකූලය. මෙය මානසික රෝගයන් සඳහා ද හේතු වනු ඇත.
- ආදර වූ කලී බලෙන් ලබාගත නොහැකි දෙයක් සේම හදවතට හොරෙන් පුදකල නොහැකි දෙයක් ද වේ. එසේම සිතුවකමට නැගිය නොහැකි එහෙත් විවිධ හැකියාවන් පෙන්නුම් කළ හැකි එකම දෙය ද ආදරයයි. ආදරය මිහිරියි, ආදරය සොඳුරුයි, ආදරය සෞම්‍යයි, ආදරය චමත්කාරයි, ආදරය හැඟුම්බරයි එසේම ආදරය ගෝචනියයි. ආදරය වේදනා සහගතයි. යතුවෙන් විග්‍රහ කළ හැකි වුවත්, එය සිත්තම් කළ නොහැක.
- සැබෑ ආදරය - ජීවිත අලංකාර කරයි, ඔවුනොවුන් තුල ප්‍රියමනාප බව ඇති කරයි. සාමය සතුට ලබාදෙයි. ආයුෂ වැඩි කරයි, දැනුම වර්ධනය කරයි. එහෙත් වෛරයෙන් පිරි ස්ථානයකට සැබෑ ආදරය දක්වීම ප්‍රවේශමෙන් කළ යුතු දෙයකි.

සැරයන් අමරසිංහ ජ්කේඩීජ්එල්
මූලස්ථානය 4 ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර
ඊරට්පෙරියකුළම් වවුනියාව

# සෙබළ සිතට

යුධ සෙබළෙක් වෙලා යුධ බිම අවතීර්ණ වූ අප සැම සැබෑ විරයෝ වෙමු. අපගේ තරුණ විය රට ජාතිය සහ ආගම වෙනුවෙන් කැප කිරීමට අවස්ථාවක් සලසා ගැනීම සෙබලුන් වශයෙන් අප ලැබූ ජයග්‍රහනයකි. එය අපට පමණක් නොව අපගේ දෙමාපිය සහෝදර සහෝදරියන් සහ අඹු දරුවන් ද ලැබූ ජයග්‍රහනයක් යැයි මගේ හැඟීමකි. එසේ නම් සොයුර සෙබළෙකු වශයෙන් අපගෙන් ඉටු විය යුතු විශාල යුතුකමක් ඇත. දනට රටේ පවතින ත්‍රස්තවාදී උවදුරු මුළුමනින්ම ඉවත් කළ යුතුයි මන්ද අපගේ බාල පරපුරට සාමය සෞභාග්‍යය ඇති කරලීම සඳහායි. අපගේ එකම අරමුණ විය යුත්තේ ද එයයි. පුරාණ රාජකාලයේ සිට පැවත එන එකම සිංහල රට වන ශ්‍රී ලංකාව තව දුරටත් එලෙසම පවත්වාගෙන යා යුතුයි. දෙමළ කොටි ත්‍රස්තවාදීන් විසින් ඔවුන්ගේ නිජබිම ලෙස අපගේ රට කඩා ගැනීමට සූදනම් වන මේ මොහොතේ අපගේ සේවය අමරණීයයි. අප රට සිංහල රටක් වශයෙන් ඉතිහාසයේ වංශ කථා වල පවා සටහන්ව ඇත. එසේ නම් එය රැකගත යුතු සිංහල අපම නොවේද?

ඒත්.... සියළුම දෙමළ ජනතාව ත්‍රස්තවාදීන් යැයි නොසිතන්න අහිංසක දෙමළ ජනතාව ද විශාල වශයෙන් ඇත. අප නැගී සිටිය යුත්තේ ත්‍රස්තවාදීන් හට විරුද්ධව පමණයි. සියළුම දෙමළ ජනතාව ත්‍රස්තවාදීන් නොවන බව මතකයේ තබා ගන්න. දෙමළ ජනයා ද මෙම යුද්ධයට අකමැති බව ඔබ හොඳින් දන්නවා නේද? එහි හොඳම නිදසුන රිවිරැස ක්‍රියාත්මිතයෙන් පසු යාපනයේ ප්‍රදේශයේ දෙමළ ජනතාවගෙ' ප්‍රතිචාරයයි.

සොයුර ත්‍රස්තවාදීන් නිසා දුක් විඳින ජනතාව බේරා ගැනීම අපගේ යුතුකම නොවේ ද?. එතරම් වටිනා සේවයක් කිරීමට අවස්ථාවක් සෙබලුන් වන අපට හැර අනු අයට ලැබෙන අවස්ථාවක් නොවේ.

නමුත් එවන් අවස්ථා ඉවත ලා යන සෙබලුන් රට, ජාතිය, ආගමට ලැදි පුද්ගලයින් නොවන බවමගේ හැඟීමයි. සොයුර මගේ ඉල්ලීම රටේ මෙවන් කරදරකාරී අවස්ථාවේදී සේවය අතහැර නොයන ලෙසයි. ඔබගේ සේවය අත්‍යවශ්‍යයයි එසේ නම් පැන නොයන්න ප්‍රශ්න නැති පුද්ගලයින් මේ ලොව නැත. එය ක්‍රමාණුකූලව විසඳ ගත හැකිය. ඒ සඳහා හොඳම රැකියාව ද ආරක්ෂක සේවයයි. ඒ සඳහා රජයේ සහයෝගය ද අප හට ලබාදේ. ඉතින් සොයුර අප සැම එක් වී ජය කණුව කරා පිය නගමු. අවසාන වශයෙන් ඔබට සියළු දෙවියන්ගේ පිහිට ආරක්ෂාව ආශිර්වාදය නිරතුරුවම ලැබේවා.

නි/62880 2/ලුතිනන් ඩබ්එච්
කරුණාරත්න ශ්‍රීලපාහ
8 ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම

## තුපත් හෙට දිනය

කෙලිලොල්ව ලස්සනට ගෙවී ගිය
කාලයට සමු දීලා
සිතක් පපුවක් නැති මේ ගිනි අවිය
අතට ගත්තේ මම වගේ තවත්
ජිවිතයක් නසන්නට නොව
නුඹලාට නිදහසේ නිවහල්ව ජීවත්
කරන්නය
ලස්සන ලෝකයක් බිහිකර රටට
සාමය ඇති කරන්නයි

සෙ/304244 කෝප්‍රල් නිශ්ශංක අයිඩීඑච්පී
(සී) කණ්ඩායම 4 ශ්‍රීලපාහ

# 15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව නගා සිටුවීම

දීර්ඝ යුද්ධයකට උරදී සිටින ශ්‍රී ලංකා මාතාවගේ ඒකීය හුරු කිරීම සඳහා පෞඪ ඉතිහාසයකට නෑකම් කියන 'සේවය කරමි යන උද්ධෘත පාඨයට අනුව යමින් ගොඩ නැගුණු සෙබළ පිරිසකගෙන් සේවය අවශ්‍යම මොහොතක 15 වන බළඇණිය ස්ථාපනය කළ බැව් දැනුම් දෙන්නේ මහත් ආඩම්බරයෙනි.

හමුදු වරියා නියෝග 14/97 හා පෙබරවාරි මස 26 දිනැති ලිපිය මගින් 97.03.15 වන දින සිට බලපවත්වන පරිදි ආධාරක බළඇණියක් වශයෙන් ඒකකය ස්ථාපනය කිරීම සඳහා උපදෙස් නිකුත් කර තිබුණි. එතැන් පටන් නිත්‍ය ශ්‍රීලපාහ ඒකක වෙතින් භට පිරිස් වාර්ථ කිරීම ආරම්භ විය. 3 සහ 6 ශ්‍රීලපාහ ඒකක වෙතින් සෙබලුන් 67 දෙනකු වව්නියාවේ සිට රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත පැමිණි අතර, පළමුව පැමිණි භට කණ්ඩායම වශයෙන් ඔවුන් ඇතුලත් විය.

එම්එස්බී/ඒ/6/1 හා 06 මාර්තු මස 1997 දිනැති යුහමු ලිපියෙන් ඒකකයේ අණදෙන නිළධාරී වශයෙන් මේජර් සී. විමලසිරි, ශ්‍රීලපාහ පත්කොට තිබුන අතර, ශ්‍රීලපාහ/රෙජි/පා12 (26) හා 1997 මාර්තු මස 19 දිනැති ලිපියෙන් දෙවන අණදෙන නිලධාරි ඇතුලුව අනෙකුත් නිලධරීන් කිහිප දෙදෙනකු ඒකකය වෙත ඇතුලත් කොට තිබුණි. ඒ අනුව ඒක්‍රිමු වෙතින් ලබා දී තිබූ උපදෙස් මත රෙම ශ්‍රීලපාහ වෙත රපෝර්තු කොට තිබූ 1 ශ්‍රීලපාහ, 3 ශ්‍රීලපාහ හා 6 ශ්‍රීලපාහ සෙබලුන් සමග භට කණ්ඩායමක් 1997.03.27 වන දින යාපනය පලෙයි ප්‍රදේශයේ එවකට 10 ශ්‍රීලපාහ ඒකකය ස්ථාන ගතව සිටි කඳවුර දක්වා පැමිණ ස්ථාන ගතවන ලදී. එහිදී සහෝදර බළඇණියක් වශයෙන් 10 ශ්‍රීලපාහ ඒකකය වෙතින් සපයා දුන් පාලනමය අවශ්‍යතාවයන් ගෞරවයෙන් සිහිපත් කරන්නෙමු. පෙර සඳහන් කරන ලද ඒකක දෙක හැරුණු කොට අනෙකුත් නිත්‍ය ශ්‍රීලපාහ ඒකක යාපනය අර්ධද්වීපයේම ස්ථානගතව සිටීම භට පිරිස් රපෝර්තු කිරීමේ දී මහත් පහසුවක් විය.

එවකට 1 ශ්‍රීලපාහ පරන්තන් ද, 4 ශ්‍රීලපාහ අයියකච්චි, 7 ශ්‍රීලපාහ කිලිනොච්චි, 8 ශ්‍රීලපාහ අලිමංකඩ , 10 ශ්‍රීලපාහ පලෙයි, 11 ශ්‍රීලපාහ යාපනයේ ද, 12 ශ්‍රීලපාහ චාවකච්චේරියේ ද ස්ථාන ගතව සිටි අතර, 97.04.01 දින වන විට පහත සඳහන් පරිදි භට පිරිස් රපෝර්තු කොට තිබුණි.

රෙම ශ්‍රීලපාහ 04 x 00 (අනි, 2 අනි, උපපන්න නිලධාරී 02)

| | |
|---|---|
| 1 ශ්‍රීලපාහ | 00 x 43 |
| 3 ශ්‍රීලපාහ | 00 x 27 |
| 4 ශ්‍රීලපාහ | 00 x 53 |
| 6 ශ්‍රීලපාහ | 00 x 44 |
| 7 ශ්‍රීලපාහ | 00 x 46 |
| 8 ශ්‍රීලපාහ | 00 x 34 |
| 10 ශ්‍රීලපාහ | 01 x 16 |
| 11 ශ්‍රීලපාහ | 00 x 51 |
| 12 ශ්‍රීලපාහ | 00 x 50 |

ආගමික කටයුතු නිම කිරීමෙන් අනතුරුව 1997.04.02 දින තවත් නිත්‍ය ඒකකයක් 15 ශ්‍රීලපාහ යන නමින් යාපනය අර්ධද්වීපයේ පලෙයි ග්‍රාමයේ දී එකතුවන ලදී. එම අවස්ථාවට අණදෙන නිලධාරී ප්‍රමුඛ ඉහත සඳහන් නිලධාරීන් හා එදිනට ඒකකය වෙත පැමිණ සිටි ජ්‍යෙකොනොනින් ඇතුළු සියලූම සෙබලූන් සහභාගී විය. මෙහි දී රාජකාරි ආරම්භ කරමින් විශේෂ නියෝග පලවන කොටස අනිගේ පණිවුඩය නිකුත් කරන ලදී. ඒ අනුව අප්‍රේල් 02 දින බළඇනි දිනය වශයෙන් ඉතිහාසයට එක් විය.

පැමිණ සිටි භට පිරිස් 10 ශ්‍රීලපාහ ඒකකය සමග ඉදිරි ආරක්ෂක වල්ලේ රාජකාරි සඳහා යොදවන ලද අතර, 1997.04.07 වන දින 523 බසේමු විසින් දියත් කරනු ලැබූ පැය 48 ක ක්‍රියාත්විතයට සහභාගී කරවන ලදී.

ඒකකය ස්ථාපනය කිරීමත් සමග 1997.04.08 වන දින ඒකක ධජය ඔසවා අණදෙන නිලධාරී විසින් පළමු වරට සියලූ නිළයින් අමතන ලදී. ඒ සඳහා 03x194 ක් නිලධාරීන් / සෙසු නිළයින් සහභාගී වන ලදී.

1997.04.10 දින වනවිට පැමිණ සිටි නිලධාරීන් පහත සඳහන් තනතුරු සඳහා පත් කරන ලදී.

ලූතිතන් කේජ්එස්එස් කොලොන්නේ ශ්‍රීලපාහ - නි.අ. "ඩී" කණ්ඩායම

ලූතිතන් ඩබ්පීජී ගුණරත්න ශ්‍රීලපාහ - වැ.බ.නි අ "ඒ" කණ්ඩායම

ලූතිතන් කේඑස්එන් සිල්වා ශ්‍රීලපාහ - වැ.බ. වි.අ.

2 ලූතිතන් ඩබ්එස්එම්බී වලිසුන්දර ශ්‍රීලපාහ - වැ.බ.නි.අ. "සී" කණ්ඩායම

2 ලූතිතන් එල්සී ප්‍රනාන්දුපුල්ලේ ශ්‍රීලපාහ කා.හා.නි. බී කණ්ඩායම

ලූතිතන් (උපා) එච්එන් මසහින්ද ශ්‍රීලපාහ - උපානි

1997.04.11 දින 10 ශ්‍රීලපාහ ඒකකය වෙතින් 523 බසේමු යටතේ සිදුකල සියලූමස රාජකාරීන් භාර ගන්නා ලද අතර, 7 සහ 8 ශ්‍රීලපාහ ඒකක වෙතින් 81 මිමි මෝටාර් අවි 02 ක් ඒකකය වෙත ආධාරක අවි වශයෙන් ලැබුණි. ඒ සමග ඒකකය සතුව බණ්ඩ ආධාරක අවි කිසිවක් නොතිබුණු හෙයින් 523 බසේමු වෙතින් 60 මිමි මෝටාර් අවි 07 ක් ආර්පීජී අවි 06 ක් හා සුයාතු අවි 13 ක් ලබා දෙන ලදී. 523 බසේමුහි බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ආර් බාළසූරිය විසින් ප්‍රථම වරට 1997.04.10 දින ඒකකයේ භට පිරිස් අමතන ලදී. එහි දී ප්‍රදේශයේ වත්මන් තත්ත්වය හා රාජකාරී ස්වභාවය සබැඳිව කරුණු පැහැදිලි කර දෙන ලදී. 1997.04.10 දින සිට බලපවත්වන පරිදි රෙජි මූලයේ පුහුණුව ලැබ විසිර යන ලද ආධුනික සෙබලූන් 60 ක් ඒකකය වෙත ඇතුලත් කරන ලදී. ඔවුන් ඒකකය වෙත ඇතුළත් වූ පළමු ආධුණික භට පිරිස වේ. මේ වන විට ඒකකයේ සංඛ්‍යා වාර්තාවට අනුව නිලධාරී 10 ක් සෙනීන් 430 ක භට පිරිසක් ඒකකය වෙත ඇතුලත්ව සිටින ලදී.

52 සේනාංක මූලස්ථානයට යටත්ව 523 බලසේනා මූලස්ථානයේ යටතේ පලෙයි ප්‍රදේශයේ ඉදිරි ආරක්ෂක පෙලෙහි ඒ. සී. ඩී කණ්ඩායම් ද කිලාලි කලපු ප්‍රදේශයේ බී

කණ්ඩායම ද ස්ථාන ගතව රාජකාරි නියුතුව සිටී. 523 බසේමු වෙතින් සැලසුම් කරන ලද ක්‍රියාන්විත කීපයකට මෙම සුළු කාලය තුළ සහභාගී වන ලදී. එහි දී "වැලිකතර" නගර් කෝවිල් ප්‍රදේශයේ සිදු කරන ලද ක්‍රියාන්විතයේ දී ඒකක හට පිරිස් උසස් ප්‍රතිඵල පෙන්වමින් සතුරාට අයත් බඩුබාහිරාදිය හා පතරොම් තොගයක් අත් අඩංගුවට ගැනීමට සමත් විය.

එසේම ක්‍රීඩා කෞශල්‍ය ද මනාව විදහා දක්වමින් 52 සේනාංක මූලස්ථානය වෙතින් සංවිධානය කර තිබූ පිටියේ ක්‍රීඩා තරග අතර එල්ලේ, ක්‍රිකට් අත්පන්දු තරග නියෝජනය කරමින් අත් පන්දු හා එල්ලේ ක්‍රීඩා වලින් 523 බසේමු ශූරයන් වීමටත් අවසන් තරග සඳහා සුදුසුකම් ලැබීමටත් සමත් වන ලදී.

1993 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිදු කරන ලද "යාල්දේවි" මෙහෙයුමේ දී සිදුවූ විශාල තම සංග්‍රාමයට මුහුණ දුන් ස්ථානය ද ඇතුලත්ව ඒකකය ස්ථාන ගතව ඇති මෙම ප්‍රදේශයේ විශාල ජනගහනයකින් යුක්ත වේ. සිවිල් සුහ සාධක කටයුතු අරමුණු කොට ගෙන 523 බසේමු අනුග්‍රහය යටතේ 10 ශ්‍රීලපාහ ඒකකය වෙතින් අරඹා තිබූ මැහුම් පාසලේ අවශ්‍යතාවයන් සපුරා දෙමින් ඉතා මැනවින් පවත්වාගෙන යන ලද අතර, එක් පාඨමාලාවක් 1997.09.06 වන දින විසිර යන ලදී. එහි ප්‍රධාන ආරාධිතයා ලෙස 52 සේනාංකාධිපති සහභාගී වන ලදී. එදින තවත් පාඨමාලාවක් හා යතුරු ලියන පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මීට අමතරව සිවිල් සුහසාධනය සඳහා මාර්ග පිලිසකර කටයුතු, රෝහල්, මාතෘ නිවාස යනාදිය ගොඩනැගීම සඳහා ව්‍යාපෘති, විවිධ ශ්‍රමදාන කටයුතු, පාසැල් ළමුන් වෙනුවෙන් චිත්‍රපටි දර්ශණ හා ගුවන් විදුලි සංස්ථාවේ අනුග්‍රහය ඇතිව විනෝදාත්මක වැඩ සටහන් ද ඉදිරිපත් කිරීමට මූලිකව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය ශ්‍රීලපාහ ඒකක අතරේ ලාබාලම ඒකකය වන අපගේ ඒකකය මනාව ගොඩනැගීමේ කර්තව්‍යයේදී හට පිරිස් ලබාදීමෙන් ද අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් හා සුහ පැතුම් පිරිනමා ඒකකය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පසුබිම් සැකසූ ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු අධිපති තුමා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද, රෙජිමේන්තු සේනාවිධායක තුමා ඇතුලූ නිළධාරීන් ද සියලූ නිත්‍ය/ස්වේච්ඡා ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරීන් ඇතුලූ නිලයින් වෙත අණදෙන නිලධාරී ඇතුළු අප සියළුම නිළයින්ගේ ගෞරව පූර්වක ස්තූතිය පිරිනමන්නෙමු.

15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව

# සෙබළ සිතුවිල්ලක්

කෙමෙන් කෙමෙන් අඳුරු වී මුළු ම්හිමඩලම ආදරයෙන් සිපගනී. වියලී ගිය හා ඉරි තැලූනු බොල් පොලව මත දැවෙටෙන්නා වූ සදකැත් ගොම්මනය පලවා හරිමින් මුළු උතුරු කරයම ශ්‍රී චන්ද්‍රකාන්තියෙන් නහවා හරියි.

රැයක් පහන් වෙන්නේ මට කල්පයක්ගත වන්නාක් මෙනි. අඳුරට මුවා වෙමින් සැකයෙන් භීතියෙන් තල් වැටේ එක් මායිමක පොල් අතු සෙවිලි මතින් සවිකරන ලද මට සෙවණ දෙන්නා වූ බංකරයේ හිඳ කෙරෙන්නේ තම මව්බිමේ සාමය හා සමානාත්මතාවය රැක ගැනීමය.

එහෙත් මා ප්‍රයත්න දරන්නා වූ ඒ උදරතර සිතුවිල්ලේ අනන්තය දක ගැනීම පහසු කාර්යයක් නොවනු ඇත. රුක්ෂ වන මැද්දේ සිට සතුරා ලූහු බඳින්නේ ජාතියේ ධනය බදු අප මරු තුරුලට ඩැහැ ගැනීමට නොවේ දෑ එහෙත් මව්ගේ කිරි රුධිරයෙන් පන පෙනුන අපගේ හදවත් පරසතුරු කැල අභියස කිසිදින හඩා නොවැටෙන හා සන්තාපනොවන බවට සක්සුදක් සේ පැහැදිලි න්නෙකි. සෙබලාට නියම ස්ථාවරයක් හා නිපුණත්වයක් ඇත. ඒ බව ඉතිහාසය හා සසඳ බලන කල රණශූර විරුවන්ගේ දස්කම් මතින් ලබා ඇති ජයග්‍රහණ වලින් පිළිබිඹු වන අතර එය තවත් තීර කර ගැනීම සඳහා මගේ සිතට අවශ්‍ය නොපසුබට චිත්ත ධෛර්යය හා ශක්තිය ලැබෙන්නේ නිරායාසයෙනි.

යෞවන වසන්තය ඉකිබිඳුම හා වේදනාවේ කඳුලූ වැල් අතර සිරවෙමින් සිටින මා මදක් ඇලවීමත් සමගම මදුරු සංහාරයේ රුදුරු පහස ගතට දැනේනේ ඒ අඩ නින්දද අවදි කරවමිනි. අවට පරිසරයේ ඇති බියකරු අන්ධකාරය යාන්තමින් හෝ මැකෙන්නේ බංකරය තුළ දල්වාඅ ඇති කුප්පි ලාමුපුවෙනි. මෙවැනි අම්හිරි අත්දැකීම් විඳදරා ගනිමින් සුවිශාල වූ දුෂ්කරතාවයක යෙදෙන්නේ වර්තමානයේ හා අනාගතයේ කිරිකැටි දරුවන්ට අවශ්‍ය නිදහස හා මූලික අයිතීන් රැකදීමට යැයි සිතෙන විට සතුටක් මෙන්ම සියුම් බලාපොරොත්තුවක් ද මා හද තුළට නැගෙයි.

මදක් මා ඉදිරියට ගොස් ඈත කොනේ පෙනෙන සීමාව දෙස දස් විවර කොට බැලූවෙමි. එහෙත් වර්තමානයේ බැලූ බැලූ හැම තැන මහපොළොව මත කඩා බිඳ වැටී සමතලා වුනු ජාතික ධනය සොහොන් පිටි මෙන් වැලි කතරේ රැඳී ඇත්තේ මා ප්‍රාර්ථනා කරන සාමයට විරුද්ධව සටන් කරන්නවුන්ගේ අනිටු ප්‍රතිඵලයැයි දැනෙන විට මගේ නැවුම් හද ගින්නෙන් තව තවත් දවාලයි.


මෙවැනි විනාශ වීම් සිදුවන්නේ කාගේ වරදින් ද යන්න මට නොතේරේ. මා මෙන් සාමය හා නිදහස අගය කරන බහුතර ජනතාව හා අනෙකුත් සෑම සුළු ජන කොටසකටම මේ කුරිරු යුද්ධය උඩුදුවන හා මුහුකුරා ගිය ඛේදවාචකයක් බවට මේ වන විට පත්වී හමාරය. එහෙත් කෙදිනක හෝ මෙම ශාපලත් යුද්ධය නිමාවක් වී එකම දේශයක් ලෙස එකම ධජයක් යටතේ අනාගතය කරා නොනැසී පවත්වා ගෙනයාමට ආරක්ෂා කර ගත යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය ශක්තිය මා නිරන්තරයෙන් ලක් මාතාවට යොදවන බව සෙබල මගේ නිබඳ සිතුවිල්ලයි.

10 ශ්‍රීලපාහ හි සේවනය කරනු ලබන සැරයන් කුමාරණ කේ ඒ ගේ නැගණියගේ නිර්මාණයකි.

**කේ රේණුකා පතිරණ**

කොටදෙනියාව - මීරිගම

# Important Events of the Regt Within the Period of 4th and 5th Regtl Council Meetings.



1. **Ceremonial Guard Turnout to Comdt - SLAVF, Maj Gen A. K. Jayawardhana RWP RSP rcds Psc.**

   A Ceremonial Guard turnout was presented to Maj Gen A K Jayawardhana Rwp RSP rcds psc who assumed duties as Comdt HQ-SLAVF on 0-5 Nov 97 at the HQ of SLAVF.

2. **Ceremonial Guard of Honour and Guard turnout to GOC - 11 Div Maj gen WMP Fernando USP ndc psc.**

   As per the directions of HQ - 11 Div, a Ceremonial Guard of honour and a Guard turnout were presented to Maj Gen WMP Fernando USP ndc psc who assumed duties as GOC 11 Div on 05 Nov 97 at HQ - 11 Div.

3. **Bn Adjts' Conf.**

   A co-ordination Conf with BN Adjts' was conducted by the Centre Comdt in order to settle outstanding administrative matters of the Bns.

4. **Lunch to disable sldrs on 20th Nov. 1997**

   As per the directions of Regimental Council as special lunch was given to all disabled sldrs who are at the Regt. Centre Comdt, Lt. Col J S Masakkara SLLI participated as the Chief guest of this occasion.

5. **Ceremonial Parade of Laying of the Foundation Stone for the Heroes' Monument**

   A ceremonial parade comprising 01x30 was given on the occasion of laying the foundation stone for the Heroes' Monument Sri Jayawardhanapura Kotte on 27 Nov. 1997. Hon Minister of Irrigation, Power & Energy and Deputy Minister of Defence Gen Anurddha Ratwatte participated as the Chief guest and laid the foundation stone for the Heroes Monument.

6. **Battalion ORQM's Conference**

   All ORQM's of the Bns were called for the Co-ordinating Conf presided by the Centre Comdt at the RHQ with a view to improving correspondence on all matter pertaining to the Bns.

7. **Passing Out Parade**


   30th Passing out Parade was conducted on 10 Dec 97 at Regtl Parade Ground. 279 xRecs were on the parade. Brig MG Alwis KSV paraticipated as the Chief Guest.

8. **Special Tea Party and Presentation of Gift Parcles to a cross section of Tps on 01st Jan 98.**

   A special tea party was organised at the Regtl Auditorium to a cross section of Tps to celebrate the New Year 1998. Some gift parcels which were presented by Union Assurance Pvt. Ltd. Kapruka. Organisation and Emirates Air Lines were distributed to the ORs who participated in the function.

9. **Religious Activities**

   As per the directions of Sri Lanka Army Buddhist Council special "Dhana' and Seela campaign was organised at the Panagoda Army Bodhirajaramaya



with the assistance of ATS M'Oya on the full moon Poya Day of Dec (13 Dec 97) to invoke blessing on all offrs and Ors who are performing duties in North and East.



10. **Re-Opening of Welfare Shop**

SLLI Welfare Shop was reopened by Col of the Regt, Maj Gen AK Jayawardhana RWP RSP rcds psc at the auspicious time of 1043 hrs on 19 Dec 97. Electrical Items such as Tvs, VCRs, Cassette Players, Amplifiers, Buffels ets are being offered on easy payment terms with the view of improving the Welfare of the sldrs and grocery items were also available at concessionary prizes.

11. **Display of Brass Band and the "Drums and Pipe" Band**

This display was organised in order maintain the standard of the Regtl. Bands on 19 Dec 97 at the Regtl Parade Ground. Col of the Regt. Maj Gen A K Jayawardhana RWP RSP rcds psc participated to see the performances of these two bands. Co-ordination and music directions were done by Lt (Qm) MW Gunathilake SLLI.

12. **Lunch to Disabled Sldrs on 19 Dec** 97

As per the directions on the Pay day of Dec, a special lunch was given to disabled sldrs. Col of the Regt. Maj Gen A K Jayawardhana RWP RSP rcds psc participated as the Chief Guest, Before starting the function, the Regtl Anthem was sung by all offrs and Ors, Back ground music for the entire function was provided by the brass band and the 'Beat Group' of SLLI. To conclude the function, Col of the Regt delivered a speech highlighting the responsibilities of the Regtl Council, newly introduced Death Donation Scheme and the Loan Scheme for the Offrs and ORs who belong to the SLLI.

13. **Military Funeral of Late Lt Col DAC Jayathilake SLLI**

A ceremonial military funeral was given to late Lt Col DAÇ Jayathilake SLLI who sacrificed his valuable life for the nation due to a land mine explosion at Mirusuvil in Jaffna on 20 Dec 97. The funeral was held at the family burial ground in Kegalle at 1530 hrs on 27 Dec 97.

14. **Military Funeral of Late Maj MN Jamaldeen RSP SLLI**

A ceremonial military funeral was given to late Maj MN Jamaldeen RSP SLLI at the Muslim Burial Ground at Dehiwala on 29 Dec 97, who died under the tragic circumstances on 28 Dec 97.

15. **31st Night Dinner Dance at the Regtl Offrs' Mess**


31st Night Dinner Dance was organised at the Regtl Offrs Mess for the entertainment of all offrs who belong to the Regt. This function was sponsored



by Union Assurance, Pure Beverages, Swarana Kelum Group and Kapruka Organisation.

16. **Regtl Publications**

Regtl Desk Calender and the membership card of SLLI ASSN have been published by the Regt for the period of 4th and 5th Regtl Council Meetings.



# What's New

Major K J Jayaweera SLLI

## තොරතුරු බිඳක්....

### එතෙරම පාඨමාලා නිලධාරි

නිලධාරි මෝටාර් පාඨමාලාව - ඉන්දියාව 98-01-19 සිට 98-03-14
නි/61780 කපිතන් කේඑන්ඩී කරුණාපාල SLLI

Engineering & Watermanship Couse පාකිස්ථානය
98-01-05 සිට 98-02-21 දක්වා
නි/62150 කපිතන් ඒආර් ඇන්තනී 6 SLLI
නි/62188 කපිතන් විඩීඑස් පෙරේරා 7SLLI

කණිෂ්ඨ නිලධාරි අණදෙන්නන්ගේ පාඨමාලාව - ඉන්දියාව
97-11-24 සිට 98-02-28 දක්වා
නි/60671 මේජර් ජේ එදිරිසිංහ 1 SLLI

තරුණ නිලධාරි පාඨමාලාව - ඉන්දියාව 97-11-10 සිට 98-04-04
නි/ 61481 කපිතන් ඒඑස් වික්‍රමසිංහ 6 SLLI

### විවාහවීම් නිලධාරී / සෙසු නිල

නි/62569 ලුතිනන් අයිකේඩී එදිරිසිංහ ශ්‍රීලපාහ - 97.08.08 දින අංක 464, පිලියන්දල පාර මහරගම නිවසේ දී විතාන ආරච්චිගේ ප්‍රදීපා සංජීවනී මෙනෙවිය සමග විවාහ විය.

සෙ/300953 කෝප්‍රල් රණසිංහ පීඩී - 97.08.22 දින අහංගම එඑකැටියේ පිහිටි මනාලියගේ නිවසේ දී පරගහතැන්නගේ ප්‍රදීපිකා චතුරාණි මෙනවිය සමග විවාහ විය.

සෙ/303359 සාසෙ උදයකුමාර ආර්ඩීටීබී - 97-08-20 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ මිලියද්ද විවාහ ලේකම් කාර්යාලයේදී කලිංගුවා දේවගේ ශිරන්ති මංජුලා ප්‍රේමදන්ද්‍ර මෙනවිය සමග විවාහ විය.

සෙ/15866 ලාකෝ විජේතුංග එච්එම් - 97.03.10 දින කොළඹ දිස්ත්‍රික්කයේ හල්පිටි කෝරලයේ මඩපාත මනාලියගේ නිවසේ දී හපුතන්තිරිගේ ශ්‍රේන අනෝමා උමයංගනි ගුණසේකර මෙනවිය සමග විවාහ විය.

සෙ/303869 ලාකෝ රත්නපාල ආර්එම් - 97.08.08 දින බදුල්ල ඉඩම් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී දිසානායක මුදියන්සේලාගේ සමන්ති ප්‍රියංගනී දිසානායක මෙනවිය මහමග විවාහ විය.

නි/62031 කපිතන් එස්ඡ්වයිකේ ජයතිලක ශ්‍රීලපාහ 97/06/25 වන දින අම්බලන්ගොඩ අතිරේක රෙජිස්ටාර් කාර්යාලයේ දී ඩිලූ සමන්මලී ද සිල්වා මෙනවිය සමග විවාහ යි.

සෙ/15910 කෝප්‍රල් චන්ද්‍රතිලක ජබ්එන් 97/10/06 වන දින අතිරේක රෙජිස්ටාර් කාර්යාලයේදී බෝපේ විරතුංග හේමා දමයන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/301916 කෝප්‍රල් වික්‍රමාරච්චි එස් 97/09/03 වන දින තවලම අතිරේක රෙජිස්ටාර් කාර්යාලයේ දී මොහොන්දිරම්ගේ සිරිමා රුද්‍රිගු මෙනවිය සමග විවාහ විය.

සෙ/304345 කෝප්‍රල් බංඩාර ආර්එන්එස්එස් 97/10/10 වන දින කන්දඋඩ පංගුවේ රෙජිස්ටාර් කාර්යාලයේ දී ලංකා විරිදුවලාගේ විජිත මල්ලිකා මෙනවිය සමග විවාහ විය.

### විවාහවීම් නිලධාරී / සෙසු නිල

සෙ/304044 ලාකෝ රණවීර එම්ජී 97/09/24 වන දින කරලියද්ද විවාහ ලේකම් කාර්යාලයේදී කහටගෙදර චන්ද්‍රා කුමාර මෙනවිය සමග විවාහ විය.

සෙ/ච303504 ලාකෝ ලාල් යූජ් 94/06/01 වන දින මැදවච්චිය දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී චන්ද්‍රසේකරගේ දමයන්ති දචන්ද්‍රසේකර මෙනවිය සමග විවාහ විය.

සෙ/303561 ලාකෝ ජයතිලක බීඑම 97/08/25 වන දින පුස්වැල්ලේගම විවාහ ලේකම් කාර්යාලයේ දී කුමාරසිංහ මුදියන්සේලාගේ ස්වර්ණලතා මෙනවිය සමග විවාහ විය.

සෙ/304312 ලාකෝ බංඩාර එල්බීඑස් 97/09/12 වන දින මනම්පිටිය විවාහ ලේකම් කාර්යාලයේ දී ගාල්ලේ හෙට්ටිආරච්චිලාගේ නිලූෂා මෙනවිය සමග විවාහ විය.

සෙ/302916 සාසෙ රවින්ද්‍ර ඊබී 97/09/12 වන දින හිනිදුම ලෙහනාව විවාහ ලේකම් කාර්යාලයේදී ගලබඩ ගමගේ ප්‍රියන්ති සමන්ලතා මෙනවිය රසමග විවාහ විය.

සෙ/307346 සාසෙ රාජගුරු බංඩා කේඑම් 89/01/20 වන දින පහල හල්මිල්ලෑව විවාහ ලේකම් කාර්යාලයේ දී සමමරකෝන් මුදියන්සේලාගේ මියන්ති මංගලිකා සමරකෝන් මෙනවිය සමග විවාහ විය.

සෙ/305780 සාසෙ දීපාල් කුමාර පීආර්එම් 95/11/28 වන දින හෙට්ටිමුල්ල විවාහ ලේකම් කාර්යාලයේ දී මද්දුම හල්මිනීනගේ පුෂ්පා නන්දනී මෙනවිය සමග විවාහ විය.

සෙ/303580 සාසෙ කොඩිතුවක්කු කේජ්සීකේ 95/07/18 වන දින මහනුවර දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී ගල්ගොඩපිටිය මුදියන්සේලාගේ උදේනි කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/300992 ලාකෝ ප්‍රියන්ති කුමාර ඒඑම්ජ් 95 නොවැම්බර් 30 දින බුලත් සිංහලගේ බිලේෂා කුරේ මෙනවිය සමග අත්තනගල්ල දිස්ත්‍රික්ක විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී විවාහ වන ලදී.

සෙ/301297 ලාකෝ සරත් කුමාර ජීවී 1997 දෙසැම්බර් 01 වන දින පිංහේන විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී දර්ශණී හිමාලි එදිරිසිංහ මෙනවිය සමග විවාහ වන ලදී.

### දරු උපත්

සෙ/12779 ව/සැර සමරසිංහ එම්ඩීජේබීගේ බිරිඳට වතුපිටිවල රෝහලේ දී 97-02-15 වන දින පුතෙකු උපනි. නම විශ්වජිත් පබසර සසමරසිංහ

සෙ/301554 ලාකෝ පියසිරි කේඑන්එස් ගේ බිරිඳට යුධ හමුද රෝහල කොළඹ දී 97.09.29 දින පුතෙකු උපනි. නම කේඑන් මයුර සුභාෂන

සෙ/15706 කෝප්‍රල් වීරසේකර සීටී ගේ බිරිඳට වලස්මුල්ල රජයේ රෝහලේ දී 95.06.12 දින දියණියක උපනි. නම සඳනි ප්‍රබන්ධි වීරසේක

සෙ/115333 බනි 1 ඩබ් වික්‍රමසිංහ ආර්එස්පී ගේ බිරිඳට 95/07/29 දින කුරුණෑගල රජයේ රෝහලේ දී දුවෙකු උපනි. නම ඩබ්.එස් ඉරේෂා

සෙ/12915 සැරයන් අරංගල්ල ඒඑස් ගේ බිරිඳට 96/11/04 දින උතුරු කොළඹ මහ රෝහල රාගම දී පුතෙකු උපනි. නම - සාරද චමික අරංගල්ල

## දරු උපත්

සෙ/00034 ච/සැර ජයතිලක හේරත් ඩීඑම් ගේ බිරිඳට කුලියාපිටිය රජයේ රෝහලේ දී පුතෙකු උපනි. ඩීඑම් සුහාන් ප්‍රියංකර දිසානායක.

සෙ/14094 සැරයන් නිමල්සිරි එච්පීජී ගේ බිරිඳට 97/08/25 දින ගම්පොල මූලික රෝහලේ දී දුවෙකු උපනි. නම එච්. ජී. ඖෂධී ඉෂාරා තිලකරත්න

සෙ/301182 කෝප්‍රල් සැම්සන් ආර්ඩීජේ ගේ බිරිඳට 97/03/25 දින ගාලු මහ මෝදර රජයේ රෝහලේ දී දුවකු උපනි. නම - ඉමල්කා ක්‍රිෂානි

සෙ/3042 ලාකෝ දිසානායක ටීආර්එස් ගේ බිරිඳට 97/06/13 වන දින ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ දී දුවෙකු උපනි. නම තනුජා මයෝමි දිසානායක

සෙ/307346 සාසෙ රාජගුරු බංඩාර ආර්එම් ගේ බිරිඳට 90/10/29 දින නොච්චියාගම මාතෘ නිවාසයේ දී පුතෙකු උපනි. නම . ආර්.එම්. සජිත් ඉඳුනිල් බංඩාර

සෙ/15954 ලා/කෝ කුමාරසිංහ ඩීඑම් ගේ බිරිඳට 1997/08/19 වන දින මොනරාගල දිසා රෝහලේ දී දුවකු උපනි. නම සුරේෂා මධුවන්ති කුමාරසිංහ

සෙ/14437 කෝප්‍රල් පියතිස්ස ඩීඑම්යු ගේ බිරිඳ වන එස්එම් චන්ද්‍රා පියතිස්සට 1997/07/11 වන දින අනුරාධපුර සහ රෝහලේ දී දුවකු උපනි. නම. ඩී. එම්. ගයානි නිලූෂා පියතිස්ස

සෙ/14151 සැරයන් ෂිරාන් කුමාර යූකේගේ බිරිඳට කළුතර රජයේ රෝහලේ දී 1997.10.03 වන දින පුතෙකු උපනි. නම පසන් විකසිත

සෙ/304299 සාසෙ එදිරිසිංහ ඒජීඒ ගේ බිරිඳ වන වයි ජී විමලාවතීට 1997.12.25 වන දින මාතලේ රජයේ රෝහලේ දී දියණියක් උපත ලැබුවාය. නම සකුරා මල්ෂානි එදිරිසිංහ

සෙ/14352 කෝප්‍රල් තිලකරත්න කේකේඩී ගේ බිරිඳට මහනුවර ශික්ෂණ රෝහලේ දී 97/12/26 දින දුවෙකු උපනි. නම. ලක්වානි කාවින්ද්‍යා තිලකරත්න.

## මියයෑම් නිලධාරී /සෙසු නිල

නි/62312 කපිතාන් ජේ. ඩී විතාන, ශ්‍රීලපාහ 97.10.07 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

නි/63327 දුතිතාන් එන්එම්ජ්ඒ නවරත්න, ශ්‍රීලපාහ 97.10.13 දින අයිලඩි හි දී මියයන ලදී.

සෙ/14499 ච/සැරයන් ජයසූරිය එම් 97.06.05 වන දින වලිකාමන් හි දී මියයන ලදී.

සෙ/125291 ලාකෝ පියරත්න බීඒ 97.06.12 වන දින තැදුන්කේනි හිදී මියයන ලදී.

සෙ/300517 සැරයන් අරුණකුමාර යූඑච්එස් 97.09.10 දින පුලියන්කුලම හිදී මියයන ලදී.

සෙ/303146 ලාකෝ කමල්කුමාර එන්එච් 97.09.10 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/303437 ලාකෝ ද සිල්වා ඩබ්ජ්පී 97.09.10 පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/308432 ලාකෝ ඒකනායක රීඑම්ජේ 97.09.11 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/305091 ලාකෝ ජනකුමාර එස්ආර් 97.09.11 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/303750 ලාකෝ දසනායක ආර්පීඩබ් 97.09.11 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/302312 සැරයන් බන්දුකුමාර එච්කේ 97.09.12 පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/14491 ලාකෝ කරුණාරත්න එම් 97.09.11 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/302307 ලාකෝ රත්නසිරි යූඑම්ජී 97.09.11 පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/303920 ලාකෝ සරත්බංඩාර ජීඑම්ඩබ්එම් 97.09.11 පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/125278 ලාකෝ ජීවකරත්න ඩබ්එච් 97.09.11 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/301764 ලාකෝ වාරියප්පෙරුම ඩබ්ජ්ආර්ජේ 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/302875 ලාකෝ ගජනායක ජීඑම්එස්එල් 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/303474 ලාකෝ ප්‍රසන්න එන්ජී 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/303759 ලාකෝ සේනාරත්න ඒජ්ඩබ්එච්පීඑස් 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/304150 ලාකෝ සුමනසිරි කේ 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/403175 ලාකෝ විරසිංහ යූබීජ් 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/305092 ලාකෝ විරසේන ජේමේඑල් 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/306317 ලාකෝ විත්‍රවීර බී 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/308440 ලාකෝ එදිරිසිංහ එල්ඩී 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/121738 ලාකෝ ලක්සිරි එම්එච් 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/122218 ලාකෝ සිල්වා පීඑම්ජේ 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/13493 ලාකෝ තිලකරත්න ඩීඑම් 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/306381 ලාකෝ කුමාරසිරි එන්ජීපී 97.09.11 දින පුලියන්කුලම් හිදී අතුරුදහන් විය.

සෙ/301790 සැරයන් මුණසිංහ එච්ඒඩබ්ජී 97.09.21 දින පුලියන්කුලම් හිදී මියයන ලදී.

සෙ/11838 බනි 1 සොයිසා ඒඑල් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/12303 ච/සැරයන් පතිරන එම්පීඑස්ඩබ් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/13491 ච/සැරයන් බණ්ඩාරනායක එස්එම්ආර් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/302340 සැරයන් චන්ද්‍රසේන කේජී 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/11221 ලාකෝ අශෝක රීඑම්එල් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/308188 ලාකෝ කුමාර වයිඑම්එස් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/302311 කෝප්‍රල් ගුණවර්ධන එච්එම්ජ් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/14151 සැරයන් ශිරාන්කුමාර යූකේ 97.10.29 දින ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මාන්කුලම් ඔලුවවු ප්‍රදේශයේ දී මියයන ලදීග

සෙ/125651 ලාකෝ ජයරත්න බීඒඑන් 97.10.05 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/306305 ලාකෝ නානායක්කාර එල්ඩී 97.09.27 තැදුන්කේනි හිදී මියයන ලදී.

සෙ/302277 ලාකෝ සමරසිංහ ජීඑච්පීජී 97.10.06 දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/11412 බනි 1 ඩබ්ලියුඑම්එම් අබේසේකර 97.10.07 වන දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/11590 සැරයන් සිරිසෝම ජේකේඩී 97.10.07 වන දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/301270 සැරයන් ගුණසේකර එල්පීජීපී 97.10.07 වන දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/302334 කෝප්‍රල් වයසර්ධන පී 97.10.07 වන දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/306254 ලාකෝ කරවිට කේඑස් 97.10.07 වන දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/306392 ලාකෝ දයාරත්න ඩබ්ජ් 97.10.07 වන දින කතකරායකුලම් හිදී මියයන ලදී.

සෙ/14569 සැරයන් දිසානායක එච්බී 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/301053 සැරයන් සරත්චන්ද්‍ර ආර්ඩී 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/14817 කෝප්‍රල් ජයතිලක ඊ 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/302280 කෝප්‍රල් ධනසූරිය ඩබ්එම්ඩී 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/303490 ලාකෝ කරුණාරත්න කේජී 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/305095 ලාකෝ ජයරත්න ජේපී 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/308428 ලාකෝ උපතිස්ස එන්එම් 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/122207 ලාකෝ උපුල් ධර්මවංශ එන්ජී 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/122408 ලාකෝ ලක්ෂ්මන් ගුණවර්ධන එච්එම් 97.10.05 වන දින කතකරායකුලම් හිදී අතුරුදහන් වන ලදී.

සෙ/127652 ලාකෝ ඩිලුෂන් රොඩ්නි ටීඑම් 97.10.15 වන දින පුලියන්කුලම් අයිලඩි හිදී මියයන ලදී.

සෙ/127627 ලාකෝ චමින්ද ජයකාන්ත ජී 97.12.04 මන්නකුලම්

නි/61566 මේජර් එස්ටීඑස් දහනායක, ශ්‍රීලපාහ 97.10.05 කාතකරායකුම් හිදී මියයන ලදී.

1997/18/01 දින වන විට මෙමඒකකයට අයත් පහත නම් සඳහන් නි/සෙසු නිලයින් 'ජයසිකුරු' මෙහෙයුමේ දී මියයන ලදී.

නි/54496 2 දුති ඩීජී හේවාවිතුම ශ්‍රීලපාහ
සෙ/305892 සාසෙ සමන්ත ඩීජීජී
සෙ/308457 සාසෙ තිලකසිරි ඩීජේපී
සෙ/305760 සාසෙ බංඩාර එච්ආර්ජේ
සෙ/310176 සාසෙ ජේජ් මැතිව් ජේජ්
සෙ/123034 සාසෙ චමින්ද කුමාර පීටී
සෙ/126553 සාසෙ රොෂාන් එම්ජීඩී
සෙ/309765 සාසෙ චන්ද්‍රසිරි එච්ජ්

# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ සුහසාධක වෙළෙඳ සැල
# 1997.12.19 දින රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ විසින් විවෘත කරන ලදී



රෙජිමේන්තු සුහසාධක වෙළෙඳසැල විවෘත කිරීමට රෙජිමේන්තු
අධිපති ශ්‍රීලපාහ පැමිණි අවස්ථාව.



වෙළෙඳසැල විවෘත කිරීමට පෙර සංඝයා වහන්සේලා විසින්
සෙත්පතන අයුරු.



රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ විසින් පොල්තෙල් පහන දල්වා
වෙළෙඳසැල විවෘත කරන අවස්ථාව



වෙළෙඳ සැල විවෘත කිරීමෙන් අනතුරුව ලබා ගන්නා ලද භාණ්ඩ
වෙනුවෙන් බිල්පත් රෙජිමේන්තු අධිපති විසින් පරීක්ෂාකරන අයුරු.



රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ හා රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහ
විසින් වෙළෙඳසැලේ කුලුබඩු වර්ග පරීක්ෂා කරන අයුරු




රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ හා රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහ
විසින් විදුලි උපකරණ පරීක්ෂා කරන අවස්ථාව.

## 1997 දෙසැම්බර් 31 නිලධාරී නිවස්නයේ පැවැති රාත්‍රී භෝජන සංග්‍රහයේ විශේෂ අවස්ථාවල දී ගන්නා ලද ඡායාරූප













# අතීතයෙන් බිඳක් අපේ දිවියට

1815 මාර්තු 02 වෙනිද මහනුවර මගුල් මඩුවේදී සිදුවූ උඩරට ගිවිසුමෙන් පසුව එතක් නිදහස් දේශයක්ව තිබූ ශ්‍රී ලංකාව හිරුනොබසින අධිරාජ්‍යයේ යටත් විජිතයක් බවට පත්විය. මේ මගින් ශ්‍රී ලංකාවේ මහ රජු හැටියට බ්‍රිතාන්‍ය මහරජු පිළිගන්නා ලදී. නමුත් ඉංග්‍රීසීන් එම ගිවිසුමට අනුව ක්‍රියා නොකළ බැවින් එයට උරන වූ රදලවරුන් කීප දෙනෙක් කන්ද උඩරට සිටියේය. ඒ අය අතර මොණරවිල, කැප්පොටිපොළ, පිළිමතලව්වේ, මඩුගල්ලේ, ඇහැලේපොල වැනි අධිකාරම්වරු කැපී පෙනුනි. මෙහි දී මා එක අදහසක් සඳහන් කරනු කැමැත්තෙමි. සිහල දේශයේ නිදහස ගිලිහී යෑමට තුඩුදුන් එක හේතුවක් වශයෙන් එකල කන්ද උඩරට රදල පෙළපත් අතර, ඇති වී තිබුනා වූ නොයෙක් මත බේදයන් ගත හැක. එසේවීමට හේතු සඳහනක් විදිහට කන්ද උඩරට පාලනය කළ ඉන්දියාවේ වඩිග පරපුරට අයත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ අත්තනෝමතික කෲර පාලනය උපුටා දැක්විය හැකිය. මෙයින් දැඩි කනස්සල්ලට පත් උඩරට රදළ පැලැන්තිය බ්‍රිතාන්‍ය පාලනය තෝරා ගනු ලැබුවා විය හැක. කාරණය එසේ වුවත් එම පැලැන්ති තුල ස්වදේශතාරාගය සිතේ තැන්පත්ව තිබූ පාලකයන් නොසිටියා නොවෙයි. භූගතව තිබෙන යම් විෂබීජයක් වර්ෂාවක් ලද සැනින් දලුලා වැඩෙන්නා සේ ස්වදේශානුරාගය නමැති ජලයෙන් පරිපූර්ණ සාගර බඳු බුද්ධි මහිමයන් හිමි නායකයන්ගේ වදන් හමුවේ සිත් සතන් තුල තැන්පත්ව තිබෙන්නා වූ එම උතුම් අදහස් දලුලා වැඩී අතු පතර සිසාරා මාතෘ භූමියට සෙවණ දුන්නේ ය. මෙයට හොඳ නිදසුනක් ලෙස මොණරවිල කැප්පෙටිපොල අදිකාරම් තුමා ගත හැක.

එද බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඌව දිසාවේ අධිකාරම් තනතුරක් හෙබවූ කැප්පෙටිපොල අධිකාරම් තුමා හට 1818 ඌව පළාතේ ඉංග්‍රීසීන් හට විරුද්ධ වූ කැරැල්ලක් මැඩීමේ කාර්ය පැවරී තබුණි. ඒ අනුව 1818 නොවැම්බර් 01 වෙනිද ඉංග්‍රීසි සේනාංකයක් සමග එම කැරැල්ල මැඩීමට ඌව අළුපොත ප්‍රදේශයට ගියේ ය. එහි දී එම කැරැල්ල මෙහෙයවූ නායකයෙකුව සිටි හුටැවේ රටේ රාල විසින් රටත් ජාතියත් නිර්මල බුදු දහමත් රැක ගැනීම සඳහා කරන ලද දේශානුරාගීය ඉල්ලීම නිසා පැහැදුණු කැප්පොටිගොළ නිලමේ තුමා ඉංග්‍රීසි සේනාව ඔවුන් සතු අවි ආයුධ සහිතව ආපසු කන්ද උඩරට බලා හරවා එවන ලදී. මෙතුමාණන් ඉංග්‍රීසින් සතු අවි ආයුධ වලින් ඔවුන් සමග යුධ වැදීම දීන නිවට ක්‍රියාවක් සේ සිතුවේය. එයින් අපට මොනවට පැහැදිලි වන කරුණක් නම් පෙර දවස සිටි අපේ වීර නායකයන් තුළ වූ සර්ව සාධාරණත්වය සහ අසහාය රණශූරත්වය ණය නමුත් අප විද්වතුන් පෙන්වා දෙන කරුණු අනුව අපට පැහැදිලි වන්නේ රදලයන් අතලොස්සක් අතර වූ අසමගියත් පෙලක් නායකයන්ගේ අක්‍රමවත් සැලසුම් නිසාත් කන්ද උඩරට ඉංග්‍රීසීන්ට යටත් නොවූ ප්‍රදේශ ගණනාවක් 1818 කැරැල්ලේ පසු ඔවුන් අතට පත්විය යන්නයි. මින්පසු ඇහැලේපොළ කොහුකුඹුරේ රටේ රාල ද ඉංග්‍රීසීන් විසින් අත් අඩංගුවට ගත් අතර, කැප්පොටිගොළ නිළමේ ඇතුලු අධිකාරම් වරුන් කීපදෙනෙකුට උඩ රටින් පලාගොසේ වහන් වී සිටීමට සිදු විය.

පැරණි පත පොතෙහි සඳහන් වන පරිදි වර්ථමාන අනුරාධපුරය දිස්ත්‍රික්කය පෙර දවස කලාපීය නමිනුයි ගැමියන් ව්‍යවහාර කර ඇත්තේ කලාපයට යොදුන් 10 බස්නාහිරින් පිහිටි කහල්ල කඳුයාය අවසන් වන්නේ මාතලේ දේවහුව ප්‍රදේශයෙනි. එකල කැප්පොටිපොළ නිළමේ වරුන්ගේ අක්කා කෙනෙක් විවාහ ගිවිස ගෙන ජීවත් වී ඇත්තේ එම ප්‍රදේශයේ පරවාගම යන ග්‍රාමයේ ය. අතීතයේ එය වඩිගමංගාව යන නමින් හඳුන්වා ඇත. මෙම ප්‍රදේශය ස්වාභාවික දර්ගයන්ගෙන් පොහොසත් වූ ඉතාමත් ආරක්ෂාකාරී ප්‍රදේශයකි. තවද එම ප්‍රදේශයේ ගම්නායකව සිට ඇත්තේ කැප්පෙටිපොළ නිළමේ තුමාගේ මස්සිනා ය. එබැවින් එම ප්‍රදේශය මොවුන්ට ජීවත්වීම සඳහා ඉතාමත් ආරක්ෂාකාරී ප්‍රදේශයක් වුණි. කැප්පෙටිපොළ මඩුගල්ලේ පිළිමතලාවේ යන අධිකාරම් වරු සේනාංක දෙකකුත් සමග පැනවිත් ගම්වාසීන්ගේ දැඩි රැකවල් මැද මේ ගමේ ජීවත් වී ඇත.

පෙර රජ දවස පටන් අපේ රටේ වෙළඳ කටයුතු සඳහා මුස්ලිම්වරු මහත් ප්‍රසිද්ධියක් උසුලා තිබේ. මේ ග්‍රාමයට ද මුස්ලිම් වෙළෙන්දෙක් නිතර දෙවේලේ වෙළඳම සඳහා පැමිණ තිබෙනවා. මේ යොනකයා මාර්ගයේ කැප්පොටිපොල නිළමේ ඇතුලු පිරිස පිළිබඳව හෝඩුවාව ඉංග්‍රීසීන් අතට පත් වූ බවත් පැරණි ගම්වාසීන්ගේ තොරතුරු වලින් එළිදරුවුවේ, කාරණය කෙසේ වුවත් බ්‍රිතාන්‍ය පාලනයත් විසින් කපිතන් ඔනිල්ගේ ප්‍රධානත්වයෙන් යුත් ඉංග්‍රීසි සේනාංක 03 ක් තුන් පැත්තෙන් මෙම පරවාහ ගමට පිටත්කර එවා තිබෙනවා. දින ගණනක ගමනකින් පසු කපිතන් ඔනිල්ගේ පිරිස තුන් පැත්තකින් ගම වටකර පළමුවෙන් කැප්පෙටිපොළ නිළමේ තුමාගේ මස්සිනා වන ගමනායක තැන අත් අඩංගුවට ගත් අතර, ඒ අවස්ථාවේ ගැමියන්ගේ ආධාර ඇතිව මඩුගල්ලේ ඇතුලු නායකයන් කීපදෙනෙකු පැන ගියත් අසනීප තත්ත්වයෙන් පසු වූ පිළිමතලාවේ තනිකර පැන යෑම එතුමාට කිසිසේත් කළ නොහැකි ක්‍රියාවක් විය. මෙය අපගේ සෙබළ දිවියට හොඳම පාඩමක් විදියට අපට ගත හැක. මන්දයත් යුධ පිටියේ දී අපේ සහෝදර සෙබලුන් උපද්‍රව වලට ලක්වී අසරණ වන අවස්ථා එමටයි. එවැනි අවස්ථාවලදී අපිද කිසි විටෙකත් ඔවුන් තනිකර පලා නොයා යුතුයි. නමුත් අතීතයේ සේ වර්ථමානයෙන් යම් අවස්ථාවල පැනයන නිවටයින් නොසිටිනවා නොවේ. නමුත් අපි එසේ නොකරන්න වග බලාගත යුතුයි. මේ මගින් මා අදහස් කරන්නේ අප සෙබළන්තුල එවැනි උදර හැඟීම පෝෂණය කිරීමයි. කරුණ එසේ වෙද්දී ඉංග්‍රීසි සේනාව ඉදිරියට පැමිණ කැප්පෙටිපොළ මහාඅධිකාරම් තුමා තමා කැප්පොටිපොළ ලෙස හඳුන්වාදී අහිංසක ගම් නායකයා අතහරින ලෙස ඉල්ලා සිටියේ ය. වර්ෂ 1818 ඔක්තෝබර් 28 දින මේ ශ්‍රේෂ්ඨ වීර කැප්පෙටිපොළ වීරයා සතුරන් අතට පත් වූ අතර, කැප්පෙටිපොළ සහ පිළිමතලාව යන දෙදෙනා ඉංග්‍රීසීන් විසින් මහ නුවරට ගෙන යන ලදී. 1818 නොවැම්බර් 01 දින යුද්ධාධිකරණය කදී නඩු විභාග කළ අතර, කතරගම මහබෙත්ගම නමැත්තෙකු කැප්පෙටිපොළ අධිකාරිට විරුද්ධව සාක්ෂිදී ඇති අතර, නීතියේ සාධාරණත්වය කෙසේ වෙතත් ඉංග්‍රීසීන් මෙතුවා වැරදිකරු කරන ලදී. ඒ අනුව 1818 නොවැම්බර් 26 වෙනිද බෝගම්බර දී උතුම් වීරයාගේ ගෙල සිඳ ජීවිතක්ෂයට පත් කළේය. බ්‍රිතාන්‍ය පාලකයන් තුළ මේ උදර විරුවා කෙරේ මහත් ගෞරවයක් සහ බියක් තිබුණේ ය. එහෙයින් ඔවුන් මෙතුමාණන්ගේ සිරස කෞතුක වස්තුවක් හැටියට බ්‍රිතාන්‍යයට රැගෙන යනව ලදී. පසු කාලයකදී මේ උතුම් මිනිසාගේ සිරස අපට ලබා දෙනු ලැබුවත් එය අපට අද දැක ගැනීමට හැකියාවක් නැහැ. ඒ මන්ද යත් මහනුවර මහ මළුවේ ස්ථම්භයක් යට සහවා තැබීම නිසයි. එද ඉංග්‍රීසීන් පවා මහත් බියක් දැක්වූ කෞතුක වස්තුවක් විදිහට ගරුකල අප සිංහල දේශප්‍රේමියාගේ සිරස වත් අපට අද දැක ගැනීමට නොහැකිවීම සිංහල අපට මහත් සෝකයට කරුණකි.

මේ උදර දේශප්‍රේමී රණ සූරයාන්ගේ ජීවන කථා කොටසෙන් පාබල සෙබලුන් වන අපට උගත හැකි වැදගත් පාඩම් කීපයක් ඇත. එවැනි දෙයින් අප පෝෂණය වුවහොත් ඔබෙන් මගේ මාතෘ භූමිය සද ඒකීයව පවතිනවා නිසැකය. එද ගිලිහුණු නිදහස මෙද ගිලිහෙන්න නොදී අප අත්වැල් බැඳගෙන සේවය කරමු.

**නි/65016**
**2 ලුතිතන් ඩබ්ජේසී වගසෙනවි**




සැකසුම:

මේජර් ඩීඑම් විජේරත්න ශ්‍රීලපාහ


ගිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "තල් අරඹේ සිට" වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "තල් අරඹේ සිට", වයිට් හැකල් සඟරාව, රෙම ශ්‍රීලපාහ, හමුද ජනපදය, පනාගොඩ

## බිඳුණු පෙම

උදුවප් සීතලේ ගැහෙමින් ගණ කැලය  මැද
සිත තුල සිහින දකිමින් හෙට ගැනත්  අද
තරුණ වියේ රකිමින් බංකරය  අද
සුපුරු රිය පහත් විය දහසක් පැතුම්  මැද

සිතනා විලස මා යන මග වෙනස්  කර
යන්නට සිතුවේ කැන්ද ඇය මගේ  කර
එනමුදු නොහැකි දෛවය ගෙන වෙනස්  කර
සුපුරුදු අවිය අත ඇත ඇය දුරස්  කර

පෙතනා පැතුම් සුළහට මුසු වුනා  වේ
සොඳුරු රියක් බංකරයක තනි වුනා  වේ
දුක සැප දෙකම එක ලෙස හමු වුනා  වේ
නිසලබිමක පත්නල රැඳ වුනා  වේ.


සෙ/304534
කෝප්‍රල් ස්ටීවන් කේපී
8 ශ්‍රීලපාහ "සී" කණ්ඩායම


## වැලි කතරේ යුධ ගිනි නිවේවා

සම්බුදු දහම තුන් ලොවම එකට  බෙද
ලොව්තුරු දහම ගෙන දුන්නේ අපට  එද
ඒ දහමතේ නිග්‍රාහ කර සතුරෝ  මෙද
අප හා සටන් වැදුනේ ඇයි ඔවුන්  සද

දෙමාපියන් හට තම පුතු අහිමි  වුනා
බිරින්දවරුන් හට සැමියා අහිමි  වුනා
දූ දරුවන්ට පිය සෙනෙහස අහිමි  වුනා
ලක් මැණියන් හට විරුවන් අහිමි  වුනා

සසරේසරන තුරු සතුරන් නැති  වේවා
මිතුරු දමින් සැම එදන එකමුතු  වේවා
මියගිය විරු සෙබලූ සැමදෙන  ඉපදේවා
ශ්‍රී දළද සමිඳු සෙබලුන් රැක  දේවා


සෙ/14829
ලාකෝ කරුණාරත්න කේආර්පීආර්කේ
"ඩී කණ්ඩායම 4 ශ්‍රීලපාහ



## ඇය හමු නොවූ නිවාඩුව

සතුරනි ඔබ එපා එන්න
මාත් සමග යුද වදින්න
ඇයගෙ සෙනෙහෙ බිඳක් නැති
වෙහෙසයි මම හා ගැටෙන්න
ඇගේ සිනහ පොදක් නැතිව
දරා ගන්න බැහැ පාළුව

ඇයගේ මුදු වදන් නොමැතිව
ගොවා දමා දින කිහිපය
ආවෙමි යළි යුද බිම වෙත
ගිනි ගන්නා සිත සමගින
ගිනි අවියත් තව ඇය ලඟ
වෙඩි පහරට හානවි නොවන

යකඩ හදවත ඇය උදුරාගෙන
ඇයගේ උපදෙසක් නොමැතිව
කෙලෙස ද මම යුද වදින්නෙ


2/ ලුතිතන් තිරිඳු වීරසිංහ 2 ශ්‍රීලපාහ
බුද්ධි නිලධාරී වව්නතිව්




# සෙබළ හිමියනි නුඹට කියමි

සිය වසරක් පෙමින් වෙලී
මා නුඹ හඳුනා ගනිතත්
නුඹේ සිතේ පවතින ද
නොහැකිය හඳුනා ගන්නට
දෙමාපියන් නෑ මිතුරන්
අකමැත්තෙන් සිටි දිනය ද
යළි මිතුරුව අපේ පෙමට
ආශිංසන පැතූ දිනය ද
ඉවත් නොයේ මගේ සිතින්...
එහෙත් මගේ හිමියනි මෙය
සිතට ගනුව මෙය දුටු දින
මා මැරි මැරි ඉපදෙන්නෙමි
නුඹ යන විට උතුරුකරට
මා දන් නුඹෙ යශෝදරා
නුඹ සිදුහත් නොව කිසම්ද
නුඹගේ දන රට රකින්ට
මා බිළිවිය රෝග බියට...
මගේ මව හා පියාණන්ට
මගෙ සොහොයුරු සොයුරිය හට
සරණ වුනේ මා පමණයි
එහෙත්... එතැන මා මියැදී
සුදු සේලෙන් සැරසී මා
'එක් දිනකදී නුඹ අසලදී
පණ ලද්දෙම් පතිනිය වී..
අදහනු මෙය හිමි සඳුනේ
මගෙ කුස අද බරවිලා
නුඹේ ලෙයින් පොඩි බිළිදෙක්
මා කුස තුළ හැවීලා
එනමුදු නැත මට පෙම්වත
මසතුටක් මේ දිවිය තුලින්
මගෙ ලෝකය අහල් වැටී
සිඳලනු ඇත මගෙ ජීවය...
පෙම්වත මේ බව සිතන්න
ලෙඩ සයනෙයෙ මා සිටියදී
කවුරුත් නැත අත පොවන්න...
මේ සයෙනෙ මියැදුනමුත්
දැකිය නොහැක නුඹට මාව
ශ්වේතයෙන් වැසෙන්ට පෙර...
සමාජයට කිව නොහැකිය
මා සිදුවන කිසිදු දෙයක්
එසේ හෙයින් මා පෙම්වත
සමුගනිතත් මා මෙලොවින්
නැවෙනු එපා නුඹ කිසි දින....

සෙබල බිරිඳ
කේ. ඇම්. සුනීතා චන්ද්‍රලතා
663/කටුපොත පල්ලම, හලාවත

# සෙබළ බිරිඳගේ හදින්

ලොවම නිදන මේ සණදුරු නිශාවට
රන් පුතු ගනි නිදි කුමරිය තුරුල්ලට
පාටට හුදකලාවේ මා සිටින විට
හිමියනි නැගෙනයි සිතුවිලි මට ඔබෙ නමට

සුමට සුරතල් දෙ අතේ ගිනි අවිය රැදෙනවද?
භයංකර රාත්‍රිය කපක් සේ ගෙවෙනව ද?
පිං පිරූ අහිංසකයි, යුද පිටියේ වෙසෙනව ද?
අසිරිමත් යොවුන් විය කටුක ලෙස ගෙවනවද?

ගහනක මිහිමව් ද නුඹ ගුණ ගී ගයාවි
එඩිතර වීරයෙකු ලෙස කල් ගෙවාවි
තෙරුවන් බලෙන් ඔබ දිගු කල් වැජඹේවි
සතර වරම් දෙවි ඔබ නිති රකිම්

නිශාන්ති ප්‍රියංකර
මහ/අලවලාවල
හත්දෙස්ස

# ආදර මගේ අම්මේ

මා කුඩා කළ සීතලට තුරුළුවුවත්
ඔබේ සෙනෙහසට
ආදර අම්මෙ...
අද මා ඒ උණුසුම ලබන්නේ
ගිනි අවියෙහි සිත් පිත් නොමැති
ගියාට තිවාඩුවක් නොමැත
ඔබේ සෙනෙහස ලබන්නට ඔබේ දෙපා
නමදින්නට වරම්...
මන්ද ඔබ දුර රටකය
වසර තුනක් තිස්සේ හිතින් විඳිමි
වේදනා අහිමිව මව් සෙනෙහස
ඔබ උපන් දරු සෙනෙහස නමින්
ඔවුන් සුරකින්නට
ගියද - දුර රටකට...
ඔබේ පුතු උපන් දේශයේ නමින්
සුරකින්නට මතු පරපුරේ උරුමයන්
ආවා උතුරු යුධ බිමට
ආදර මගේ අම්මෙ....


සෙ/307870 සාසෙ සම්පත් ඒජීසී
6 ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම

# ලක් බිම සුරකින වීර සොහොයුරෝ

සීතල දිය ඇලි කෙත් වතු කඳු වැටි
උපන්න මව් බිම සිහි කරලා
ජාතිය ආගම දේශය පිළිබඳ
එඩිතර හැඟුමන් පුබුදලා
වීර පරපුරේ සිංහල රුධිරය
මව් බිම වෙනුවෙන් උණුවිලා
ඉපදුන මව් බිම නිති සුරකින්නයි
පෙරටම යන්නේ පාතබලා

ලක් බිම සුරකින වීර සොහායුරෝ
වනසයි සතුරන් වෙර දරලා
සිකුරුයි ජය වැඹ නුඹලට හෙ දින
පෙරටම යනු මැනි එඩි පාලා
සතුරන් බල බිඳ ජය ගොස පතුරා
එන දින රුදු අවි අත මුදලා
පිළිගනු ඇති ඔබ ලක්වැසි සැම ජන
දස අත කොඩි වැල් බන්දලා

සැරයන් තිස්ස චන්ද්‍රසේකර
මූලස්ථානය 5 - ශ්‍රීලපාහ
කුඹුරුපිටිය කදවුර ත්‍රිකුණාමලය




# අමරණීය සෙබලානණි

කල්පයක් මිහිමඩල
කම්පිතව සුසුම්ලන
සදකාලික ඉකිබිඳුම
ඔබගේ රුධිරයේ උනුහුමයි
සීතලට කිලිපොලන
සුවහසක් මිනිස් සඳ
සතපන්න සනසන්න
කැපවුණා නුඹේ යෞවනේ
නුඹේ සුසුම් බිඳ දූයේ ප්‍රාණයයි
ඔය කාකි නිල ඇඳුම
ගිනි අවිය රැඳි දත
අනේ මට සිප ගන්න ඇහැකිනම්
යුධ බිමේ නුඹ හෙලන
ා - බිඳුව ලේ කඳුල
ද සමත් මලකටත්
වඩා මට සුවඳ දේ
දේශයේ රැකවලාණනි

සෙ/305 200
ලා/කෝ නිරෝෂන් නානායක්කාර
7 ශ්‍රීලපාහ
ඩී කණ්ඩායම කිලිනොච්චිය

# තල් අරඹේ සිට ගී ගයනු එපා

තල්වැට අද්දර බංකරයේ
ලොවම නිදන රාත්‍රියේ
නිදිනොමැතිව ගිනි අවිමානා
මම ඉන්නාවිට උතුරුකරේ
මාහද පාලුව මකාදමන්නට
රැහැයියනේ ගී ගයනු එපා...
මට බෑ ඔබගේ ගීය අසන්නට
ගිනි අවි අතැතිව සෙබලු නසන්නට
කොටියන් ඇත අප සතර වටේ
මාමෙත් තනිවී පාලු සිතක් ඇත
නිදිනැති දෙනෙතින් දකුණු කරේ
මකා දමන්නට ඇගේ සිතේ දුක
ගී ගයන්න රැහැයියනේ....

සෙ/006 39
ලාකෝ සුනිල් කුමාර ඩබ්ජී.
9 ශ්‍රීලපාහ
ඩී කණ්ඩායම පුත්තූර් යාපනය

# දිවි දෙමි ඔබේ නමින්

මවුබිම රකින්නට දහවල් සමග රැයේ
තල් ගස් මායිමේ සේවයේ යෙදෙන පැයේ
නැහැ පස්සට එන්නේ
කොටි ගෙරවුමට බයේ
මරණය අකුරු හතරකි එය නොමත ලයේ

උතුරේ දකුනේ සාමය සහ ජීවනය
එය කරදීම අප යායුතු මාවතය
ඉඩ නොම දෙන නිසා සතුරා යාපනය
ලක් මෑණියගේ නමින් පුදනවා ජීවිතය

සෙ/125 6 31
අසේ චමින්ද කුමාර ඩබ්
10 ශ්‍රීලපාහම
පාලන කණ්ඩායම
4 වන මූලස්ථානය
වවුනියා

# තල් වැටේ මායිමේ

ජීවිතයේ සොඳුරුවිය යුද්ධයට කැපවෙලා
ජීවිතයේ පැතුම් මල් යුධ බිමට පරවෙලා...
සාමයේ පැතුම් මල් පුබුදන්න කැපවෙලා
අපි සැවොම තල් වැටේ මායිමේ තනිවෙලා
දෙමාපි සොහොයුරන් ගතින්
ඈප වෙන්වෙලා
රුදුරු වූ යුධ බිමට තුරුණු විය කැප
කළා...
තල්වැටේ බංකරේ පැතුම් මල් බොඳවෙලා
සාමයේ පරවියනි පියඹලා වරෙල්ලා

සෙ/305 200
ලා/කෝ නිරෝෂන් නානායක්කාර
7 ශ්‍රීලපාහ
ඩී කණ්ඩායම කිලිනොච්චිය

# තල් අරඹේ සිට

සැන්ද කලුවර වෙඩි හඬ ඇතින් එන්නේ
පාලුව කාන්සිය ඒ අතරින් එන්නේ
අනේ රැදි අවිය සටනට සැරසෙන්නේ
රුදුරු කොටි තොපේ අවසානය වෙන්නේ

යොවුන් අපේ හිත් මල් මෙන් මෙලකයි
ගිනි අවි අරන් පැන්නේ රටදැය රැක ගන්නයි
බැලූවත් අප දිහා නුහුරට එය වැරදියි
අවිහිංසකයි කොයි සෙබලත් එය ඇත්තයි

එක මව් සෙවෙනා වැඩෙනා ලක් දරුවන්ය
විරුවන් වෙලා රකිනවා මේ ලංකාව
මව්පිය සොයුරන් අමතක නැහැ අපට
නැති කර දමා කොටි රැල හිනහෙමු එකට

යුධ බිමේ මල් පිපි සුදු පරවි ඉගිලේවා
ලක් දෙරනේ යුධ සාපය යලි හිස නොඑසේවා
යුධ බියෙන් ගැනෙ සිත් සාමයෙන් ඉතිරේවා
නිදහසේ සාමයෙන් එකට අත් පැඅටලේවා

සෙ/308733
සාසෙ නන්දසිරි එම්ජීඑස්
11 වන ශ්‍රීලපාහ ඒ කණ්ඩායම අරියාල, යාපනය




# එන්නම් බුදු සමිඳ හෙට බත අහන්නට

පන්සල බුදු මැදුර දගැබ බෝ මළුව
සදහම් සිසිල නැත තවමත් ගොස් පහව
ගිලිහෙන විට දැසී සිහ ධජයේ රන් කඩුව
මව් බිම රැකගන්න යුධ අවි අත දරුව

බුද්ධ ධම්ම සහ රුවනින් සිත පැහැදී
ඩිටියා පෙර දිනේ බුදු සමිඳුන් නමැද
මව් බිම කඩන්නට කරමින් කොටි සද්ද
සමිඳුනි සතුරෝ මරණා එක පව් නැද්ද

සෙබලකු උනත් තිසරණ ගුණ මහද ලයේ
සිහියට එනවා බත ඇසූ හැටි තිහඩ පැයේ
උතුරේ ගෙවන දුක්බර හමුද දිවියේ
සමිඳුනි මල් පුදමි සැමද මු කුටියේ

රට දය සමය ජාතිය ආගමය ලද
සෙබලුන් සියලු දෙන මිනි පහනක් තේද
මව් බිම නමින් සටනට ගොස් දිවිය පුද
සමිඳුනි සෙබළුන්ට දෙව් ලොව ඉඩනැද්ද

දෘඩ අවි අරන් බැහැ බුදු බත අසන්නට
ඩ්දුවේ සැම දිනම සතුරන් නසන්නට
රණ බිම ජය අරන් සාමය පෙරටු කොට
එන්නම් බුදු සමිඳු හෙට බණ අහන්නට

සෙ/30716 8
සාසෙ තිලකරත්න අයිපී
15 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම (සංඥ අංශය)
පලෙයි - යාපනය

## 12 වන ශ්‍රී ලංකා පාබල හමුදවේ බී කණ්ඩායමේ සේවයේ යෙදී සිටියදී ජයසිකුරු ක්‍රියාත්විතයේ දී සදහටම අප අතරින් සමුගත් සෙ/300914 සැරයන් ගුණසේන එස්ප්පී වෙනුවෙන් අප හද පත්ලෙන් නැගෙන සෝ සුසුම්....

උදයට පිපෙන මල හවසට පරවෙනවා
ජීවිත ගමන මරතින් කෙලවර වෙනවා
ඉපදීමත් සමග මරණය හිමි වෙනවා
මෙය වලකන්න කිසි කෙනෙකුට බැරි වෙනවා

ඉතිසර දෙයක් මොලොවෙහි නැති බව ඇත්ත
එනිසයි සිදුවුනේ අද සිදුවියයුක්ත
එනමුත් අනේ දුක් ගින්නක් ගිනි ගත්ත
පාලුයි අහෝ අද මේ කඳවුර පැත්ත

නැගෙනහිරු බැසයයි - පිපෙන මල් පරවෙයි
වැටෙන පිණි වියලෙයි
ඒත් ඔබේ නම සද අමරණීයයි.....

සෙ/15 6 17 කෝප්‍රල් වීරකෝන් ඩබ්ඒසී
සෙ/30396 6 කෝප්‍රල් සමරසිංහ ආර්
අණ සහ පාලන කණ්ඩායම 12 ශ්‍රීලපාහ
යුද හමුද කඳවුර
කැබිතිගොල්ලෑව හරස් පාර
මැදවච්චිය

## සාමය උද කරමු

යුද්ධයක පැටලිලා...
සිටියා අයි නැගිටලා..
අවට සිරි නරඹලා

යමුද සාමයේ සයුරෙ පීනලා.....

කුරිරු වෙඩි හඬ අතරින්
ලේ කඳ ගලයි පොලොවෙන්...
මිනිසුනි මේක නිසැකයි...
වහා නෙරපමු මොලොවින්.....


සිහල ලේ නැති මිනිසුන්..
එන්න අප හා එක්වෙනලා....
මතු පරපුරට දෙමි අපි...
මේ පුංචි රට බේරලා...

සෙ/309205 සාසෙ සමන් කුමාර පීජීජීඑන්
අණ සහ පාලන කණ්ඩායම 12 ශ්‍රීලපාහ
කැබිතිගොල්ලෑව හරස් පාර.
මැදවච්චිය

## ඔහුගෙන් ඇයට හසුනක්

දයාබර සොයුරියේ...
ඔබෙන් සමුඅරන් අතැර - ගම්පියස
නෑදෑ හිත - මිතුරු කැල
ආවේ උතුරට රකින්නට නිජ බිම
දයාබර සොයුරියේ...
ප්‍රථම නිවාඩුව - ලැබුණු විගසින්
අවේ ගං වෙත - ඔබට දැකුමට
සිතේ සොම්නස් උපදවාගෙන
දයාබර මගේ සොයුරියේ....
නමුදු ඔබ වෙනෙකු අත ගෙන -
ගියේ ඇයි කියන් මා හට
දයාබර සොයුරියේ....
විරුවගේ සේවය නොදන්න
ඔබ වැනි අයෙක් වෙන් වී යාමම - මහත් සැපතකි
දයාබර සොයුරියේ.
අද නොව හෙට දින වැටහේ
විරුවගේ සේවය ඔබහට
සොයුරියේ...

සෙ/15 6 17කෝප්‍රල් වන්දන වීරකෝන් ඩබ්ඒ
අණ සහ පාලන කණ්ඩායම් 12 ශ්‍රීලපාහ
කැබිතිගොල්ලෑව හරස් පාර, මැදවච්චිය




# රණ කවි

පැල් කවි පතල් කවි කරත්ත කවි ජන කවි යන මේවාට ලක් ඉතිහාසයේ අත් වන්නේ ප්‍රධාන ස්ථානයකි. පැල් තුල කටුක දිවි පෙවෙතක් ගෙවන ගොවියා මෙන්ම මහ පොලව හාරමින් තම බඩ විය සුරකින්නට පතල් කරු සේම කරත්ත කරුද ගෙවනුයේ අන්ත දුක් බර ජීවිකාවකි. මේ නිසා ඔවුන්ගේ දුක කාන්සිය මාන්සිය මදක් හෝ තුනී කර ගැනීමට ඔවුන්ගේ මුවින් පත සතරකින් හෝ දෙකකින් යුත් කවි තායකට පිටවිණි. ඒ ඈත අතීතයේ ය.

එහෙත් එම කවි වලටත් වඩා අරුත්බර දුක්මුසු කවි සමූහයක් උතුරු කරයේ සෙබලෙකුගේ මුවින් පිට වේ. යුධ නීතියට අනුව තමන්ට තවෙකකුට කීමට නොහැකි දෙයක් කවියක් කොට බිත්ති මත සනිටුහන් කොට ඇති අයුරු උතුරට පා තබන ඕන කෙනෙකුට දකිය හැක. ජීවිතයත් මරණයත් අතර දෛනික රාජකරියේ නිරත සෙබලාගේ පිට වන මේ කවි ජන කවි මෙන්ම රණකවි ලෙස කලාත්මක සිත් තුල පැල පදියම් වෙනු ඇත. සෙබලෙකුගේ කටින් පිට වූ උපහාසය දුකගැබ්ව ඇති කවියක් මා ඇසූවේ මෙලෙසය ය.

ආවේ ලිපි කරු
දවල්ට කම් කරු
රෑට මුර කරු
උදේට වරද කරු

එක් ක්‍රියාන්විතයකට සහභාගී වූ සෙබල පිරිසක් නෑමට ගොස් ලිං අඩියේ වතුර නැමට සිදුවීම ගැන එක් සෙබලෙකුගේ කටින් පිට වූ කවියක් මෙසේ විය.

උඩ වතුර තරු වලට
මැද වතුර පටි වලට
මඩ වතුර අප සැම ට
කොටි ගහල මදි තොපට

**සෙ/304175**
**සාසෙ විරසිංහ යුබිඡ්**
**3 ශ්‍රීලංකා පාබල හමුදව**
**ඕ කණ්ඩායම**

## වසර පහක යුධ සේවය නිම වීද? හමුවීම, දැන හැඳින ගැනීම, ඉන් පසු වෙන්වීම, එය තමයි මිනිස් හදවතකට දැනෙන දුක් මුසුම තකාන්දරය

තරු කැට දිදුලන අහස් කුසට මැදි වෙලා පායාගෙන පැමිණි පුර හඳ වගේ ලස්සණට දිලිසුණු ඔබේ වත අද කොයිබද? ජීවිතයේ වසන්ත සමය කුරිරු යුධ බිමට කැප කරලා මේ රට ත්‍රස්තවාදීන්ගෙන් බේරා ගැනීමේ පරම අදිටනින් යුතුව වසර පහකට අධික කාලයක් පටන් ඔබ මෙම රටට සේවය කළ ද මගේ සඳදර රත්තරරත් කුමරුනි ඔබේ පරම අධිෂ්ඨානය ඉටු කිරීමට හැකි වුණි ද? 1997 වූ සැප්තැම්බර් මස 11 වන දින ඔබේ ඒ අධිෂ්ඨානය සහමුලින් සුණු විසුණු වුනිද? නෙදුන්කේනි ප්‍රදේශයේ දී ජයසිකුරු ක්‍රියාන්විතයේ දී ඔබ මගෙන් ද මුළු ලෝකයාගෙන් ද සමුගත්තා ද? නැතිනම් ඔබ ත්‍රස්තවාදීන් හට අසු වුණි ද? ඔබේ ඔය අතුරුදහන් වීම ගැන මා කෙළසක නම් සිත සනසා ගන්න ද?

දෙමාපිය සහෝදරයන් මෙන්ම මා ද ඔබ වෙනුවෙන් කඳුළු සලන වග ඔබ කොහෝ සිටිය ද දන්නා බව මා දනිමි. මේ රට ජාතිය වෙනුවෙන් ඔබේ රටක් වටින දිවිය පුද කෙරුවා නම් මා අවංකවම සතුටු වෙමි. ඒ නමුදු ඔබ කුරිරු ත්‍රස්තවාදීන්ට නම් අසුවෙන්න එපා මගේ රත්තරන් කුමරුනි. ඔබේ දිවියේ වටිනාම කාලය මෙය නොවේ ද? ඔබේ 25 වන උපන් දිනයට තිබුණේ තව හරියටම දින තුනක කාලයක් පමනි. එනම් 97 වූ සැප්තැම්බර් මස 14 වන දිනය. ඉතින් කුමරුනේ මේ ගැන සිතා මා කෙලෙසක නම් හිත වාවා ගන්න ද?

ඔබ මිය ගියේ යැයි සිතා අප ඔබ වෙනුවෙන් පිං කම් කළෙ ද? යම් මතු දිනයක ඔබ මා වෙත කෙසේ හෝ එනු ඇතැයි සිතමි. බාධක සියල්ල බිඳ දමාගෙන ඔබ මා වෙත ආ දිනයක අප ජය පැන් බොමු කුමරුනේ. ඔබ මා සමගින් හා අප අතරින් සදහටම සමුගත්තා නම් මෙවන් අකල් මරණයක් මතු උපදින කිසිම භාවයක නොම වේවා. අප අතරම ඉපදීවා. කුමරුනේ ඔබ වෙනුවෙන් ඔබ සඳ නොමැකෙන නාමය වෙනුවෙන් මා මෙම ලිපිය 'වයිට් හැකල් සහරාවට' යොමු කිරීමට අදහස් කලෙමු. මා නිරතුරුවම බලාපොරොත්තු වෙනවා ඔබ වැනි වීර සෙබලෙකුගේ මෙම පිය සටහන මෙම සහරාව තුල පල වී නොමැකෙන නාමයක් ලබ දේවි කියා. එයයි මා හට ඔබේ නාමය වෙනුවෙන් කළ හැකි උතුම්ම පරිත්‍යාගය. සඳ ඔබ වෙනුවෙන් බලා හිදිමි මා

මෙයට ඔබේම සඳදරණීය නැගණිය


**ශ්‍රියාණි**
**අනුරාධපුර**

## රණ බිමේ සිටින මගේ ආයාචනයයි

ඔබගේ පෙම් පැතුම් ඉටුවන මොහොතේ දේශයේ දස දහස් මව්වරුන්ගේ පියවරුන්ගේ පැතුම් මධ්‍යයේ රටටම මහත් පිලිලයක් වූ කුරිරු යුද්ධය ජය ගන්නා අධිෂ්ඨානයෙන් අද රණබිම මතට පය තබන මා ඔබෙත් සමුගත් මගේ හදවතට ලං වූ මිත්‍රයා රුදුරු ගිණි අවියක් වේ යැයි මා කිසි විටෙකත් නොසිතුවෙමි. එහෙත් මා මිතුරු සෙනෙහසින් ඒ ගිනි අවිය වැළඳ ගරුතිමි.

යම් දිනෙක මා මිතුරු ගිනි අවියකින් මා ලය සිදුරු වී මගේ රුධිරයෙන් ලක් පොළව සේදී මා සුසුම් රණ බිමේ උණුසුම් සුසුම්වලට මුසුවී ගියත් මා එය රට දැය වෙනුවෙන් මව්පිය සහෝදර සහෝදරියන් වෙනුවෙන් එකම අධිෂ්ඨානයෙන් යුතුව සතුටින් බාරගන්නෙමි.

**සෙ/307949**
**සරත් කුමාර ආර්එම්යූ**
**8 ශ්‍රීලපාහ අලිමංකඩ**




# හැම වරදකම සාධාරණ පැත්තක් තිබේ

සෙබල සොයුරන් වෙත මෙය ලියන මාත් කියවන ඔබ අතිනුත් සමාජයට වැරදි සිදුවේ. සෙබලුන් වන අප සහ සිවිල් දමිල ජනතාව අතින් අපෙන් ඔවුන්ට ද ඔවුන්ගෙන් අපට ද වැරදි සිදුවේ. ඒ සිදුවන සෑමවරදකම සාධාරණ පැත්තක් ද ඇත.

අන් අය අතින් සිදුවන වරදෙහි සාධාරණ පැත්ත පිළිබඳව සිතන්න පුලුවන්නම් ඔබ සමජයට මොන තරම් ආදර්ශමත් සාධාරණ සොල්දදුවෙක් වෙනවා ඇත්ද?

යම් අයෙක් වරදක් කල විට එම වරදට දඬුවම් දීමට ප්‍රථම එම වරද කිරීමට තුඩු දුන් කරුනු සොයා බලන්නේ නම්, එම වරදෙහි සාධාරණ පැත්ත ඔබට පෙනෙනු ඇත. සමාජයේ සාධාරණව ජිවත් වන ඔබට ඔබ අතින් වරදක් සිදුවූ විට දී ද අන් අය ඔබට ද අනුකම්පාවක් දක්වනු ඇත.

සෙ/00667
සේනාරත්න කේ
14. ශ්‍රීලපාහ, බී කණ්ඩායම, කයිට්ස්, යාපනය

# හිරුට දැනෙනව ද මේ දුක සඳුට දැනෙනව ද යුධ පිටියක ගෙවනා දුක ඔබට දැනෙනවද

දයාබර මධුට

දිනය අප්‍රේල් 20 වැනිදය. දහසකුත් එකක් පැතුමන් හදවතේ රුවා ගෙන යුග දිවියක චමත්කාර බව හොඳින් දූත. ජීවිතයේ සුන්දරම අවදිය පෙම්බැදි සිතින් කාලාන්තරයක් තිස්සේ පෙම්කල තම් පෙම්වතා සමග හොර රහසේම පැමිණියේ ලස්සන අනාගතයකට හිමිකම් කියමින් සුන්දර පවුල් ජීවිතයක් ගෙවන්නය. ඒත් දෙවියනි මම යුධ සෙබලෙක් ජීවිතය ප්‍රශ්න පත්‍රයක් වුනාට ඔබගේ ආදරය සෙනෙහස සමග ඔයා මා අභියස නිතර නිතර මැවුනට මට ඔයා ගැන සිතන්න තියෙන කාලය කොපමණ හීනවෙලාද යුධ ගිනි දූල් සතර වටින් දල්වෙද්දී මම ඔයා නාමයෙන් කොපමන දුක්වෙනවද සමහර විට ඔයා හිතනව ඇති මම ගෙනත් හිරකරලා මට දූන් කිසිම පිළිසරණක් නැහැ. මධූ ඔයා එහෙම හිතන්න එපා. යුධ සෙබලෙක් වශටයෙන් මට කොපමණ වගකීමක් පැවරිලාද. ඒත් ඔයාට තියෙන සෙනෙහස ආදරය බිඳුවක් වත් අඩු නැහැ. පළමු අභිලාසය රට රැකුම වුවත් ඔයා ද රකින්නෙමි පණසේ.

අනේ දෙවියනි මම යුධ පිටියක ගෙවනා දුක හිරුට සඳුටවත් නොපෙනේ ද මධූ හිරු සඳු දෙකම නොදූක්කත් ඔයා දකිනව ඇති කියලය මට හිතෙන්නෙ ඉතිං දයාබර මධූ ඔයා දක්වෙන්න එපා. රට වෙනුවෙන් ජිවය කැපකර රටට සේවය කරනවා මියගිය දිනක් ඔයා දුක් නොවන්න නොසෙලන්න ඔබේ කඳුලු කැට සැනසෙන්න එදට රට නිදහස උදෙසා දිවිදුන් ඔබේම පෙම්වතා ගැන කෙදිනක හෝ සාමයේ සුදු මල් පියලි උඩ සුදු පරවියන් ලැගුම් ගන්නා දිනට ඔබේ පෙම්වතා සිහිකරන්න සැනසෙන්න පෙම්බස් දෙඩා හිරු සඳ පායන මේ ලෝකේ සාමය ඉක්මනින් ගලා ඒවි ඔබද ප්‍රාර්ථනා කරන්න සාමය ලැබෙන්න කියා.

සේන

සෙ/302639 සාසෙ සිරිසේන ඩීඑම්
7 ශ්‍රීලපාහ, ආධාරක කණ්ඩායම,
නුවරපාර, කිලිනොච්චිය

# යුද්ධයේ නිමාව

සුදු ඇඳුමින් සැරසී එද
පොත් මිටියක් අතැතිව එද
පාසල් ගියේ අපිත් එකට එද දවස
කාකි ඇඳුම ගත දවටා අද
ගල් තොප්පිය හිසලා අද
ගිනි අවියක් අතැතිව අද
යුද්ධෙට ගියේ අපිත් එකට අද දවසේ
යුද්ධය නිම කරන දිනේ
සාමය රජ කරන දිනෙක
ඔබ බලන්න මා එන්නම්
ආදර මගේ පියතුමනි
මතු සසරේ දිනකදී යලි...

සෙ/304797
ලා/කෝ දිසානායක එන්ජිඑස්.
7.ශ්‍රීලපාහ - පාලන කණ්ඩායම, නුවර පාර,
කිලිනොච්චිය.

# ප්‍රියයානණෝ...

දෙවියන් විසින් දුන් පඩුරක් ලෙසින්
පියානණේ ඔබ සුරකිමි බැතින්
කළලේ උපන් කොඳ මල් කැල්
පොපියා සිසිල් පින්නෙන් දෙවූ
තිරිඳුන් ඔබයි පියාණනේ....

රණ බිම බැදි සතුරන් දිනා
වියවුල් නැසූ විජිතය මගේ
තිරිඳුන් ඔබයි පියාණනේ
දෙවයන් විසින් දුන් පඩුරක් ලෙසින්
පියාණනේ ඔබ සුරකිමි බැතින්...

සෙ/305420
සාස දිසානායක ඩී.එම්.ඒපී
1 ශ්‍රීලපාහ, "සී" කණඩායම
යුධ හමුද කඳවුර - ගඩබාපුර


# යුධ බිමෙන් නංගීට

තරුකැට මිලින ගගනත අඳුරුයි රැට
සිත කළබලයි ඇසෙනා රුදු වෙඩි හඬට
සුසුමන් නැගෙයි දූනෙනා විට දුක සිතට
කටුකයි ජීවිතය කඳුලින් පවසමි ඔබට

සන තල් අරණෙ තනිකම සිත පෙළෙනවිට
සෙනෙහස සොයා සිත ඉලගිලෙයි දුරු ඉමට
අපිදූර වැඩියි සිතරහසින් කියන විට
ඉකිලන සිතේ දුක පවසන්න ද කාට

සිත දුරගියා ආවා යලි මා ළහට
ලහ ලහ වගේ දූනුනා ඔබ සුවඳ මට
නෙත් දෙක පියා ගත්තත් දෙනෙත් කඳුළු කැට
සිහිනෙක වත් සැහවිලා නංගියෙ එන්න මා ලහට

සෙ/309765
සාසෙ චන්ද්‍රසිරි එච්ඒ
6 ශ්‍රීලපාහ, ඒ, කණ්ඩායම, වව්නියාව




# සොයුරණේ

මව්බිම රකිනුයේ තම මුල් යුතුකමය සිතන්
යුධබිමට ගොස් සටනින් ජයගෙන ඒම සිතන්
සමහරු සැප විඳිති මව්බිමේ සටනක් නැතිය සිතන්
තව කෙනෙකුන් සිටි යුද්ධය විහිළුවකි සිතන්

උන් සැප විඳිනුයේ සොහොයුරනි නුඹ නිසානේ
ඇයිද? උනුන් සටන් වදින නුඹලා ගැන නොසිතන්නේ
රටේ සිටින උගතුන් නැත උතුරක් ගැන සිතන්නේ
දේශපාලනේ ඇදගෙන රට මැද යුද්ධ කරන්නේ

තමන් කළයුතු යුතුමකය සිතා යුද්දෙට ගිය සොයුරන්නේ
අපගේ මවබිම වෙනුවෙන් දිවි පුද රට රකිනා සොයුරනේ
දහට එකෙකි යුද්ධය ගැන සිත හද උණු කරගන්නේ
ඒ උත්තමයන් ය ඔබ හට මේ ශක්තිය ධෛර්ය ජය පතන්නේ

ගිනි අවිය අත දරන්
දෙනෙත සිය අත සොයුරන්
තල් වැට අරඹේ සිටින
අපේ දයාබර සොහොයුරන්
රට දූය දෙකඩ නොකරන්
ගිය සොහොයුරන්..
යුධ පිටිය ගිනි අරන්
ඒ ගිනි නිවලා
රට එක්සේසත්
කරන්නට .....
උතුරට ගිය
සොහොයුරන්
ජය මාවතේ කෙළවර
සිංහ ධජය ලෙලලන්නට
උදර වූ අයියලාට - ශක්තිය ධෛර්ය මා පතන්නෙමි.

**අනුෂා මල්ලවආරච්චි**
97 උසස්පෙළ කලා අංශය, 14 වසර
කෑ/වර/අල්ගම ම.ම.වි, අල්ගම

## රුදුරු වෙඩිහඬ නිමාවී සාමයේ පරවි ඉගිලේවා

රුදුරු වෙඩි හඬක් දසත ඇසෙන්නේ
සොයුරු කැලයිමගෙ ඊතුරෙ සිටින්නේ
අප රට රැකුමට වෙහෙස දරන්නේ
ඇයි ද සිහළුනේ නිහඬව ඉන්නේ

වීර සොහොයුරා නෑ පස්සට යන්නේ
ගිණි අවියයි නිතරම සුරතෙ දරන්නේ
රට රැකලා සිරිලක බබලන්නේ
සාමයෙ පරවියා ඉගිළී එන්නේ

තල් අරඹේ අපෙ සොයුරෝ සිටින්නේ
කොටි රැළ හට නිතරම බැට දෙන්නේ
මෝඩ කොටියනේ හැංගී ඉන්නේ
සාමේ ලහ බව නොපි නොම දන්නේ

**සෙබළ සොයුරෙකුගේ නැගණිය**
**කේ. එම්. සී. දමයන්ති**

## සොයුරනි මගේ මෙය හොඳට සිහියට ගන්න

විෂමයි මුළු ලොවම බොළඳයි අප තාම
දියුණුයි හරිම කුහකයි මිනිසුන් සැම
සතුටින් සැනසුමින් ඉන්නට සැම දම
ඕනෑ බව සිතට ගනු මැන ඉව සැම

කිසිදිනක බැහැ ප්‍රශ්න කඳුලින් ජය ගන්න
විසඳන්නට ප්‍රශ්න හොඳ සිහියෙන් ඉන්න
කරුණක් කියන්නම් ඔබෙ සිහියට ගන්න
වැටුනත් නැගිටින්න බාධක ජය ගන්න

ලස්සන දෙනෙත් යුග කඳුලින් නැහැ වෙන්න
වැලපෙනු එපා සිත එඩිතර කර ගන්න
කිරි දරුවන් විලස ඉරහඳ අයදින්න
බොළඳත්වය එපා පිටතට පෙන්වන්න

යන මග තිම නොකර මහ මග නැවතීලා
අත්වැල හැර දමා නිහඬව පිටු පාලා
තිම කල නොහැකි ද කිසි විට දුරබාලා
හිනැහෙන්න එපා කිසිවකු හඩවාලා

වැටුනත් නැගිට සිට වැටි වැටි නැගිට යමු
රැහිතමු සිහිවටන ගහ මතුවෙහි රහමු
කියවමු අසමු සැම හදවත් හැඳින ගමු
පැරදෙමු දිනමු හිනැහෙමු තැලවෙමු හඩමු

**යාපනය කොලොම්බුතුරේ 11 ශ්‍රීලපාහ සී කන්ඩායමේ සේවය කරන 15174 කෝප්‍රල් දසනායක බීඑම්ටීබීගේ බිරිඳ කුසුම් දසනායක**

# ප්‍රීතිමත් ජීවිතයකට මාර්ගය

## 6 වන කොටස

ප්‍රීතිමත් ජීවිතයක් සඳහා වන ලිපි පෙළෙහි මෙම ලිපිය මගින් මා ඉදිරිපත් කිරීමට අදහස් කරණුයේ වැඩ කිරීමෙන් සතුටු වෙමු යන තේමාවයි.

ඇතැම් විට, මෙම මාතෘකාව, ඔබට අළුත් අදහසක් වුව ද, එය ප්‍රීතිමත් ජීවිතයකට හුරු වූ කිසිවෙකුට අළුත් දෙයක් නොවේ. මක්නිසාදයත් සතුට උපදිනුයේ වැඩ කිරීම මගින් සහ ශ්‍රමය තුළිනි. කිසියම් වැඩක නොයෙදී අලසව කල් ගෙවීමට පුරුදු වන පුද්ගලයින් හට සතුටක් ඇතිවීමට ඇති අවස්ථාව ඉතා විරලය. වැඩක නොයෙදෙන පුද්ගලයාගේ සිත තුලට එකතැන පල්වෙන උදසීන, බියජනක අදහස් ඇතුළු වේ. එයින් සිතින් ලෙඩවේ. ගතත් සිතත් එකට ඇඳුනු සම්බන්ධ වුනු දේවල් බැවින් සිත ලෙස වීමෙන් ද ගත ද ලෙඩ වේ. එමෙන්ම සැකමුසු, බිය ජනක සිතුවිලි නිසා අපේක්‍ෂා භංගත්වයත් එමගින් ආත්ම විශ්වාසය හීනවීමත් සිදුවේ. ආත්ම විශ්වාසයක් නැති පුද්ගලයෙකුට ප්‍රයෝජනවත් පුද්ගලයකු වීමට නොහැක. ඔහුගේ සිත තුලින් සතුට පලායෑම නිතැතින්ම සිදුවේ. නිකරුනේ වැඩක නොයෙදෙමින් කාලය ගත කරණ පුද්ගලයාට කිසිවෙකුගේ පිළිගැනීමක් ලැබෙන්නේ නැත. එවැනි අයෙකුගෙන් වෙනත් අයකු හට ප්‍රයෝජනවත් කිසිවක් ඉටු නොවන බැවින් ඔහුට කිසිවකුගේ ගෞරවාදරයක් ද ලැබෙන්නේ නැත. එබැවින් මූලික වශයෙන් සාර්ථක ප්‍රීතිමත් ජීවිතයක් සඳහා වෙහෙස මහන්සි වී වැඩ කිරීම අත්‍යවශ්‍ය අංගයකි. මෙහි දී වෙහෙස මහන්සි වී වැඩ කිරීම යන්නෙන් අදහස් කර ඇත්තේ ගත වෙහෙස වීම පමණක් නොවේ. ගත සිත යන දෙකම වෙහෙස වීම එමගින් අදහස් කර ඇත.

අප බොහෝ දෙනෙකුට ඇති ප්‍රධානම පැමිණිල්ල නම් කිරීමට වැඩක් නැත යන්නය. එහෙත් ඔබ ජීවත් වන නිවස සහ ඒ අවට ඇති පරිසරය දෙස බැලූවහොත් කිරීමට ඇති වැඩ අප්‍රමාණය අනන්ත බව පෙනී යනු ඇත. ඔබ පොහොසතකු හෝ දුප්පතකු බවට පත් වී සිටින්නේ අන් කිසිඳු කරුණක් නිසා නොව ඔබ සිතන පතන ආකාරය නිසා බව ලිපිපෙල ආරම්භයේ දීම සඳහන් කර ඇත. මක්නිසා ද යත් චේතනාව යනු ක්‍රියාවට මූලික වන දෙයකි. සෑම ක්‍රියාවක්ම ආරම්භ වනුයේ සිතුවිල්ලක් මගිනි. එබැවින් ජීවිතය ප්‍රතිනිර්මාණය කිරීමට නම් ඔබ සිතන ක්‍රමය සහ සිතුවිලි වෙනස් කළ යුතුමය. අප නැවතත් ඔබ අවට පරිසරය සැළකිල්ලට ගනිමු. ඔබ ජීවත්වන නිවස සහ ඒ අවට පරිසරය සැලකිල්ලට ගන්න. ඔබගේ කාමරයෙන් පටන් ගන්න. අපිළිවෙලකට තැන් තැන් වල දමා ඇති කිලිටි ඇඳුම් එකතුකර ඔබම ඒවා සෝද ගන්න. දූවිලි බැඳි මකුළු දැල් වලින් වැසී ඇති කාමරය ඒවා කඩා දමා පිරිසිදු කර ගන්න. අපිළිවෙලට ඇද දමා ඇති සියළු බඩු බාහිරාදිය පිළිවෙලකට තැන්පත් කරන්න. මේ සියල්ල අවසන් වන විට ඔබගේ ගතට දහදිය දමා වෙහෙසක් ඇති වේ. අපට අවශ්‍ය වනුයේ ද එයයි. දැන් මදක් විවේක ගන්න. නැවත වැඩ අරඹන්න. ඔබගේ නිවසේ අනෙක් ස්ථානත් ඒ පිළිවෙළටම පිරිසිදු කර ගන්න. ඉන්පසු නිවසින් පිටත ගෙවත්ත වෙත යොමු වන්න. එය පිරිසිදු කර මල් පැලයක් හෝ වෙනත් ප්‍රයෝජනවත් ගසක් පැල කරන්න. මෙම කටයුතු වල යෙදෙද්දී ඔබගේ ගත වෙහෙසේ. ඔබගේ ශරීරයට අමුතු ව්‍යායාම අවශ්‍ය නොවේ. මිදුලේ හෝ ගෙවත්තේ ඇති ජලය එකතු විය හැකි හිස් ටින් ආදිය වල දමන්න. ඔබගේ නිවසින් අරඹන්න පරිසරය වෙනස් කිරීම. හොඳින් දහදිය දමන තුරු වැඩපල වල යෙදෙන්න. ඔබගේ නිවසේ අයවළුන් ආයාසයෙන් කරන වැඩ පල වලට උදව් වන්න. එමගින් පවුලේ සමගිය සාමය සතුට වර්ධනය වේ. ඔබගේ අසල්වැසියකුගේ යම් වැඩකට උදව් වන්න. ඔබට හොඳ අසල්වැසියන් ඇතිවේ. වැඩ නොකරන කම්මැලියන් හට එවැනි මිතුරන් ඇති නොවේ. යම් දිනක එම අසල්වැසියා ඔබගේ උපකාරයට ද පැමිණෙනු ඇත. මෙසේ දවස පුරා වෙහෙස වී වැඩ කරන පුද්ගලයා හට ශක්තිමත්, සෞඛ්‍ය සම්පන්න ශරීරයක් ඇතිවේ. දහදිය පිටවී වෙහෙස වීම තරම් නීරෝගී ජීවිතයකට අවශ්‍ය වෙනත් කිසිම දෙයක් නැත. එසේ වැඩ කිරීමෙන් පසු හොඳින් රාත්‍රි නින්දද ලැබේ. එය ද නීරෝගී ජීවිතයකට අත්‍යාවශ්‍ය අංගයකි. එබැවින් ප්‍රීතිමත් ජීවිතයක් සඳහා ඔබ අවට පරිසරය වෙනස් කිරීමට අදම වැඩ අරඹන්න. සිතමින් කාලය ගත කරන්න එපා. නිකරුනේ සිතීමෙන් පමණක් කිසිවක් සිදු නොවේ. කිසියම් කටයුත්තක් ඇරඹීමට පෙර සිතීම අවශ්‍ය ය. එහෙත් සිතීමෙන් කල්පනා කිරීමෙන් පමණක් පළක් නැත. වැඩ අරඹන්න. ගතේ සිතේ සියළු රෝග සැක, බිය, සංකා දුරු කර ගැනීමට නම් වැඩ කරන්න. සිහින දෙදරා ගොස් බලාපොරොත්තු සුන් වී ඇත්නම් වැඩ කරන්න.

ලෝකයේ ඉතිහාසය යනු මහන්සි වී වැඩකළ පුද්ගලයින්ගේ කථාවයි. ලෝක ඉතිහාසය නිර්මාණය වී ඇත්තේ ඔවුන්ගේ වැඩ කටයුතු වලින් ය. මහා විද්‍යාඥයින්, සාහිත්‍ය කරුවන්, පඬිවරුන්, දේශ ගවේශකයන්, රාජ්‍ය නායකයන්, රණවිරුවන් ආදිය නිසා ලෝකය අද තිබෙන තත්ත්වයට පැමිණ ඇත. ඔවුන්ගේ ශ්‍රමය, මහන්සිය සහ කැපවීම තුලින් ලෝකය ප්‍රති නිර්මාණය වී ඇත. මානව වර්ගයාට විශාල වශයෙන් යහපතක් සිදුවී ඇත. එවැනි අයවළුන් කෙතරම් ප්‍රීතිමත් ජීවිත ගත කරන්නට ඇත්ද? එබැවින් ඔබටත් ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නම් නිතරම වැඩෙහි යෙදෙන්න. එමගින් ඔබේ සතුට උදවීම නිතැතින්ම සිදුවේ. වැඩ කිරීමට අකමැති පුද්ගලයන් බොහෝ විට සිය කාලය කා දමනුයේ මත්පැන් හෝ මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙනි. එමගින් ඔබගේ ආර්ථිකය සහ සෞඛ්‍යය පිරිහීම පමණක් නොව. ඔබ අන් අයගේ සමච්චලයට ලක් වීම ද නිතැතින්ම සිදුවේ. බොහෝ විට සොරුන් මැරයන් වැනි සමාජ දූෂකයන් බිහි වන්නේ ද ගත සිත වෙහෙසා වැඩ කිරීමට අකමැති මිනිසුන් නිසාය. ලෝකයේ හැම යහපත් දෙයක්මබිහිවී ඇත්තේ මහන්සියෙන් වැඩකල මිනිසුන් අතිනි. එබැවින් වැඩ කිරීම මගින් පරිසරයත් ඔබගේ පෞද්ගලික ජීවිතයත් වෙනස් කිරීම අද පටන් ගන්න. කල් නොදමා වැඩ අරඹන්න. කුමන හෝ කාර්යයක යෙදෙන්න. නිකරුනේ කල්පනා නොකරමින් කිසියම් කාර්යයක යෙදෙන්න. ගෙදර දෙර ඇති වැඩක්, විනෝදාංශයක් ක්‍රීඩාවක් වැනි කුමන හෝ කටයුත්තක යෙදෙන්න. එවිට සැක, බිය හෝ දෙම්නස පලාගොස් ප්‍රීතිය, ජය සහ සැපත ඔබ වෙත ළඟා වනු ඇත.

ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල් බොහෝමයකට ඇති ප්‍රධානතම ප්‍රශ්ණය නම් විරැකියාවයි. එහෙත් විරැකියාව දෙසම සමාජ, ආර්ථික විශ්ලේෂකයන් බලනුයේ වෙනත් දෘෂ්ටි කෝණයකිනි. යම් යම් අධ්‍යාපන සහතික සපුරා කුමන හෝ රජයේ රැකියාවක්

බලාපොරොත්තු වෙමින් කල් ගෙවන බොහෝ තරුණ තරුණියන් අප සමාජයේ සිටිති. එවැනි අයවළුන් වෙනත් කිසිදු වැඩක යෙදීමට අකමැතිය. ඇතැම් විට ඔවුන් බලාපොරොත්තු වන රජයේ රැකියා මගින් උපයන වැටුපට වඩා විශාල ආදායම් ඉපයිය හැකි වෙනත් මාර්ග එමට ඇත. එහෙත් ගත සිත වෙහෙස වීමට ඇති අකමැත්ත නිසාම වඩාත් පහසු අඩු ආදායම් සහිත, එක්තැන පල්වෙන රජයේ රැකියා බලාපොරොත්තු වෙති.

බොහෝ විට මෙම තත්ත්වයට බලපාන තවත් සාධකයක් ඇත. එයනම් අධ්‍යාපන සහතික මිස වෙනත් හැකියාවන් කිසිවක් නොබලා රැකියා සපයන්නේ රාජ්‍ය ආයතන මගින් පමණි. ලාභ ඉපයීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික ආයතනවල මුල් තැන ලැබෙනුයේ කඩදයි සහතික වලට නොව යම් පුද්ගලයකු සතු වැඩ කිරීමේ හැකියාව සහ වෙහෙස වී වැඩ කිරීම සඳහා ඒ පුද්ගලයා තුළ ඇති කැමැත්තයි. එහෙත් තුන්වන ලෝකයට අයත් බොහෝ රටවල රාජ්‍ය අංශය ඉතා අකාර්යක්‍ෂම දූෂිත තත්ත්වයකට පත්ව ඇත්තේ අඩුවෙන් වැඩකර වැඩි වරප්‍රසාද සහ සුඛෝපභෝගී ජීවිත තත්ත්වයන් බලාපොරොත්තු වන රාජ්‍ය සේවයකයන් නිසාය. අමෙරිකානු ෆෝඩ් මෝටර් රථ සමාගම ඇතුළු විශාල ව්‍යාපාර ගණනාවක් බිහිකල, කලක් ලෝකයේ සිටි ධනවත්ම පුද්ගලයා වූ හෙන්රි ෆෝඩ් මහතා මේ ගැන සඳහන් කරයි. " අප සමාගම යම් සේවකයකු හට ගෙවීම් කරනුයේ, ඔහුගේ සහතිකපත් වලට නොව ඔහුට අප සමාගම වෙනුවෙන් කලහැකි වැඩ කොටසටය."

අත පය වෙහෙසවීමට මානව වර්ගයා ඇකමැති වීමත් සමගම විශ්ව රීතිය වන ස්වභාවය ධර්මය මගින් ද මිනිස් සංහතියට දඩුවම් කිරීමට පටන් ගෙන ඇත. මිනිසුන් වෙහෙස මහන්සි වී වැඩකල කාලවල දී අසන්නට වත් නොලැබුණු අධික තරබාරුකම අධික රුධිර පීඩනය, හෘද රෝග, කොලස්ටරෝල් අධික වීම, දිය වැඩියාව ආදී රෝග විශාල වශයෙන් ව්‍යාප්ත වීමට පටන් ගෙන ඇත. ඉහතින් සඳහන් කල සියළුම රෝගවලට ප්‍රතිකාර ඇරඹීමට පෙර වෛද්‍ය උපදේශය වනුයේ ශාරීරික ව්‍යායාම අරඹන ලෙසය. අපේ පැරැන්නෝ මුළු දිවා කාලය පුරා ගොවිතැන් කටයුතු වල යෙදෙමින් ශරීරය වෙහෙසා වැඩ කරන අතර කාන්තාවන් දරුවන් රැකබලා ගැනීම, ආහාර සඳහා ධාන්‍ය සැකසීම ආදියේ යෙදෙමින් ශරීරය වෙහෙසා ඇත. ලෝකයේ කාර්මික විප්ලවයත් සමග සිදුවූ විපර්යාසයන් තුලින් බිහිවූ යන්ත්‍ර සූත්‍ර නිසා මිනිසා අකර්මන්‍ය තත්ත්වයකට පත්ව ඇත. මිනිස් ශිෂ්ඨාචාරය ආපසු ගල් යුගයට හෝ එඬේර යුගයට ගමන් කරවිය යුතු නැත.

එහෙත් ඕනෑම යුගයකදී අපට සිදුවී ඇති වැරදි හෝ අතපසු වීම් නිවැරදි කර ගැනීමට අප මැලිවිය යුතු නැත. ස්වභාවය ධර්මයේ රීතියට විරුද්ධව වැඩ කලහොත් ස්වභාව ධර්මය මිනිසාට දඩුවම් කරන බවත් එසේ කර ඇති අවස්ථා පිළිබඳව පැහැදිළි විග්‍රහයකුත් මින් ඉහත ලිපියක සඳහන් කළෙමි.

අතපය වෙහෙස වීමට ඇති අකමැත්ත නිසා දරුවන් බලාගැනීමට වෙනත් සේවකයන් යෙදවීමටත්, දරක නිවාස වෙත භාරදීමත් නිසා කුඩාකල ආදරය සහ රැකවරණය අහිමි වීම නිසා විකෘති වූ මනස් සහිත ඉතා කෲර මිනිසුන් බිහිවී ඇත. මිනිස් සමාජය යන මේ ගමන ආපසු හැරවිය නොහැකි අන්දමට පරිහානිය කරා යොමු වී ඇත. එහෙත් ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට අදහස් කරනු ලබන පුද්ගලයා විසින් අනිවාර්යයෙන්ම වැඩකිරීමෙන් සතුටුවීමේ පුරුද්ද ඇති කර ගතයුතු ය. ලෝකය නිර්මාණය වී ඇත්තේ ශ්‍රමය පදනම් කරගෙනය. මෙහි දී ශ්‍රමය යනුවෙන් අදහස් කරනුයේ ගත සිත යන දෙකම වෙහෙස වීමය. ලෝකය සහ මානව ශිෂ්ඨාචාරය මෙතෙක් පැමිණ ඇති ගමන එසේ පැමිණ ඇත්තේ ශ්‍රමය මගිනි. ලෝක පූජිත නිර්මාණ වන පිරමිඩ, දගැබ් චීන ප්‍රකාරය, මහා වාරි කර්මාන්ත ආදිය බිහිව ඇත්තේ මිනිසුන්ගේ කැපවීම සහ ශ්‍රමය මගිනි. ලෝකය වෙනස්වී ඇත්තේ සහ දියුණුවට පත්වී ඇත්තේ ශ්‍රමය වැය කිරීම නිසා නම් පුද්ගලයෙකු දියුණුවට පත් වන්නේ ද ශ්‍රමය වැය කිරීමට ඇති කැමැත්ත සහ කැපවීම නිසා නොවේද? එවැනි කාර්යශීලී පුද්ගලයකු උදෑසන දකිමත් ශුභදයක බව පැරැන්නන්ගේ අදහසයි. එම අදහස අදටත් ගැලපෙන බව අමුතුවෙන් සඳහන් කිරීම අවශ්‍ය නැත.

ඔබට පැවරී ඇති රාජකාරිය කාර්යාලයක වැඩ කිරීමට ඇති කටයුත්තක් නම්, වේලාවට වැඩට පැමිණ කටයුතු අරඹන්න. ඔබගේ වැඩ කොටස හැකි ඉක්මණින් අවසන් කරන්න. ඇතැම් විට ඔබගෙන් යම් මෙහෙයක් කරවා ගැනීම සඳහා ජනතාව බොහෝ දුර බැහැර සිට ඉතා අපහසුවෙන් පැමිණ සිටින්නට පුළුවන්. නොවලහා ඔවුන්ගේ කටයුතු අවසන් කර දෙන්න. එයින් ඔවුන් සතුටට පත් වේ. එමගින් සතුට උපදී. ඔබ ආයතනය තුල ජනප්‍රියත්වයට පත් වේ. ඔබට උසස් නිළධාරීන්ගේ අවධානය දිනා ගැනීමෙන් රැකියාවේ ඇතැම්විට උසස්වීම් පවා ලැබිය හැක. ඔබ වෙත පැවරී ඇති රාජකාරි වගකීම් දෙස ඔබ බැලිය යුත්තේ ප්‍රශ්ණ සහගත, වෙහෙසකාරි කෝණයකින් නොව. ඒවා දෙස ඔබ බැලියයුත්තේ ඉතා උනන්දුවෙන් සහ ප්‍රීතියෙනි. ඔබට පැවරී ඇත්තේ ඒකාකාරි වැඩ කොටසක් විය හැක. එහෙත් එය ඔබගේ වගකීමය. ඔබගේ සාර්ථකත්වය රඳා පවතිනුයේ එය මතයි. අප ජීවත් වනුයේ ප්‍රයෝජනවත් වැඩ කොටසක් ඉටු කිරීමට මිස අලස ලෙස ජීවත්වී මිය යාමට නොවේ.

ඔබ ගොවිතැන් වල හෝ වෙළෙඳමක් වැනි ස්වයං රැකියාවක යෙදී සිටින අයකු විය හැක. උදෑසනින්ම අවදි වී ඔබගේ දෛනික කටයුතු උද්යෝගයෙන් යුතුව අරඹන්න. කලින්ද රාත්‍රියේ ඔබගේ කටයුතු සැලසුම් කර ගන්නේ නම් වඩාත් අගනේ ය. එවිට ඔබට වැඩ අතපසුවීම් සිදු නොවේ. ප්‍රමුඛතා අනුව වැඩ පෙළ ගස්වා ගැනීමට ද පිළිවන, එමගින් තෘප්තිමත්ව සතුටින් වැඩපල වල යෙදීමට පිළිවන. ඔබගේ කර්මාන්තය, ගොවිතැන් කටයුතු හෝ ව්‍යාපාරය දිනෙන් දිනම සාර්ථකත්වයට පත්වන බැව් ඔබට පෙනී යනු ඇත. ඔබගේ ශ්‍රමයෙන් උපදින අතිරික්ත ධනය සහ සම්පත් ඔබ තරමම වාසනාවන්ත නොවුන අයවළුන්ගේ ප්‍රයෝජනයටත් යම් ප්‍රමාණයක් දිය හැක. අප සමාජයේ ආධාර අවශ්‍ය වන දිළින්දන්, ආබාධිතයින්, රෝගීන් වැනි අය වෙනුවෙන් ඔබට කාරුණිකව යම් පරිත්‍යාගයක් කළ හැක. එමගින් ඔවුන්ගේ සිත්වල උපදින සතුට මගින් ඔබට ද සතුට ලැබිය හැක. අලසව කල් ගත කරන්නන් හට මේ අවස්ථා කිසිවක් උදවන්නේ නැත. ජීවිතයේ දියුණුවීමට අවස්ථා උදවන්නේ ද, වාසනාව උරගා බලන්නන් හටය. උත්සාහය සහ නොපසුබට වීර්ය තුලින් පමණක්ම සාර්ථක්තවය ඇතිවේ. සාර්ථකත්වයේ ප්‍රධානම රහස ද එයයි.

කිසියම් ප්‍රයෝජනවත් කාර්යයක නොයෙදෙන ඕනෑම අවස්ථාවක ඔබගේ කාලය ගතවිය හැක්කේ භයානක අන්දමකට ය. ඇතැම් විට මත් ද්‍රව්‍ය හෝ මත්පැන් වලට ඇබ්බැහි වීම හෝ පාප මිත්‍රයන් ආශ්‍රයට වැටීම ආදිය සිදුවිය හැක. එහෙත් වැඩපලක යෙදෙන අයවළුන් හට එවැනි නිශ්ඵල දේවල යෙදීමට අවකාශ නොමැත. එබැවින් එවැනි අයවළුන්ගේ කීර්තිය පැතිරීමක් එමගින් සමාජ පිළිගැනීම වැඩි වීමක් සිදුවේ. ඇතැම් විට එම සමාජ පිළිගැනීම හරහා මුදල් වලට කරවා ගත නොහැකි වැඩ කටයුතු රාශියක්

කර ගැනීමට ද පිළිවන. ඔබගේ තරාතිරම කුමක් වුව ද නිතැතින්ම කීර්තිය ඔබ කරා ලඟා වනු ඇත. උසස් රැකියාවක නියුතු අලස උදාසීනයකුට වඩා සාමාන්‍ය රැකියාවක නියුතු කාර්යක්‍ෂම පුද්ගලයකුගේ ජීවිතය සාර්ථක තත්ත්වයට පැමිණේ. මන්ද වැඩ කිරීමට ඇති කැපවීම හරහා ඔහුට ලැබෙන සමාජ පිළිගැනුම වැඩි නිසාත් වැඩ කිරීමෙන් ලබන තෘප්තිය නිසා ඇතිවන සංතුෂ්ඨිය නිසාත් ය. මෙම ලිපියේ ඉහතින් සඳහන් ඡේද වල පැහැදිලි කර ඇති අන්දමට ධනය, කීර්තිය, ආත්ම තෘප්තිය වැනි සතුටට පදනම් වන මූලික අංග සියල්ලම බිහි වනුයේ ශ්‍රමය සහ කැපවීමෙන් වැඩ කිරීම නිසාය. එබැවින් සතුටින් ජීවත් වීමට නම් මහන්සියෙන් වැඩ කිරීමත්, එමගින් සතුටු වීමේ කලාවත් අප විසින් ප්‍රගුණ කළ යුතු ය. සියළු යහපත් දේ වල ආරම්භය ශ්‍රමය වන බැවින් සමෘධිමත් ජීවිතයකට මහන්සියෙන් වැඩ කිරීමේ අවශ්‍යතාවය තේරුම් ගත යුතු ය. ඒ තුලින් ප්‍රීතිමත් ජීවිතයක් ප්‍රතිනිර්මාණය කර ගනිමු.

වැඩ කිරීමෙන් සතුටු වෙමු.
ඔබ දුප්පත් නම් - වැඩ කරන්න
ඔබ පොහොසත් නම් තව දුරටත් -
වැඩ කරන්න
ඔබ ප්‍රීතිමත් නම් - දිගටම වැඩ
කරන්න
අලසකම නිසා සැකයක් බියත් ඇති
වීමට ඉඩ සැලසේ.
බලාපොරොත්තු කඩවීමක් සිදුවුවහොත්
- වැඩ කරන්න.
ශෝකය ඔබ වෙලාගනී නම්,
ආදරය කරන අය අවංක නැති බව
පෙනේ නම් - වැඩ කරන්න
සිහින දෙදෙරා ගොස් බලාපොරොත්තු
සුන් වූ බව පෙනේ නම් - වැඩ කරන්න.
හිස ගිනිගත් කලක මෙන් වැඩ කරන්න
ඇත්ත තත්ත්වය ද එයයි
කුමක් සිදුවුවත් - වැඩ කරන්න
ලැදිව වැඩ කරන්න - විශ්වාසයෙන්
වැඩ කරන්න
වැඩ කිරීම තරම් ප්‍රත්‍යක්‍ෂ බෙහෙතක්
නැත
ගතේ සිතේ සියළු රෝග පහව යන්න -
වැඩ කරන්න

**එස්සී කරුණාරත්න ආර්එස්පී - ශ්‍රීලපාහ**
**ලුතිතන් කර්නල්**
**අණදෙන නිලධාරී 4 ශ්‍රීලපාහ**

# සෙබලාගේ බිරිඳ කථා කරයි

ආදරණීය සෙබළාට,

ඉතිං ඉතිං කොහොමද? නිවාඩු කාලයේ අළුත් තොරතුරු ඒම. මම නම් එද ගියාට පස්සේ අදට දින 10 ක් වෙනවා තනියෙම කාමරයකට දලා හිරකලා තියෙන්නේ. මම ඔයාට කියන්නමයි හිටියේ නැවත ඔයා ගෙදර යනකොට මාවත් අරං යන්න. ඇයි දන්නව ද සමහර දට වෙන අය ඇවිල්ල මාව අත ගාල බලල පෙරලල මගේ හොම්මරය අහනව. ඔයා කියලමයි ගියේ කා එක්කවත් යන්න එපා කියලා. ඔයා හිටියනම් මාව අල්ලන්න තියා ලඟටවත් එන්නේ නෑ. අද මාව දිහා අනෙක් සෙබලුන් බලන්නේ වපර ඇසින් අනික බලන්න මගේ ඇගේ තියෙන කුණු ඔයා හිටියනම් මම කොච්චර හොඳට පිරිසිඳුවට ඉන්නව ද කියල. අදට දින 10 ක් වුවා හරියටම කැමක් නැත. මට මේක ඇතුලට වෙලා ඉඳලා එපා වෙලා තියෙන්නේ අනික මෙතන මහා භයානක තැනක් වෙඩි බෙහෙත්, බෝම්බ එහෙමත් තියෙනවා හදිසියේ ඒවාට මොකක් හරි අනතුරක් සිදුවුනොත් මමත් ඉවරයි. ඒ නිසා ඉක්මනින් ඇවිල්ල මාව මේ අපායෙන් නිදහස් කර ගන්න.

ආ.... මට කියන්න අමතක වුනා 98.01.01 දින දවස පුරාම මහ වැස්ස මම හිටිය තැන වහලෙන් වතුර වැටෙන්න පටන් ගත්ත එද මම හොඳටම තෙමුන ඊට පහුවද බලන කොට මගේ ඇඟ පුරාම තැනින් තැන පලුවගයක් දලා තවම හොඳ නෑ ඔයා එයි කියල බලන් ඉන්නෙ බේතක් කරන්න. මේ කාමරයේ අයිතිකාරයෝ ඇවිල්ල මව බලල කොහොම ද කියල ගියා ඒත් මට කිසිම බේතක් දුන්නේ නෑ. අදත් දවස පුරාම වැස්ස තෙමුනොත් එහෙම මාව ආබාධිත වෙයි. එහෙම වුනොත් කොළඹ රෝහල "ශීලයුයුබ" එකේ නවතින්න වෙන්නෙ. දැනටමත් මට තේරෙනවා මගේ ඇඟ ඇතුලේ පාටස් වැඩ කරන්නේ නෑ කියලා හැකි ඉක්මනින් ඇවිල්ල මාව බේරගන්න.

ඒක නෙමෙයි ඔයා මට කියල යන්නේ හරියටම වේලාවට එනවා කියල ඒත් අදට දින 15 ක් වුනා මම කොහොම ද මෙච්චර කාලයක් ඉවසාගෙන ඉන්නේ. බලන්න ඔයාව විශ්වාස කරන්නේ කොහොම ද කියලා මට එහා ඉන්න කෙනාගේ මහත්තය ගිහිල්ල අදට මාසයක් විතර වුනා තවම ආවේ නෑ. මේ ළඟදී එයා කා එක්ක ද වෙන කෙනෙක් එක්ක ගියා. ඇයි ඔයා අපට බොරු කරල දල යන්නේ. ඔයාල අපට අවංකව ආදරය කරන්නේ නැහැ. අදට ඇති හමුවූ විට කථා කරමු.

ඔයාට සියළු දෙවි පිහිටයි.

මෙයට ණය ගැති
කවදත් ඔයා ළඟ සිටින බිරිඳ
**වී 56 රයිපලය**

**සෙ/22709**
**සාසෙ බාලසූරිය බිඡ්ඡ්එ්ස්**
**2 ශ්‍රීලපාහ බලඇණි කාර්යාලය**
**වෙංකල්අඩි - මඩකලපුව**

# ක්‍රියාත්විතයේ දී මිය ගිය සෙනීන් හට පිං පැමිණවීම

7වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව ආරම්භ කර මේ දක්වා ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයන් හේතුවෙන් සහ ස්වාභාවික හේතූන් මත මියයන ලද නි/සෙනීන් 89 දෙනෙකු හට පිං පැමිණවීම සහ ඔවුන්ගේ ඥාතීන් එක්රැස් කොට ත්‍යාග / සිහිවටන ප්‍රධානය කිරීමේ උත්සවයක් 1997.11.09 දින සහ 10 යන දිනයන් වල දී පවත්වන ලදී.

මෙම උත්සවය සහා මියගිය රණවිරුවන්ගේ දෙමාපියන්/ඥතීන් 175



මියගිය රණවිරුවෙකුගේ ඥතියෙකු හට රෙජිමේන්තු අධිපති විසින් සිහිවටන/ත්‍යාග ප්‍රධානය කරනු ලබන අවස්ථාව (ඒකකයේ අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව් වීරක්කොඩි ශ්‍රීලපාහ පසෙකින් සිටී)



මියගිය රණවිරුවෙකුගේ බිරිඳකට ඒකක අණදෙන නිළධාරී විසින් සිහිවටන/ත්‍යාග ප්‍රධානය කරනු ලබන අවස්ථාව (ඒකකයේ විධායක අධිකාරී පසෙකින් සිටී)



මියගිය රණවිරුවන්ගේ දෙමාපියන්/ඥතීන් වෙනුවෙන් වාද්දුව යුධ හමුද නිවාඩු නිකේතනයේ දී පැවැති දිවා භෝජන සංග්‍රහයේ දී දෙමාපියන් ඒ සඳහා සහභාගී වී සිටින අවස්ථාව)

දෙනෙකු පමණ සහභාගීවූ අතර, 97.11.09 දින කළුතර බෝධීන් වහන්සේ අභියසදී මියගිය රණවිරුවන්ට පිං පැමිණවීම සඳහා බෝධි පූජාවක් පවත්වන ලදී. පසුදින එනම්, 97.11.10 දින වාද්දුව යුධ හමුද නිවාඩු නිකේතනයේ දී මියගිය රණවිරුවන්ගේ දෙමාපියන් /ඥතීන් හට සිහිවටන සහ ත්‍යාගයන් පිරිනමන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒ කේ ජයවර්ධන ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී සහභාගී වූ අතර, ඒකකයේ පෙර සිටි අණදෙන නිලධාරීන් 2 වන අණදෙන නිලධාරීන් ඇතුළු ජ්‍යෂ්ඨ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ද මේ සඳහා සඳහා සහභාගී වන ලදී.

තවද එයට සහභාගී වූ රණවිරුවන්ගේ දෙමාපියන් /ඥතීන් හට තම පුතුණුවන් / ස්වාමි පුරුෂයා වෙනුවෙන් ලැබෙන වන්දි, වැටුප් හා අනිකුත් දීමනාවන්හි විෂමතාවයන් සහ ඒ පිළිබඳව ඇති ගැටලු ද මෙදින සාකච්ඡා කර ඒ වෙනුවෙන් ඒකකයට ගත හැකි ක්‍රියාමාර්ගයන් ද ඉටු කිරීම මෙදින පැවැති උත්සවයේ දී දෙමාපියන්ට/ඥතීන්ට ලද විශාල උපකාරයක් විය. තව ද මෙමු දෙදින තුළ පැවැති උත්සවය ඒකකයටත්, ශ්‍රීලපාහ රෙජිමේන්තුවටත්, යුධ හමුදවටත් විශාල ගෞරවයක් වූ බැවි. අවසානයේදී දෙමාපියන් සහ මේ සඳහා සහභාගී වූ සිවිල් ආයතන ප්‍රධානීන්ගෙන් අපහට දැනගැනීමට හැකිවිය.

# කලියුගයේ පිරිත් පැන්

## සත්‍ය සිද්ධියක් ඇසුරෙනි

97.10.05 දින පුලියන්කුලම ප්‍රදේශයට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයේ දී 6 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙබළකු අතුරුදහන්ව තිබුණි. හට පිරිස් විසින් එම ප්‍රදේශයේ කළ මෙහෙයුමකදී 97.11.25 දින අතුරුදහන්වූ එම සෙබළාගේ මෘතදේහය සොයා ගනු ලැබීමෙන් පසුව මෘතදේහය ආදහනය කිරීමෙන් පසුව භෂ්මාවශේෂ ඔහුගේ නිවස වෙත භාරදීමට අදහස් කලෙත් ඒ පිළිබඳව වූ මූලික කටයුතු සම්පාදනය කෙරුණි. මෙම කටයුත්ත සඳහා පිරිත් පැන් ද අත්‍යවශ්‍ය වූ බැවින් පිරිත් පැන් ස්වල්පයක් රැගෙන ඒමට සැරයන්වරයකු මැදවච්චිය නගරයට ආසන්නයේම පිහිටි බෞද්ධ සිද්ධස්ථානයක් වෙත යවන ලදුව ඇති වූ සිද්ධියකි මේ.

සැරයන් වරයා දෑහැත් වට්ටියක් දපිළියෙල කරගෙන පිරිත්පැන් ගෙන ඒමට සුදුසු භාජනයක් ද රැගෙන විහාරස්ථානය වෙත ගොස් ලොකු හාමුදුරුවන් (එම අවස්ථාවේ වැඩසිටි) බැහැදක තමන්පැමිණි කාරණය පවසා ඇත. එම අවස්ථාවේ ලොකු හාමුදුරුවන් තවත් භික්ෂුවකට කථා කර දනය පිළියෙළ කර තිබූ මේසයේ කෙළවරක තිබූ බඳුනකින් බෝතල් භාගයක් පමණ පැන් වත්කරදී, "ඔය පැන් ටික මදි නම් තව පැන් (වතුර) ටිකක් දගන්න" ලෙස උපදෙස් දී ඇත. මෙම ක්‍රියාදමය පිළිබඳ පොඩි හාමුදුරුවන්ගේ සිතෙහි කිසිදු පැහැදීමක් නොවූයෙන් සැරයන්වරයාට පැත්තකට කථා කොට ලොකු හාමුරුදුවන්ගේ එවැනි ක්‍රියාකලාපයන් පිළිබඳව වටහා දී සිදුවූ සිද්ධිය පිළිබඳව කණගාටුව පළකර ඇත.

අද රට තුල තිබෙන සෑම හොඳ දෙයකටම ඒ හා සමාන ව්‍යාජ දේවල් කලවම් කරන යුගයක පිරිත්පැන් වැනි උතුම් දේවල් ද ලක්ව ඇති බව දැනගැනීමෙන් අප මහත් කලකිරීමට පත්වීමු. බෞද්ධ අපගේ පිරිත්පැන් පිළිබඳව තිබෙන්නේ ඉතාම භක්තියක් සහ විශ්වාසයකි. යුධහමුද සෙබළුන් වශයෙන් අප එතරම් නොතැකුව ද, බෞද්ධාගම, පිරිත්පැන්, බුදුන්, දෙවියන් සහ ආගමානුකූල කටයුතු පිළිබඳව දැඩි භක්තියකින් විශ්වාසයකින් පසුවන සැදැහැවතුන් මෙවැනි ක්‍රියා පිළිබඳව දැනගත හොත් ඔවුන්ට කෙබඳු කලකිරීමක් ඇතිවේවිද? මින් මතුවටත් ඔවුන්ගේ ඒ භක්තිය පවතී ද? යන්න බැරෑරුම් ප්‍රශ්ණයකි. මෙවැනි භික්ෂූන් අප සිද්ධස්ථාන වල තවත් වැඩ වෙසේද? එසේ නොවේවා කියා සියළු බෞද්ධයන් වෙනුවෙන් මම ප්‍රාර්ථනය කරමි.

සෙ/12432 සැරයන්
කරුණාරත්න ටීඑම්එන්අයි
බලඇණි මූලස්ථානය
6 ශ්‍රීලපාහ

# උත්සාහ වන්තයා සියල්ල ජයගනී

දත දෙපය වෙහෙසා දහදිය හෙලා මහත්සි වන කෙනෙකුට නැණ නුවන මෙහෙයවා සැලකිලිමත් වන තරමට කෙනෙකුට තම බලාපොරොත්තු ඉටු කරගත හැකිය. බොහෝ දෙනා තුළ පැවැති උද්යෝගය හීනවෙයි. ආරම්භයේ පැවැති (උද්යෝගය ප්‍රතිඵල නෙලා ගන්නතුරුම ගෙන යන්නෝ උත්සාහ වන්තයෝ ය.

ඔවුන් මොන බාධක හරස් වුව ද පටන් ගන්නා කාර්යය අතරමග නතර නොකරති. ගලන ගඟක් කොපමණ ගලුගල් හරස් වුනත් නතර වන්නේ නැත. හරිහැටි බාධක වලින් තව තවත් ධෛර්ය සම්පන්න වීම උත්සාහවන්තයාගේ ගතියයි.

අවහිර බාධක වලින් දුබල වන්නෝ ආත්ම ශක්තියක් නැත්තෝ ය. වාසනාව වුවත් පැදෙන්නේ උත්සාහය කරන්නට ය. කවර උගතකු වුවත් ධනවතකු වුවත් ඒ තත්ත්වයට පැමිණියේ උත්සාහය නිසයි.

සෙ/110757
ආසෙ හේරත් එච්එම්එස්කේ
8 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම

දයාබර සෙබල සොයුර

ඔබත් මමත් අප හැම හමුවූයේ මේ යුද කතරේදීමය. මෙවන් බිමක අප සොයුරු මේත් බැඳී එකම අම්මාගේ දරු කැලැක් මෙන් එකට වැතිර සටන් වැද මොනයම් මොහොතක ඔබට ද මට ද අභිමිරි වුවත් ගිතියම් වූත් උණ්ඩය හිමිවිය හැක. එනෙක් අප අපගේ දේශයේ මේ පුංචි මව්බිමේ සාමය ආරක්ෂා කිරීමට එක සිතින් බැඳී සිටින්නෙමු. ඉතින් සෙබල සොයුර ඔබට ද මට ද උරුම ඒ අමිහිරි මරණයට අප සැමබිය නොවී එලසේම මුහුණ දෙමු. මා මේ කුරිරු යුද්ධයෙන් මියදුනත් අප ආ මේ ගමන දිගටම නිවහල් රටක් සමතු පරපුරට බිහි කිරීමට සියලු සෙබල යොදුරන්ට හැකි වේවා.

සෙ/306191
ලා/කෝ අනුර කුමාර එස්ඒඑන්
12, ශ්‍රීලපාහ ඩී කණ්ඩායම, චාවකච්චේරි

# සෙබළ පඩිපත

වර්තමානයේ රාජ්‍ය සේවකයින් ලබන මාසික වැටුප දෙස බැලීමේ දී, හමුදා සෙබලෙකු තරමක් ඉහල වැටුපක් ලබන බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. අනෙකුත් රාජ්‍ය සේවකයින්ගේඅධ්‍යාපන සුදුසුකම් හා වැඩිමනත් සෙබළුන්ගේ අධ්‍යාපනික මට්ටම කෙරෙහි සැලකිලිමත් වීමේ දී මෙය ඉතා ඉහල වැටුපකි. එහෙත් පැය 24 පුරාම සේවයට කැපවී සිටින, විශේෂයෙන්ම ක්‍රියාන්විත ප්‍රදේශවල තම දිවි පරදුවට තබා, ජීවිතයේ වසන්ත කාලය අව්ව, වැස්ස මධ්‍යයේ ඝන වනාන්තර වල අති දුෂ්කර, අවදානම් රාජකාරියක නියැලෙන අයෙකු තමාගේ වැටුප ප්‍රමාණවත් නොවේ යැයි කෙරෙන තර්කය ද කෙසේවත් ඉවතලිය නොහැක.

කෙසේ වෙතත් ඕනෑම පුද්ගලයෙකු තමා ලබන ආදායමෙන් සකසුරුවම් ලෙස වියපැහැදම් කලහොත් කිසිවෙකුට බරපතල ආර්ථික ප්‍රශ්නයක් ඇතිවිය නොහැක. පෘථග්ජන මිනිසුන් වශයෙන් ලෞකික සැප සම්පත් වලට ඇලුම් කිරීම ස්වභාවයෙන්ම සිදුවන්නකි.එහෙත් මේ පිළිබව යථාර්ථවාදීව කල්පනා කර ආශාවන් පාලනය කරගතහොත් යහපත් ප්‍රතිඵල අත්විය හැක. එසේ නොමැතිව තම තරාතිරමට නොගැලපෙන ලෙස ආශාවන් පසුපස හඹා ගියහොත් සිදුවන්නේ විනාශය පමණි. විශේෂයෙන්ම සෙබළුන් මේ කෙරෙහි දැඩි නැඹුරුවක් හා ලොල්වීමක් ඇති බව සඳහන් කළහොත් ඔබද මා හා එකඟ වනු ඇත.

විවාහක සෙබළුන් හැරුන විට අන් සෙබළුන්ගේ නිවාඩු වාරය මාස දෙකකින් හෝ තුනකින් එළඹීම, වත්මන් රාජකාරී තත්ත්වය මත සිදුවන සාමාන්‍ය දෙයකි. එම නිසා ඔවුන් නිවාඩු ලබා යන විට මාස 03 ක වැටුප වශයෙන් සැලකිය යුතු මුදලක් ඔවුනත රැඳී ඇත. එහෙත් ඔවුන් තම නිවෙස් වෙත රැගෙන යන්නේ ඉතාම සුළු මුදලකි. කමක්ද මෙයට හේතුව? කිසිවක් නොවේ ඔහුගේම අනවශ්‍ය වියදමයි. අනවශ්‍ය වියදම්? ඒ මොනවාද?

සමහර සෙබළුන්ගේ මිතුරන් ඔහු නිවාඩු පැමිණෙණ තෙක් අතැහිලි ගනිමින් සිටී. ඔහුගේ දෙමාපිය සොයුරු සොයුරියන්ට වඩා ඔහුගේ පැමිණීම අපේක්ෂා කරන්නේ මිතුරන් ය. මේ කුමකටද? ඔහුට ඇති ලෙන්ගතුකමට ද? නැත. ඒ දින කිහිපය ඔහුගෙන් යැපීමටයි. එසේ නොමැතිනම් ඔහුගෙන් වාසි ප්‍රයෙජන ලබා ගැනීමටයි. ඔහු ගමට පය තබනවාත් සමගමමිතුරන් ඔහු වටකර ගනී. කලකින් හමු වූ ප්‍රීතිය භුක්ති විඳීමට ලහි ලහියේ සූදනම් වෙති. එහෙත් සාද සඳහා වියදම් අප සෙබළාගෙනි. මිතුරන් මිල ගෙවීමට ඉදිරිපත් වුව ද, එයට අප සෙබළාගෙන් අවස්ථාවක් නැත. එය අප සෙබළාට මදිකමකි. ඒ නිසා එය ඔහු ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී ගෙවා දමයි. දැන් රෑ දෙගොඩහිරි යාමයත් සුවී අවසන් ය. පදමට වැදී ඇති නිසා නිවසට යා නොහැක. එනිසා මිතුරෙකුගේම නිවසේ රාත්‍රිය ගත කරයි. මිතුරාට පදම් වී ඇති බැවින් එහුගේ පසුම්බියෙන් නෝට්ටුවක් දෙකක් ගැනීමට ද ඇතැයි මිතුරෙක් මැලි නොවෙයි. ඒ මොවුන් සැබෑම මිතුරන් නොවන බැවිනි. ඇතැමෙක් අතමාරුවක් ගැනීමට යෝජනා කරයි. අප සෙබළා ද ඉල්ලූ පමණින් අවශ්‍යතාවය ඉටු කර දී හමාරය. එහෙත් මේවා ලැබෙන නිශ්චිත දිනයක් නම් නැත. පසු දින නිවසට යන විට සෙබළා අත ඇත්තේ සුළු මුදලකි.

ඊළඟ තොවිලය ඇරඹෙන්නේ නිවසට පැමිණි පසුවයි. ඔහු නිවාඩු ආ බව සැලවූ අසල්වැසියන් තොරතුරු විමසීමට බුරුතු පිටින් රොක්වෙයි. ඒ අය වෙනුවෙන් ප්‍රීති සාද පැවැත්වීමට ද සෙබළා මැලි නොවෙයි. මෙවන් මිතුරන්, අසල්වැසියන් සේම වන ඇතැම් පවුල් වල සොයුරු සොයුරියන්ද නැත්තේ නොවේ. ඔහුගෙන් ඵල ප්‍රයෙජන ලබාගැනීම ඇතැම් සොයුරු සොයුරියන්ගේ ද අරමුණයි

නිවාඩු දින ගණන මෙලෙස ගත කර අවසන කඳවුරට ඒමට සෙබළා අත මුදල් ඉතිරිව නැත. දැන් ඔහුබස් වියදම් සොයා ගැනීමට මිතුරන් පසුපස යයි. එහෙත් කිසිවෙකුගෙන් උපකාරයක් නැත. මුදල් සොයා ගැනීමට නොහැකි වූ නිසා ඇතැම්විට ඔහුට නියමිත දිනට සේවයට රපෝර්තු කිරීමට ද නොහැකිවිය. අවසනදී මවගේ පියාගේ පිහිට පතයි. නමුත් කඳවුරට පැමිණීමේදී සිදුවිය යුතු දේ සිදුවී හමාරය. නිනොසේනො නිසා වැටුප ද අත් හිටුවා ඇත. එහෙත් ඔහු මෙයින් පාඩමක් ඉගෙන ගෙන නැත. ඊළඟ නිවාඩුවේදී ද එලෙසමය. නමුත් තමාට අවශ්‍යතාවයක් වූවිට ඇසුරුකල මිතුරන් අසලක නැත.

අවිවාහකයින් පමණක් නොව ඇතැම් විවාහක සෙබළුන් ද මේ තත්ත්වයට පත්වඇති බව අප දැක ඇත්තෙමු. අපගේ වැටුපට හා ආදායමට අනුව අපට කලහැකි උපරිමයක් ඇත. අප එයින් සෑහීමකට පත්වීමට පුරුදු විය යුතුයි. කෙනෙකු තරු පහේ හෝටලයක තම විවාහ මංගල උත්සවය පැවැත්වූවාට අපගේ ආදායම අනුව එය කළ නොහැක. එසේම කෙනෙකු දෙමහල් නිවසක් තැනුවත් අපට එවැනි වියදමක් දැරිය නොහැක. අසල්වැසි නිවසට වර්ණ රූවාහිනියක් ගෙනාවට ඔබට ද එවැනි එකක් ලබා ගත යුතු යැයි කිසිදු නියමයක් නැත. සමහර විට ඔබගේ ආර්ථික පසුබිම මත වැයකල හැක්කේ කළු සුදු රූපවාහිනියකට පමණි. ඇතැම් විට ඒ සඳහා මුදලක් යෙදවීමට නොහැකි වීමට ද පුළුවන. නමුත් මින් ඔබට කිසිදු හානියක් සිදු නොවේ. එසේ නම් අප යමක් කළයුත්තේ අපට දැරිය හැකි ප්‍රමාණයට පමණි. එසේ නොමැතිව අසල්වැසියන් අනුකරණය කිරීමට යාමෙන් එවැනි පුද්ගලයකුට අවසන දී අත්වන්නේ ගවයෙක් තරමට පිම්බෙන්න උත්සාහ දැරූ මැඩියට අත් වූ ඉරණම පමණි.


ඒ නිසා තම මාසික වේතනය හෙ ආදායම පාලනයකින් තොරව අනවශ්‍ය ද සඳහා යෙදවුවොත් ඔහුට අඹු දරුවන් සමග මහ මගට බැසීමට සිදුවීමඅරුමයක් නොවේ. මෙවැනි අවාසනාවන්ත අවස්ථාවන්ට පත් වූවන්පිළිබඳව ඔබට ද අසන්නට, දකින්නට ලැබී ඇතැයි විශ්වාස කරමි. එසේ නම් අප ඒ තත්ත්වයට පත්වියයුතු ද? නැත. උතුම් සේවයකට දයක වී එවන් ත්ත්වයකට වෙසින් ලංවී සිටින්නන් පිළිබඳව යථාර්ථවාදීව සිතා බලන්න. ඔබේ පඩිපතින් මේ තාක් කලේ කුමක්ද? සිතන්න. බලන්න මෙපමණ කාලයක් ලබාගත් වැටුප් ලැයිස්තු දෙස. ඔබ කොපමණ මුදලක් උයා ඇත්ද? දැන් ඔබට ඉතිරිව ඇත්තේ මොනවාද? ඉපයූ මුදලින් ඔබ ලැබූ ප්‍රගතිය කෙරෙහි සෑහීමකට පත්විය හැකිද? සත්‍ය වශයෙන්ම සියයට අනූවකට (90%) වැඩි පිරිසක් සාර්ථකත්වය නොලැබූ ගොන්නට වැටේ. මෙය කාගේ වරදින් සිදුවූවක් ද?

එසේ නම් අවබෙධ කර ගනිමු අපට ලංවී සිටින්නන් පිළිබඳව. උත්සාහ දරන්න ලෞකික ආශාවන් පාලනයකර ගැනීමට. එයකල නොහැක්කක් නොවේ. සිතන්න. පිම්බෙන්න උත්සාහදැරූ අහිංසක මැඩියාට අත් වූ ඉරණම. බුද්ධිමත් මිනිසුන් වශයෙන් අප ඒ තත්ත්වයට පත්වියයුතු ද? නැත. එසේම අප ලබන පඩි වැඩදයක ලෙස යෙදවීමට අදිටන් කර ගනිමු


සැරයත් ප්‍රීති කුමාර කේජ්ආර්
(සෙ/13394) බුද්ධි අංශය -
6 ශ්‍රීලපාහ

# 11 ශ්‍රීලපාහ ඒකකයේ වසරක පිය සටහන්

ලංකා යුධ හමුදාවේ පුළුල් වීමත් සමග රෙජිමේන්තු මට්ටමින් නව ඒකක ආරම්භ කිරීමපසුගිය වසර දෙක තුල ඉතා සීඝ්‍රයෙන් සිදුවිය. එහ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා පාබලහමුද රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ ද නිත්‍ය හා ස්වේච්ඡා බළඇණි කීපයක් ස්ථාපනය කරන්නට යෙදින. ඒ අනුව 1996 වසර අවසාන භාගයේ මෙම ඒකකය ආධාරක බළඇණියක් ලෙසින් ආරම්භ කිරීමට ප්‍රථම නිළධාරී අණදෙන භට පිරිස් මේජර් ඩබ්ඩබ්එස්එල් ද්‍රානාන්දු, ආර්ඩබ්පී, ශ්‍රීලපාහ යටතේ ශ්‍රීලපාහ සියළුම නිත්‍ය ඒකකයන් වෙතින් සහභාගී වන ලද භට පිරිස් හි එකතුවක් ලෙසින් 1996.08.26 වනදින 1 ශ්‍රීලපාහ ඒකකය ස්ථානගතව සිටි වාවකච්චේරි කඳවුර වෙත ඒකරාශී වන ලදී.



*11 ශ්‍රීලපාහ ප්‍රථම සංවත්සරය වෙනුවෙන් පැවැති ක්‍රීඩා උත්සවයේ ඔලිම්පික් පහන දැල්වීමට දිවයන ක්‍රීඩකයින්*

පසුව මෙම ඒකකය 1996.09.15 වන දින 11 ශ්‍රීලාහ නව ආධාරක බළඇණිය ලෙසින් යාපනය අරියාලෙයි ප්‍රදේශයේදී යෙදුන සුභ මොහොතින් ස්ථාපනය කරන ලදී. එහි දී ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් ලුතිනන් කර්නල් එච්එම්එන්බී හේරත්, ශ්‍රීලපාහ විසින් ඒකකයේ අණදීම ආරම්භ කරනලදී. ඒකකයක් ලෙසින් ආරම්භකලා වුවද, නිලදරින්ගේ හිඟතාවය, සෙසු නිල හිඟතාවය මෙන්ම අනෙකුත් පාලනය උපකරණයන්හි ඇති හිඟතාවය මත යාපනයප්‍රදේශයේ රාජකාරි ඉටුකිරීමේදී බළඇණියට මහත් අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුවිය. කෙසේ වුවද, ඒකකය වෙත ඇතුලත් කරන ලද නිලධාරීන්ගේත්, ජ්‍යෙකොනොනින්ගේත්, අනෙකුත් සෙසු නිළයින්ගේත්, අපිරිමිත උත්සාහය , උනන්දුව, කැපවීම තුලින් අනෙකුත් ඒකකයන් මෙන්මයම් තරමක ස්ථාවරත්යකට ඒමට අප බළඇණියට හැකිවී ඇත.

ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ ලාබාලතම ඒකකය ලෙසින් එද ස්ථාපනය කරනු ලැබූ අප බළඇණිය 1997.09.15 දින වන විට වසරක් ගෙවී ප්‍රථම උපන් දින උත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් සැමරීමට ලැබීම මෙහිලා ඉතා සතුටින් සිහිපත් කළ හැකිය. ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී මාස 11ක කාලයක් ඒකකයේ අණදීම සිදූ කොට 1997.08.26 වන දින නව අණදෙන නිළධාරී වශයෙන් පත්ව ආ මේජර් එස්එම්ඩීඩබ්එස්කේ සෙනරත් ශ්‍රීලපාහ වෙත නැවත ඒකකයේ අණදීම භාරකරන ලදී. අනතුරුව ඒකකයේ ප්‍රථම බළඇණි සංවත්සරය පැවැත්වීම ඒකකයේ නව අණදෙන නිළධාරී තුමාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ප්‍රදේශයේ පවතින නොයෙකුත් අපහසුතාවයන් මධ්‍යයේ වුව ද ඉතා සාර්ථකව සිදු කිරීමට හැකිවිය. ඒ අනුව ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ගරුතර ස්වාමින් වහන්සේලාගේ සහභාගීත්වයෙන් බෝධි පූජාවක් පවත්වන ලදී. එමෙන්ම සියළුම නිළයින් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම හා බළඇණි දිනය වෙනුවෙන් ඉතා උසස් අන්දමින් ක්‍රීඩා උත්සවයක් පැවැත්වීමටත්, අපට හැකිවිය. මෙම ක්‍රීඩා උත්සවයේ ආරාධිත අමුත්තා වශයෙන් අප රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලදරියෙකු වන 511 බළසේනා මූලයේ බළසේනාධිපති වන බ්‍රිගේඩියර් පී එම් රොක්වුඩ් ආර්ඩබ්පී. පීඑස්පී. සහභාගීකරවා ගැනීමට හැකිවීම ද අප ලද භාග්‍යයක් කොට සලකමි. එමෙන්ම ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ අනෙකුත් ඒකකයන්හි අණදෙන නිළධාරී



**11 ශ්‍රීලපාහ ප්‍රථම සංවත්සරය වෙනුවෙන් පැවැති ක්‍රීඩා උත්සවයේ දී ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණි ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී 511 බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඑම් රොක්වුඩ් ආර්එස්පී, පීඑස්සී විසින් ජයග්‍රාහකයින් වෙත ත්‍යාග පිරිනැමීම**

වරුත් මෙන්ම වෙනත් ඒකකයන් වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද මෙම ක්‍රීඩා උත්සවය නැරඹීම සඳහා සහභාගීවිය. මෙහි දී විශේෂයෙන් සැලකිය යුතු කරුණක් වන්නේ ප්‍රදේශයේ වෙසෙන ද්‍රවිඩ සිවිල් ජනතාවගෙන් ද ඉතා හොඳ සහභාගීත්වයක් මේ සඳහා ලැබීමයි. ඒ අනුව මෙම ක්‍රීඩා උත්සවයේ තරඟ විනිසුරුවන් වශයෙන් ප්‍රදේශයේ සිටින ද්‍රවිඩ ක්‍රීඩා උපදේශකයින්, පාසැල් ශාරීරික අභ්‍යාස උපදේශකයින්ගේ සේවය ද අප වෙත ලබාදෙන ලදී. මෙම ක්‍රීඩා උත්සවයේ මෙන්මද ප්‍රථම බළඇණි දින සංවත්සරය ඉතා සාර්ථක කර ගැනීමට හැකි වූයේ ඒකකයේ නිලධාරීන්ගේත්, සෙසු නිළයින්ගේත් උනන්දුව, දක්ෂතාවය කැපවීම තුලින් බව මෙහි ලා ඉතා සතුටින් සඳහන් කළහැකිය.

තව ද ඒකකය වෙත පැවරී ඇති රාජකාරී ඉතා උසස් අන්දමින් ඉටු කර ඇති අතර, ඒකකයේත් රෙජිමේන්තුවේත්, සමස්ථ යුධ හමුදවේත් ගෞරවය ආරක්ෂා වන පරිදි ක්‍රියා කොට ඇත. සිවිල් ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ඒකකය විසින් විවිධ වැඩකටයුතු රාශියක් ඉටුකර දී ඇත. ඒ අනුව සතොස වෙළෙඳ සැලක්, පවත්වාගෙන යාම මගින් ඔවුන්ට අවශ්‍ය භාණ්ඩ පාලන මිළට ලබාදීමට කටයුතු සලසා දී ඇත. එමෙන්ම සිවිල් සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වාගෙන යමින්, එමගින් ඔවුන්ගේ එදිනෙද ජනජීවිතයේ දී පැන නැගී ඇති විවිධ ගැටළු නිරාකරණය කර ගැනීම සහාය වී ඇත. පාසැල් අළුත් වැඩියා කිරීම, මංමාවත් අළුත් වැඩියා කරදීම, පානීය ජලය සඳහා ළිං පිළිසකර කරදීම, පාසැල් දරුදැරියන්ගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාලයක් ආරම්භ කරදීමට ද කටයුතු කිරීම ආදිය ඉන් සමහරකි.

මෙම ඒකක බළප්‍රදේශය තුළ සීමිත ක්‍රියාන්විත මෙහෙයුම් රාශියක් ක්‍රියාත්මක කොට ඇත. එම ක්‍රියාන්විතයන් තුලින් සාර්ථක ප්‍රතිඵල නෙලා ගනිමින් ත්‍රස්තවාදී සැකකරුවන් විශාල පිරිසක් අත්අඩංගුවට ගැනීමටත්, ත්‍රස්ථවාදී අවි ආයුධ වෙඩි ද්‍රව්‍ය විශාල තොගයක් අත් අඩංගුවට ගැනීමටත් හැකි විය. 1996.11.23 දින සිදු කරන ලද ක්‍රියාන්විතයේදී ත්‍රස්තවාදීන් 04 දෙනෙකු මරා දමා පහත සඳහන් අවි ආයුධ අත් අඩංගුවට ගැනීමට හැකිවිය.

ටී 56 අවි - 02 යි
ටී 81 අවි - 01 යි
ටී 56 මැගසින් - 02 යි
ටී 81 මැගසින් - 06 යි
අත් බෝම්බ - 06 යි
පුවස් - 02 යි

1996.11.17 වන දින ප්‍රදේශයේ අප බළඇණියවිසින් කරනලද සීමිත ක්‍රියාන්විතයේ දී පහත සඳහන් වෙඩි ද්‍රව්‍ය ප්‍රමාණය සොයා ගන්නා ලදී.

කේ 400 අත් බෝම්බ - 849 යි
එම් 75 අත් බෝම්බ - 12 යි
ආර්පීජී බෝම්බ - 01 යි

රිවිරැස ක්‍රියාන්විතයට පෙර එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ ඊණියා ඊලාම් රාජ්‍යයේ අගනුවර ලෙස සලකන ලද යාපනය නගරයේ බටහිර ප්‍රදේශයේ සම්පූර්ණ ආරක්ෂාව අප බළඇණියට පැවරී ඇති අතර, නිළධාරීන්ගේ හා සෙසු නිළයින්ගේ දඩි කැපවීම මත යාපනය නගරය ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් වලින් මුක්ත කලාපයක් බවට පත් කර ගනීමට හැකිව ඇති බව බවසන්නේ ආඩම්බරයෙනි.

තවද, ඒකකයට වසරක් සපිරෙන මෙම කාලය වන විට ඒකකයේ එක් නිළධාරියෙක් සහ එක් සෙබළෙකු ත්‍රස්ථවාදී ප්‍රහාරයන් හමුවේ මියගොස්ඇත. බළලත් නිලධාරියෙකු සහ සාමාන්‍ය සෙබලුන් දෙදෙනකු තුවාල ලබා ඇත. එක් සෙබළෙකු ස්ථිර ආබාධිත තත්ත්වයට පත්වී ඇත. මේ මොහොතේ ද එම මියගිය වීරෝධාර රණවිරුවන් සහ තුවාල වූ සෙබලුන් ඉතා භක්ත්‍යාධරයෙන් යුතුව සිහිපත් කරමු.

වසරක් ගෙවී දෙවනවසරට පා තබා ඇති 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුද ඒකකය දිනෙන් දින ස්ථාවර බළඇණියක් ලෙසින් පියවර ඔසවමින් අනෙකුත් යුධ හමුද ඒකකයන් සමග ත්‍රස්තවාදී ක්‍රියා මඩලමින් ඉදිරියට යන අතර, හෙට දින ජාතියේත්, දේශයේත්, නිදහස සෙවරීභාවයට උරදෙන ඉතා උසස් පාබල ඒකකයක් ලෙස දෙවන වසර වෙත පා තබන්නේ ඉතා ආඩම්බරයෙනි.

**බුද්ධි අංශය 11 ශ්‍රීලපාහ**
**යුධ හමුද කඳවුර**
**අරියාලෙයි යාපනය**

# "ජය සිකුරු ජය මාවත කරා 6 ශ්‍රීලපාහ"



*"ජය සිකුරු" මෙහෙයුමේ ඉදිරි අඩියර පිළිබඳව නියෝග ලබා දෙමින්*

"එල්ටීටීඊ" සංවිධානයේ "ඊලාම් දේශයක් පිහිටුවීමේ නිරර්ථක උත්සාහය මත ඇති වූ වත්මන් යුද්ධය හේතුවෙන් වසර ගණනාවක සිට වව්නියාව සිට කිලිනොච්චිය දක්වා වූ ප්‍රදේශය ත්‍රස්තවාදීන්ගේ පරාදීසයක්ව තිබූ බව නොරහසකි. එබැවින් අනාදිමත් කාලයක සිට සිංහල ජනාවාසයක්ව පැවැති, පෞරානික වටිනාකමකින් යුතු වන්නි ප්‍රදේශය ක්‍රම ක්‍රමයෙන් දමිළයන් අතට පත් වූයේ නිරායාසයෙනි. වසර ගණනක සිට ත්‍රස්තවාදී ග්‍රහණයට නතුව තිබූ වව්නියාව - කිලිනොච්චිය ප්‍රධාන ගොඩබිම් මාර්ගය විවෘත කිරීමේ අරමුණ පෙරදැරිය 97/05/13 දින ක්‍රියාත්මක කළ "ජයසිකුරු" මෙහෙයුම ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල බලකොටු බිඳලමින් සාර්ථකව ඉදිරියට ඇදෙමින් පවතී. මාස 06 ක කාලයක් ඉක්මවා ක්‍රියාත්මක "ජයසිකුරු" මගින් මුදගත් සංග්‍රාමික අතීත් වාසි සහගත ප්‍රදේශය අතර පෞරාණික වටිනාකමින් යුතු බෞද්ධ සිද්ධස්ථාන විශාල ප්‍රමාණයක් ද වේ. මේ අතර කාලිංග දේශයේ "සුහසීව" රජුගේ බැණනුවන් වූ "දන්ත කුමරු" හා "හේමමාලා" කුමරිය විසින් "දන්ත ධාතූන් වහන්සේ" වැඩමවාගෙන අනුරාධපුරයට ගිය මාර්ගය ද වේ. අවි, වැසි හා කලට වේලාවට ආහාර මෙන්ම සුබවිහරණය ද නොතකා සෙබළුන්ගේ දැඩි කැපවීමෙන් මේ ලත් ජයග්‍රහණය නොවන්නට සිංහල ද ජාතිය දමිළයන්ගේ ග්‍රහනයට නතු වී හමාරය.

"ජයසිකුරු" මෙහෙයුමේ තවත් වේගවත් පියවරක් ඉදිරියට තබමින් ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන සැපයුම් මාර්ගය වූ මාන්කුලම් - මුලතිව් ප්‍රධාන මාර්ගය අත්පත් කර ගැනීමට සැලසුම්කර තිබූ අතර, මෙම ක්‍රියාන්විතයේ ප්‍රහාරක බළඇණියක් වශයෙන් 6 වන ශ්‍රී ලංකා පාබල හමුදව නම්කර තිබිණි. මේ සඳහා බළඇණිය ලහි ලහියේ සූදනම් වූ අතර, 97/09/30 දින ඒකක අණනෙ නිලධාරි ලූතිතන් කර්නල් ඩියූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ විසින් පැහැදිලි නියෝග ලබා දුනි.

මේ අනුව මුලතිව් - මාන්කුලම් ප්‍රධාන මාර්ගය අත්පත් කර ගැනීමේ අරමුණින් ආරක්‍ෂක හමුදවෝ 97/1001 දින ඉදිරියට ඇදුනහ. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ත්‍රස්තවාදීන්ගේ සැපයුම් අඩපන කර



*"ජය සිකුරු" මගින් මුලතිව් - මාන්කුලම් මාර්ගය මුද ගැනීමෙන් පසු ඒකකය වෙත පැමිණි ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති - 2 අනි සමග*




*"ජය සිකුරු" මෙහෙයුමේදී 6 ශ්‍රීලපාහ වෙතින් අත් අඩංගුවට ගත් අවි ආයුධ*

නිරණාත්මක ලෙස උදෑසන 0700 පැයට පමණ, ත්‍රස්තවාදීන්ගේ වෙඩි වරුසා මැද මුලතිව් - මාන්කුලම ප්‍රධාන මාර්ගය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදගත් අතර, මේ වන විට 2 වන කොමාන්ඩෝ රෙජිමේන්තුව හා 5 විජාරෙ විසින් පරණ නුවර පාරද, 2 වන විශේෂ බලකාය හා 551, 533 බලසේන විසින් මාන්කුලම් මුලතිව් මාර්ගයේ නැගෙනහිරින් පිහිටි මානවලන්පඩ්ඩමුරිප්පු ප්‍රදේශය ද රූපසටහන "අ" හි සිතියමෙහි දැක්වෙන පරිදි අත්පත් කරගත්හ. මෙහි දී ත්‍රස්තවාදීන්ට විශාල වශයෙන් හානි සිදුවූ අතර, ඔවුන් පසු බැසීමට වූහ.

වසර ගණනාවක් තිස්සේ ත්‍රස්තවාදී ග්‍රහණයට ලක්ව තිබූ මාන්කුලම් - මුලතිව් මාර්ගය ත්‍රස්තවාදීන් කොටුකර ගැනීමයි. මෙම ක්‍රියාත්විතය සඳහා 55 සේනාංකයේ 551, 552 සහ 553 යන බලසේනාත්, 53 සේනාංකය යටතේ 552 බලසේනාවට අනුයුක්තව සිටි අතර, 1 වන කොමාන්ඩෝ රෙජිමේන්තුව පෙරටු කරගෙන රූපසටහන "ඇ" හි දැක්වෙන පරිදි ගමන් ඇරඹූහ.

අළුයම ගමන් ඇරඹූ 6 වන පාබල හමුදවේ, 1 වන කොමාන්ඩෝ රෙජිමේන්තුව පිටුපසින් පිළිවෙලින් "ඒ", "බී" හා "ඩී" කණ්ඩායම් වශයෙන් ගමන් ගත්හ. කටු පඳුරු වලින් ගහන එකිනෙකා නොපෙනෙන ඝණ වනාන්තරය තුලින් ගමන් කිරීම අති දුෂ්කර වුවද, එදින 1500 පැය පමණ වන විට කි.මි. 08 ක පමණ දුර ගෙවා එදින ඉලක්කය වූ එක්රැස් වන ස්ථානය (Assembly Area) වෙත ළඟාවීමට හට පිරිස් සමත් වූහ. පසුදින හිමිදිරියේ ක්‍රියාත්මක කිරීමට ඇති ක්‍රියාත්විතය සඳහා ගමන් කිරීමට ප්‍රථම රාත්‍රි ලැගුම් ගැනීමට (Habour) සිදුවූයේ සුපරීක්ෂාකාරීත්වය හා විමසිල්ල පෙරැරි කරගෙනය. මෙයට හේතුව වූයේ යම් හෙයකින් අප මෙහි පැමිණි බව ත්‍රස්තවාදීන්ට දැන ගැනීමට ලැබුණේ නම් පසුදින ක්‍රියාත්මක කිරීමට නියමිත මෙහෙයුමට යම් ලෙසකින් හෙ බාධා ඇතිවිය හැක නිසා ය. ප්‍රදේශය පුරාම ගිලගත් කැලි කැපිය හැකි ඝණ අඳුරින් වෙලාගෙන තිබූ අතර, එකිනෙකා නොපෙනෙන තරම් ඝණව වඩ ඇති කැලෑව නිසා ප්‍රදේශයම මූසලත්වයෙන් වෙලී ගොස් තිබිණි. නිහැඬියාව හා ඝණඳුර දුරලමින් හිරුකිරණ වැටෙන මොහොත තෙක් සෙබළුන් යුහුසුළුව බලා සිටියේ මාන්කුලම් - මුලතිව් ප්‍රධාන මාර්ගය තව කොයි මොහොතේ හෝ අප අතට පත්වන බව හොඳකාරව දන්නා නිසාය.

ඝණඳුර බිඳලමින් ක්‍රමයෙන් හිමිදිරිය උදාවී හිරුඑළි වැටෙමින් පැවතුණි. 1 වන කොමාන්ඩෝ රෙජිමේන්තුව පෙරටු කරගත් 6 වන බාල හමුදව ක්‍රියාත්විතයේ ඉදිරි අධියර ක්‍රියාත්මක කිරීම සඳහා උපක්‍රමශීලීව හැඩගැසීම සිදුකල යුතු හෙයින් ප්‍රහාරක කණ්ඩායම් වශයෙන් මෙම බලඇණි "ඩී", "ඒ" සහ "බී" කණ්ඩායම් වශයෙන් පෙල ගැසුණහ. ඉන්පසු




Ref: Map Sheet 1:5000
Mankulam Map

**MAP KEY**
Objectives
Advance Route of 6 SLLI & ICR

අත්පත් කර ගැනීම ආරක්‍ෂක හමුදවෝ ලත් විශාල ජයගහණයක් විය. කෙසේ වෙතත් මෙම ජයග්‍රහණය භුක්ති විඳීමට ඉඩ නොදීමට ත්‍රස්තයෝ කිහිප වතාවක්ම උත්සාහ දැරිය. අධිෂ්ඨානය බිඳකුදු අඩු නොවූ සෙබළුන් ඉදිරියේ එල්ල වන ඕනෑම ත්‍රස්තවාදී ප්‍රහාරයකට අභීතව මුහුණදී මූලතිව් - මාන්කුලම් මාර්ගයේ ආධිපත්‍යය රැකගත්හ. සෑම උත්සාහයක්ම සඵල නොවූ ත්‍රස්තවාදීන් තුවූ හැලීගිය පක්‍ෂීන් ලෙස පලා ගියේ ය. පලායන ත්‍රස්තයන්ට පන්න පන්නා පහරදීමට සෙබළුන් දිරිමත් වූහ. මේ අනපේක්‍ෂිත සිදුවීම හමුවේ වියරු වැටුන ත්‍රස්තයෝ හිස් ලූලූ අත දුවමින් නොයෙක් නොයෙක් දේ සිදු කිරීමට යුහුසුළු වූහ. ක්‍රම ක්‍රමයෙන් දින සති ගෙවී ගියේ ය. ආරක්‍ෂක හමුදවෝ ක්‍රමයෙන් බලය තහවුරු කර ගත්හ.

අල්ලාගත් ප්‍රදේශයේ බලය තහවුරු කර ගත් 6 ශ්‍රීලපාහ හට පිරිස් දැනට මාන්කුලම් - මූලතිව් මාර්ගයේ ඉදිරි ආරක්‍ෂක වලල්ලේ රාජකාරි කරමින් රූප සටහන "ආ" හි දක්වෙන පරිදි 6 වන පාබල හමුදවේ කණ්ඩායම් ස්ථානගතව සිටී. ඉදිරියේ දී එල්ල වන ඕනෑම ත්‍රස්තවාදී ප්‍රහාරයකට මුහුණ දීමට සූදානම්ව මූලතිව් සිට මාන්කුලම් දක්වා දිවෙන මාර්ගයේ ඇති ඉදිරි ආරක්‍ෂක වලල්ලේ ද පරණ නුවර පාර හරහා වැටී ඇති ආරක්‍ෂක වලල්ලේ රාජකාරි ද දැනට 6 වන ශ්‍රී ලංකා පාබල හමුදා හට පිරිස් අතින් සිදුවේ.

යුද්ධය යනු ජය හා පරාජය යන දෙකම සම සමව පවතින්නකි. පිරිස් බලය හා මහජන විශ්වාසය ද බිඳීගොස් ඇති ත්‍රස්තවාදීන් දැන් විශාල පසුබෑමකට ලක්වී ඇත. එහෙයින් මෙම පාපතරයන් පරාජය කර පලවා හැර නුදුරේදීම වව්නියාව සිට කිලිනොච්චිය තෙක් මාර්ගයේ ආරක්‍ෂක හමුද ආධිපත්‍ය පතුරුවාලීමට හැකිවනු ඒකාන්තය. වව්නියාව සිට කිලිනොච්චිය දක්වා වූ මාර්ගයේ සිංහ ධජය ලෙලදෙන මොහොත උදවන තෙක් 6 වන ශ්‍රී ලංකා පාබල හමුදවේ ආධුනික සෙබළාගේ සිට අණදෙන නිලධාරී දක්වා ජීවිත පරිත්‍යාගයෙන් හා ආත්ම විශ්වාසයෙන් යුතුව රාජකාරි කරමින් පසුවන අතර, නුදුරේදීම එම කටයුත්තට දයක වී පාබල හමුද නාමය රන් අකුරින් ලියවීම සඳහා අප බැඳී සිටී. ඉදිරියෙන් ඉදිරියට ප්‍රහාරාත්මකභාවය ආරක්‍ෂක තත්ත්වයේ බලයයි යන මූලධර්මය පෙරදැරි කරගෙන 6 වන බළඇණි සෙබළ දරුවෝ රට රැකීමට දයකවී සිටිති.

6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව එඩිතර සිංහයින් සේ සිංහල ජාතිය, ආගම සුරැකීම සඳහා "ජයසිකුරු" ක්‍රියාන්විතයේ ජය මාවත කරා ඉදිරියෙන් පෙලගැසී සිටින බව පවසනුයේ ඉතා ආඩම්බරයෙනි.

**ලුතිතන් කේඒ පුෂ්ප කුමාර ශ්‍රීලපාහ**
**නි/62440**
**බුද්ධි නිලධාරී - 6 ශ්‍රීලපාහ**

---

**නි/63076 ලුතිතන් ජේ ජේඑයිපී ජයකොඩි, ශ්‍රීලපාහ (මියගිය)**



"සොහොයුර"

ශ්‍රී ලංකා මාතාවගේ ස්වෛරීභාවය පරමාධිපත්‍යය හා ඒකීය භාවය උදෙසා ඔබගේ අමිල ජීවිතය 1996.08.25 දින පුදකලහ.

ශ්‍රී ලංකා ද්වීපයේ ඒකීයභාවය ස්වාධිත්‍යය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම සඳහා 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව සහ යාපනය තෙන්නමරච්චි නුනාවිල් ප්‍රදේශයේ ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටිය දී මියගියහ. 1997.08.25 දිනට දිවිය පුද වසරකි.

"මව්බිමේනාමයෙන් දිවිපිදූ සොහොයුර ඔබට නිවන් සුව"



**ලුතිතන් ජේජ්එයිපී ජයකොඩි, ශ්‍රීලපාහ දේහය තැන්පත්කල ස්ථානයට කපිතන් (උපා) ආර්ලියනගේ, ශ්‍රීලපාහ විසින් මල්කලඹක් තබන අවස්ථාව**

සැකසුම කෝප්‍රල් බත්ජනාවත්ත කේජ්සීජ් - 1 ශ්‍රීලපාහ



1997-10-10 වන දින යුධ හමුද දිනය වෙනුවෙන් ළමා නිවාසය අලුත්වැඩියා කරන අයුරු.



48 වන යුධ හමුද දිනය වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී මේජර් WWSL ප්‍රනාන්දු Rsp ශ්‍රීලපාහ විසින් පැලයක් සිටුවන අවස්ථාව.

97-11-22 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ආබාධිත සෙබලුන් වෙනුවෙන් දිවා ආහාරයක් සූදනම් කර තිබුණු අවස්ථාවේදී රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ විසින් මංගල හස්තියා වෙත පළතුරු ලබාදෙන අවස්ථාව.





97-11-20 වන දින රෙජිමේන්තු අධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවට ගිය අවස්ථාවේ රෙජි ආබ ආබාධිත රණවිරු ක්‍රීඩකයන්ගේ පදක්කම් හා සහතික පත් රෙජි අධිපති විසින් පරීක්ෂා කරන අයුරු.



ආධුනික පුහුණු පාඨමාලා අංක 30 විසිරයාමේ පෙලපාලියට පැමිණි ප්‍රධාන අමුත්තා වන බ්‍රිගේඩියර් එම් ජේ අල්විස් KSV විසින් පෙලපාලිය පරීක්ෂා කරන අයුරු.



පදක්කම් හා වර්ණ හිමි ආබාධිත ශ්‍රීලපාහ රණවිරු ක්‍රීඩකයන්
හා ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගන්නා ලද සමූහ ජයාරූපයයි.




97 අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා උළෙලේ නියෝජනය කළ
ශ්‍රීලපාහ ආබාධිත රණවිරු ක්‍රීඩකයන් ඔවුන් දිනාගන්නා ලද කුසලානද සමග.